# බෞද්ධාලෝකය

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 බිනර - වප් 2021 සැප්තැම්බර් - ඔක්තෝබර්


## ලිපි සරණිය


| | |
|---|---|
| ⋆ ධම්ම පදය - ජීවිතයට සම්බන්ධ කර ගනිමු | - සිංහල සම්පාදක - පණ්ඩිත රන්ජිත් වනරත්න<br>පරිවර්තනය - මහාචාර්ය ශිරෝමි සමරසිංහ |
| ⋆ නැඳුන්ගමුව ඇත්රාජා | - වෛද්‍ය රාණි ප්‍රනාන්දු |
| ⋆ Progressing through Appamada | - Das Miriyagalla |
| ⋆ ථෙරවාදී ත්‍රිපිටකයේ ශ්‍රී ලාංකේය උරුමය | - මාලනී ඇඳගම - සාහිත්‍ය සූරි සම්මානිත මහාචාර්ය |
| ⋆ බහු භණ්ඩික තෙරුන් හා විලිබිය නැති මොණරා | - රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති දිසානායක හේරත් |
| ⋆ ඇසළ සඳයි දම් සිසිළයි | - මල්ලිකා දිසානායක |
| ⋆ ජාතික සමාජ සේවා මණ්ඩලයේ මෙහෙවර | - |
| ⋆ ජාතිය අවදි කල අනගාරික ධර්මපාලතුමා | - ශාස්ත්‍රපති ලොකුබණ්ඩාර මුණසිංහ |
| ⋆ අනිච්ඡාවත සංඛාරා | - පූජ්‍ය මීදෙණියේ ධම්මවංශ හිමි |
| ⋆ පරිසරය හා මානවයා | - ශාස්ත්‍රවේදී චන්ද්‍රසිරි වැලිගමගේ |
| ⋆ රසවත් වූ වැකිය සාධුත්වය පිළිබඳ අනුශාසනාවකි | - ආචාර්ය රංජිත සේනානයක |



**කළමණාකරන උපදේශක මණ්ඩලය**
මහාචාර්ය මාලිනි ඇඳගම
මහාචාර්ය සුසිරිපාල මාලිම්බොඩ
මහාචාර්ය මාලිංග අමරසිංහ

**සංස්කරණ කලමනාකරණ**
වෛද්‍ය රාණි ප්‍රනානදු

**ප්‍රකාශනය**
ප්‍රචාරක කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**මුද්‍රණය**
රජයේ මුද්‍රණාලය

**සංස්කරණ උපදේශක**
ආචර්ය ප්‍රණීත් අභයසුන්දර

**සංස්කාරක මණ්ඩලය**
චන්ද්‍රසිරි වැලිගමගේ
ශ්‍යාමි නුවන් ගනේවත්ත
ආචාර්ය අශෝක් කරුණාරත්න
නාලක ජයසේන
ඉෂාන් එදිරිසූරිය

**කවර නිර්මාණය සහ ඡායාරූප**
දුෂාන්ති කුමාරි



**සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය**
380, බෞද්ධාලෝක මාවත, කොළඹ - 07
දුරකථන : 011-2691695 / 011-2688517
ෆැක්ස් : 011 - 2688517 web : www.acbc.lk
විද්‍යුත් ලිපිනය : acbc380@gmail.com
buddhistinfo380@gmail.com

# ධම්ම පදය
## ජීවිතයට සම්බන්ධ කර ගනිමු

## මැරෙන බව නො දන්නෝ කලහ කරති

**06. පරෙ ච න විජානන්තී
මයමෙත්ථ යමාමසෙ
යෙච තත්ථ විජානන්ති
තතො සම්මන්ති මෙධගා**

මේ සඟ මැද, (නුවණැතියන් හැර, අන් කලහකරුවෝ, අපි, මරුමුවට යම්හයි, නොදනිති. ඒ කලහකරුවන් අතුරෙහි, යම් නුවණැති ජන කෙනෙක් වනාහි, (අපි මරුමුවට යම්හයි, දනිද්ද, ඒ හේතුවෙන්, කලහයො, සන්සිඳෙන්නාහ.

1-5 කොසඹෑ නුවර ඝොෂිත සිටාණන් කරවූ විහාරය ඝොෂිතාරාම නමින් ප්‍රසිද්ධ විය. එහි බුදුන් දවස විනයධර - ධර්ම කථික තෙරුන්ගේ නො සැලකීම නිසා වැසිකිළියේ දී අතපය සෝදා ඉතුරු දිය ටික එම භාජනෙහිම තබා ආවේය. පසුව එහි ගිය විනයධර තෙරුන් වහන්සේ භාජනෙහි තිබූ දිය ටික දැක, ඇවැත්නි! ඔබ ප්‍රයෝජනයට ගෙන ඉතිරි වූ දියත්ත බඳුනෙහිම තබා ආවෙහි දැයි ඇසූහ.

එසේ යයි පිළිතුරු දිනි. මෙය ඇවැත් සිදුවන වරදකි. එහෙත්, තොප නොදැන කළ නිසා ඇවැත් නැතැයි ද කීය. ඒ පුවත දෙපිරිස අතර පැතිරී කලහයක් පැන නැංගේය. එය ක්‍රමයෙන් දායකයන්ගේ සිට චාතුර්මහාරාජික දිව්‍ය ලෝකය දක්වා පැතිරී ගියේය.

මේ බව දැනගත් බුදුරජාණන් වහන්සේ සමඟි වන ලෙස දෙවරක්ම අවවාද කොට එය නොපිළිගත් කල්හි භික්ෂු සමූහයා අත්හැර වඩනා සේක්, බාලකලොණකාරාමයෙහි දී භගු තෙරුණ්ට හා ප්‍රාචීනවංශ මිගදායෙහි තෙ කුලපුතුන්ට සමඟියෙහි අනුසස් දේශනා කොට, පාරිලෙය්‍යය වනය බලා වැඩි සේක. එහිදී පාරිලෙය්‍යය නම් ඇතා බුදුරජාණන් වහන්සේට උපස්ථාන කෙළේය. වස් තෙමස තුළම ඇතා උපස්ථාන කෙළේය. බුදුන් වහන්සේ නුදුරුගම ඇසුරුකොට දන් වැළඳූහ.

වාද භේද හින්න වූ භිෂුන් වහන්සේට කොසඹෑ නුවර දායකයෝ නොසැලකූහ. දන් නොදුන්හ. බුදුන් වහන්සේ සමාකර ගන්නා ලෙස නියම කළහ. එවිට වස් පවාරණය කළ භික්ෂූහු ආනන්ද ස්ථවිරයන් වහන්සේ හමුව සියලු තොරතුරු දන්වා උන්වහන්සේ කැටුව බුදුන් දක්නා පිණිස පාරිලෙය්‍යක වනය බලා පිටත් වූහ. බුදුරජාණන් වහන්සේට උපස්ථාන කරමින් සිටින ඇත් තෙමේ ඈත එන අනඳ තෙරුන් දැක දණ්ඩක් ගෙන ලුහුබඳින්නට විය. එවිට බුදුරජාණන් වහන්සේ අනඳ හිමියන් හඳුන්වා දී සුවදුක් විචාරා පසුව කොසඹෑ නුවර වැඩි සේක. එහිදී භික්ෂූන් අමතා, මහණෙනි! තොප කළේ බරපතළ වරදෙකි. මගේ ශාසනයෙහි පැවිදිව, මා කියන විටත් සමඟි නොවී කලහ කිරීම වරදකැයි වදාරා සමඟියෙහි අනුසස් වදාළ සේක.

සම්පාදක - **පණ්ඩිත රන්ජිත් වනරත්න (බී.ඒ.)**
ධම්මපද වනරත්න ව්‍යාඛ්‍යා පොත ඇසුරිනි

**06. Pare ca na vijänanti,
mayam ettha yamämase!
ye ca tattha vijänanti,
tato sammanti medhagä.**

There are those who do not realize that one day we all must die, but those who realize this settle their quarrels.

1.5 The Viharaya in the city of Kosamba, donated by the wealthy disciple Goshitha was known as Goshitharamaya. There, during the time of the Buddha, the vinayadara dhamma kathika bhikku having used the water in the toilet to wash his hands and feet, left it in the vessel due to his negligence. The vinayadara bhikku noticing it later, questioned the other monks and blamed them for doing so.

This led to a dispute between two groups of monks resulting in a quarrel which gradually spread from the lay donors to the higher realms of Chathurmaharajika divya loka. Buddha having got to know of this advised the monks twice, to settle their disagreement. However, the monks did not heed the Buddha's advice and continued to quarrel.

Then the Buddha left them and proceeded to Paarileyya forest after giving a discourse of the virtues of unity and harmony to Bagha thero at the Balakalonakaramaya and to a noble disciple at the Pracheena Migadaya. The Paarileyya tusker attended on the Buddha at the Paarileyya forest during the Vas period of three months. Buddha's alms were provided by the people of the neighbouring village.

The Bhikkus who were quarrelling were not taken care of by the residents of Kosamba City. The Bikkus explained the situation to Ananda Thero and together they went to the Paarileyya forest.

The Paarileyya tusker carrying a stick, charged at the approaching Ananda Thero. The Buddha then greeted Ananda thero and having enquired into his wellbeing, set off to Kosamba City.

There he addressed the Bhikkus and said that, having ordained in the Buddha sasana they did a serious wrong by not heeding the Buddha's advice. He then gave a discourse on the virtues of unity and harmony.

**Translated by Prof. Siromi Samarasinghe**

# මහා සංඝරත්නය සෙත් පිරිත් දේශනා කර ඇත් රජුට ආශීර්වාද කරති



**නැඳුන්ගමුව රාජා දළදා පෙරහැරට සහභාගීවීමට මහනුවරට යන්නේ පා ගමනිනි.**









නැඳුන්ගමුව රාජා 1953 වර්ෂයේ උපත ලැබුවේ ඉන්දියාවේ මයිසූර් ප්‍රාන්තයේදීය. මයිසූර් ප්‍රාන්තයේ මහරාජාවරයෙක් විසින් තම පවුලේ නෑදෑයෙකුගේ නිදන්ගත රෝගයක් සුවකළ සුප්‍රසිද්ධ නිලම්මහර වෙද හාමුදුරුවන්ට පුද පඬුරු ලෙස පූජා කළ මෙම ඇතා, 1978 දී වත්මන් හිමිකරුවන හර්ෂ ධර්මවිජය වෙදමහතාගේ පියාණන්වන නැඳුන්ගමුවේ සුප්‍රසිද්ධ ධර්මවිජය වෙද රාලහාමි විසින් මිලදී ගන්නා ලදි. එතැන් සිට මෙම ඇත් රාජාගේ භාරකරු ලෙස ආදරයෙන් රැකබලා ගන්නා ලද්දේ වත්මන් භාරකරු වන, කවුරුත් ආදරයට 'කළුමාමා' ලෙස අමතන විල්සන් කොඩිවක්කු මහතා විසිනි.

2005 වසරේ සිටම මහනුවර අසිරිමත් දළදා පෙරහැරේ කරඬුව වැඩමවීමේ වාසනාව නැඳුන්ගමුව රාජාට හිමි වී ඇත.

**ඇත්රජුගේ භාරකරු කළුමාමා**



# PROGRESSING THROUGH APPAMADA

By Das Miriyagalla

## Terminology

Tathagata Gauthama Buddha's final words at the time of passing away or Parinibbana were **"Vaya Dhamma Sankhara Appamadena Sampadetha"**. According to two eminent scholars Ven. Nyanatiloka, author of Buddhist dictionary and Ven. Narada, the translator of Dhammapada, the interpretation of the above Pali saying is “All things whatever in the world are perishing . Strive to maintain ever-present mindfulness in doing good”. Ven. Narada however adds that it is difficult to give an exact rendering of the term Appamada in English. Hence we should find an interpretation which can be considered as accurate as possible in English.

Strive is to endeavor earnestly with great effort. ‘All things' include all human beings, other living beings, natural and man-made things. Hence the Buddha's final message to everybody is “ to maintain mindfulness at all times with good thoughts, words and actions while refraining from bad thoughts, words and actions”. Here it is necessary to clarify what is good or wholesome and what is bad or unwholesome. Unwholesome roots are greed, hatred and delusion. Therefore wholesome thoughts, words and actions do not involve greed, hatred and delusion.

## Delusion or Ignorance

It is also necessary to clarify the term ‘delusion' which is also referred to as ‘ignorance' or

‘Mohaya' or ‘Avijja'. In simpler terms delusion is ignorance of our true nature of existence. Each one of us believes in a “myself” which is really a misguided belief. Our physical body, feelings, perceptions, mental formations and consciousness forming five parts of what we call “ myself” are seen by us as permanent even though they are impermanent, seen by us as belonging to us even though they do not belong to us , seen by us as pleasant even though they are painful and seen by us as pure and beautiful even though they are ugly and impure.

## Appamada is the path to Nibbana

The phrase **‘Appamado Amata Padam'** which is from Dhammapada has been given the highest recognition by the founders of Ananda College in making it the college motto or guiding principle. ‘Amata'is ‘Nibbana' and ‘Padam' means ‘foot-steps'. In short the translation is “ Appamada is the path to Nibbana”

## Need of the Hour

The most precious and valuable asset that we have with us is TIME. Since the time available to us is gradually getting shortened its value keeps increasing. Our priorities have to be identified and action has to be expedited to utilize the available time in the most advantageous manner. We see that the world is full of unsatisfactory situations and innumerable problems. There is also the uncertainty of what happens to us in the next life. Hence there is a need to **get rid of this Samsaric journey as our main priority**. A strong determination and faith in the doctrine of the Buddha are needed. The doctrine is called Dhamma or the Truth.

But it is covered by delusion or ignorance which is a form of darkness. In order to get rid of the darkness we have to understand the true nature of our existence.

## Mental Development

Even though we are extremely fortunate in being born into a Buddhist environment, we do not seem to have given sufficient attention to the practicing of the doctrine. To achieve a proper grasping and understanding of the doctrine it is necessary to absorb the understanding in three stages. First stage is to understand by reading or listening called Sutamaya Nyana. The second stage is by contemplating over what is read referred to as Chintamaya Nyana and the third stage is by meditating referred to as Bhavanamaya Nyana. **Hence meditation is essential. It is also called Bhavana which in simple terms is mental development.**

In trying to get rid of the belief in a ‘personality or self' we should make a serious attempt to realize that there are four misconceptions referred to above. The attachments to the world and the resulting phenomenon called clinging are due to the personality belief which in reality is a mis-belief. Reference has already been made to the three **unwholesome roots greed, hatred and delusion.** Here it is worth noting that it is delusion which causes the other two unwholesome roots greed and hatred. Mental development or Bhavana helps us to realize our true nature and get rid of the delusion, greed and hatred. It is therefore the practicing of the doctrine which has to receive priority.

*With blessings of the Noble Triple Gem !*

***(Based on Dhamma Discussions conducted by Senior Old Anandians)***



# ශ්‍රී ලංකාවේ ඉතිහාස වංස කථාවෙන් හෙළි කෙරෙන ථෙරවාදී ත්‍රිපිටකයේ ශ්‍රී ලාංකේය උරුමය


**මාලනී ඇඳගම** - සාහිත්‍ය සූරී සම්මානිත මහාචාර්ය


## 01. ථෙරවාදී ත්‍රිපිටකය යනු කුමක්ද?

තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් හෙවත් සමස්ත බුදු දහම ඇතුළත් කෘතිය ත්‍රිපිටකය ලෙස හැඳින්වේ. බුදුරජාණන් වහන්සේ විසින් විවිධ අවස්ථාවල, විවිධ ස්ථානවලදී, විවිධ විෂයන් මුල්කොටගෙන දේශනා කළ ධර්මය උන්වහන්සේගේ අනුගාමිකයන් විසින් පසුකාලීන සංගායනාවලදී විනය, සූත්‍ර, අභිධර්ම ලෙස කොටස් තුනකට වර්ග කරන ලදී. මෙම කොටස් තුන එක්වගෙන ත්‍රිපිටකය ලෙස හඳුන්වනු ලැබේ. ඒ අනුව ත්‍රිපිටකය ග්‍රන්ථ 31 කින් යුක්ත වේ. එනම්,

විනය පිටකය ග්‍රන්ථ 05 යි

සූත්‍ර පිටකය ග්‍රන්ථ 19 යි

අභිධර්ම පිටකය ග්‍රන්ථ 07යි වශයෙනි.

වර්තමානයේ අප සතුව ඇති පුස්කොළවල ලියන ලද ත්‍රිපිටකය පොත් 56 කින් යුක්ත වන අතර, 1954 දී ආරම්භකොට දිගු කලක් තිස්සේ සංස්කරණය කොට කඩදාසිවල මුද්‍රණය කළ ත්‍රිපිටකය පොත් 52 කින් යුක්ත වේ. එකී පුස්කොළ පොත් සමූහයේ එක පිටපතක් දළදා මාලිගාවේ ප්‍රාචීන පුස්තකාලයේ ඇති අතර, 1954 සිට 1989 දක්වා සිංහල භාෂාවට පරිවර්තනය කොට වරින්වර මුද්‍රණය කළ පොත් 52 දිවයින පුරා බොහොමයක් විහාරස්ථානවල ඇත. ඉතා ස්වල්ප කොටසක් හැරුණු කොට බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සුවාසූදහසක් ධර්මස්කන්ධය ලෙස සැලකෙන ධර්මයේ ඇති බහුතර කොටස් උන්වහන්සේ ජීවමාන සිටි කාලයේ ලියා තැබීමක් සිදු නොකෙරිණි. එහෙත්, උන්වහන්සේගේ ධර්මය ශ්‍රවණය කළ සියලුම භික්ෂුන් වහන්සේ ඒවා කටපාඩම් කරගත් අතර, විශේෂයෙන් එකී ධර්මය ආරක්ෂා කොට පවත්වා ගැනීමේ කාර්යභාරය ‘ධර්ම භාණ්ඩාගාරික’ යන ගෞරව නාමයෙන් හැඳින්වූ ආනන්ද මහා තෙරණුවන්

විසින් ඉටුකරන ලදි.

ඒ අනුව බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළ ස්ථාන, ඒවා සිදු කළ කාලවකවානු, දේශනා කරනු ලැබුවේ කාට ද සහ දේශනා කළ ධර්මය ස්මරණයෙන් යළි ඉදිරිපත් කිරීමේ හැකියාව ආනන්ද මහතෙරුන් වහන්සේ සතුව තිබිණි. පසු කාලීනව සංගායනා මඟින් විධිමත් කොට ස්මරණයෙන් පවත්වා ගනිමින් තිබියදී මිහිඳු මහරහතන් වහන්සේ මඟින් ශ්‍රී ලංකාවට දායාද කළා වූ ද, අනතුරුව ශ්‍රී ලංකාවෙන් වෙනත් රටවලට ලබා දුන්නා වූ ද බුද්ධ දේශනා සියල්ල එක්ව ගත් කල ත්‍රිපිටකය ලෙස හැඳින්වේ.

**ii. ඉන්දියානු පසුබිම - බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑම සහ පළමුවෙනි ධර්ම සංගායනාව**

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට හෙවත් අරහත් තත්ත්වයට පත්වීමෙන් පසුව වසර 45ක් සමස්ත ලෝකවාසී සියලු සත්ත්වයන් වෙනුවෙන් ඉටුකළ යුතු සියලු වගකීම් ඉටුකිරීමෙන් පසුව වෙසක් මාසයේ පුන් පොහෝ දින පිරිනිවන් පෑ සේක.


මහතෙරවරුන් 7000 ක් පමණ සංඛ්‍යාවක් ඇතුළත්ව අප්‍රමාණ භික්ෂූන් වහන්සේ පිරිසක් සමඟ ක්ෂත්‍රීය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ක්ෂුද්‍ර, දේව යන සියලු පිරිස්වල සහභාගිත්වය ඇතිව බුදුන් වහන්සේගේ අග්‍රශ්‍රාවක මහා කාශ්‍යප තෙරණුවන්ගේ ප්‍රධානත්වයෙන් අවසන් කටයුතු සිදු කෙරිණි. එසේ වුවද දින 07 ක් වැනි කෙටි කාලයක් තුළ බුදුන් වහන්සේගේ දේශනාවලට අභියෝග එල්ලවීමට හැකි හේතුවක් මතුවිය. එනම්, මහලු වී පැවිදි බවට පත්වූ බැවින් බුදු වූ බුදුන් වහන්සේගේ දේශනා පිළිබඳ යථාවබෝධයක් නොතිබූ (වෘද්ධ පබ්බජිත) සුබද්ද හිමි විසින් වෙනත් භික්ෂූන් නොමඟ යාමට ඉඩ තිබූ ප්‍රකාශයක් සිදු කිරීමයි. එහෙයින් බුදුරජාණන් වහන්සේගේ දේශනාවලට අනුගතව සිටි සියලුම භික්ෂූන් වහන්සේ කාශ්‍යප මහා තෙරණුවන්ගේ ප්‍රධානත්වයෙන් ධර්ම සංගායනාවක් පැවැත්වීය. මෙම සංගායනාවේ අරමුණ වූයේ බුද්ධ දේශනාවට එල්ලවීමට ඉඩ තිබූ අභියෝග පරාජය කරමින් අනාගත පරම්පරා වෙනුවෙන් බුද්ධ ධර්මය දීර්ඝ කාලීනව ආරක්ෂාකර ගැනීමට විවිධ විධිවිධාන යෙදීම විය. ඒ අනුව කාශ්‍යප මහා තෙරණුවන් විසින් ධර්ම භාණ්ඩාගාරික වූ ආනන්ද මහා තෙරණුවන් ඇතුළුව තෝරාගත් මහා තෙරවරුන් 500 ක ගෙන් සමන්විත සංගායනාවක් රජගහ නුවරදී පවත්වන ලදී.

සම්මේලනයට සහභාගී වූ සියලුම තෙරවරුන් බුදුන්ගේ දේශනා සියල්ල ස්මරණයෙන් දැන සිටි නමුත්, සම්මේලනයේ වැඩකටයුතු සංවිධානාත්මක ලෙස ඉදිරියට ගෙනයාම සඳහා ධර්ම භාණ්ඩාගාරික වූ ආනන්ද මහා තෙරණුවෝ ධර්මය ද, විනය කටයුතු පිළිබඳ ප්‍රධානත්වය දරමින් සිටි උපාලි මහා තෙරණුවෝ විනය කටයුතු ද භාරව ක්‍රියා කිරීමට තෝරා පත්කර ගත්තෝය. මෙම සම්මේලනයේ වැඩකටයුතු කරගෙන යාමේදී ගැටලු මතු වුවහොත් ප්‍රශ්න ඇසීමට ද, එම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ද, ඒවා සාකච්ඡා කිරීමෙන් අනතුරුව තීරණවලට එළඹීමට ද අවස්ථාව සැලසූ අතර, බුදුරජාණන් වහන්සේ විසින් උගන්වන ලද ප්‍රධානම දර්ශනය වූ සමඟිව රැස්වී සමඟිව සාකච්ඡා කොට, සමඟිව තීරණවලට එළඹ, සමඟිව විසිරයාම යනාදී ලක්ෂණවලින් යුක්ත ප්‍රජාතන්ත්‍රවාදී යහපාලන ක්‍රමයට අනුව මෙම සම්මේලනය පැවැත්විණි.

මාස 07ක් ඇතුළත මහා තෙරවරු කටපාඩමින් සියලු බුද්ධ ධර්මය යළි ශබ්ද නගා කියවමින් සංගායනාව සිදුකළ අතර, අනාගතයේ දී ද එසේම කටපාඩමින් ඒවා සුරක්ෂිත කොට පවත්වා ගැනීමට එකඟතා ඇතිකර ගත්හ. මෙම සංගායනාවේදී ත්‍රිපිටකය කොටස්වලට බෙදා ඒවා ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරා මඟින් අසීමිත කාලයක් තිස්සේ පවත්වා ගැනීමේ කාර්යය මහා තෙරවරුන්ගේ ප්‍රධානත්වයෙන් සැකසුන කණ්ඩායම්වලට පවරනු ලැබීය. පළමුවෙනි සංගායනාවේ දී එලෙස එළඹගත් තීරණ ඉදිරි වසර 100 ක් තිස්සේ අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි.

එපරිද්දෙන් මහා තෙරවරුන්ගේ මූලිකත්වයෙන් පැවැත් වූ පළමුවෙනි සංගායනාවේ දී එළඹගත් තීරණ ථෙරවාදය ලෙස ද එකී තීරණවලට අනුව සැකසුන සංගෘහිතව ථෙරවාදී ත්‍රිපිටකය ලෙසද හඳුන්වනු ලැබේ.

**2 වෙනි සංගායනාව**



පළමුවෙනි සංගායනාව අවසන් වී වසර 100ක් ගතවෙද්දී භික්ෂු විනය සම්බන්ධයෙන් වූ තවත් ගැටලු කිහිපයක් උද්ගත විය. ඒවා බුදුන් වහන්සේ විසින් භික්ෂූන්ට අකැප ලෙස දේශනා කර තිබූ පැවතුම් 10 ක් (දස ක්‍රියා) කැප ඒවා ලෙස දක්වමින් ඒවා අනුගමනය කිරීමේ වරදක් නැති බව භික්ෂූන් කණ්ඩායමක් විසින් ප්‍රකාශ කරනු ලැබීමත් සමඟ බුද්ධ දේශනාවට අභියෝග එල්ලවීමට ඉඩ ඇති බව දුටු මහා තෙරවරු කතිකා කොටගෙන දෙවෙනි සංගායනාව පැවැත් වූහ. රේවත තෙරණුවන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම සංගායනාවේ අරමුණ වූයේ බුදුන් වහන්සේගේ සත්‍ය ඉගැන්වීම සුරක්ෂිත කොට අසීමිත කාලයක් තිස්සේ ඒවා නොකඩවා පවත්වා ගැනීම බව රේවත තෙරණුවෝ පැහැදිලි කළහ. මෙහි ආරම්භක රැස්වීමට සහභාගී වී සිටි සමස්ත භික්ෂු සමූහයා වූ 12,000 ක් පමණ වූ උන්වහන්සේලාගේ ස්මරණයෙන් ත්‍රිපිටකය දේශනා කළ හැකි මහා තෙරවරුන් 7,000 ක් තෝරාගත් රේවත මහා තෙරණුවෝ කාලාශෝක රජුගේ අනුග්‍රහය යටතේ මාස 8 කින් සංගායනාව අවසන් කළහ. එහිදී ද පළමුවෙනි සංගායනාවේදී පිළිගත් ආකාරයට ත්‍රිපිටකය අඛණ්ඩව ස්මරණයෙන් පවත්වා ගැනීමට විධි විධාන යොදනු ලැබීය.

**3 වෙනි සංගායනාව**

දෙවන සංගායනාවෙන් ඉක්බිති තවත් වසර 100 ක් ගෙවී යත්ම තුන්වන සංගායනාවක් පැවැත්වීමේ අවශ්‍යතාවය ද පැනනැඟී තිබිණි. ධර්මාශෝක අධිරාජයාගේ පාලන සමයේ පැවැත්වූ මෙම තුන්වෙනි සංගායනාවේ ද අරමුණු වූයේ ඒ වන විට තරමක් ව්‍යාකූල තත්ත්වයට පත්වෙමින් තිබූ බෞද්ධ ඉගැන්වීම් නිරවුල්කොට සත්‍ය ධර්මය ඉදිරියට සුරක්ෂිත කොට පවත්වා ගැනීමට විධි විධාන යෙදීම විය.

පැහැදිලිවම දකින්නට ලැබුණ පරිදි පළමුවෙනි සංගායනාවේදී එළඹගත් තීරණ ඒකමතික වූ අතර,

එතැන් සිට වසර 100 ක් යන තෙක්ම සමාජගත වී තිබුණේ එපරිද්දෙන් තීරණය වූ ථෙරවාදී බෞද්ධ ඉගැන්වීම් සම්ප්‍රදාය පමණි. එහෙත් දෙවෙනි සංගායනාවේදී එළඹගත් තීරණ අතර සමහර ඒවා ඇතැම් භික්ෂූන් වහන්සේ විසින් පිළිනොගත් අතර, තුන්වෙනි සංගායනාව පැවැත් වූ අවස්ථාව වන විට බුදුන් වහන්සේ දේශනා කළ විනය පටිපාටියට පටහැනිව කටයුතු කළ භික්ෂූන් වහන්සේ කණ්ඩායම් කිහිපයක් බිහිවෙමින් තිබිණි. මෙම තත්ත්වය යටතේ මොග්ගලීපුත්ත තිස්ස මහතෙරණුවන් සහ අශෝක අධිරාජයා එකතුව බුද්ධ ශාසනය පිරිසිදු කිරීම සඳහා පැවැත්වූ තුන්වෙනි ධර්ම සංගායනාවේදී සිවුරු දරමින් සිටි මිථ්‍යා දෘෂ්ටිකයන් හැට දෙනෙක් උපැවිදි කළහ. අනතුරුව සම්මේලනයට රැස්වූ භික්ෂූන් අතුරින් මොග්ගලීපුත්ත තිස්ස තෙරණුවෝ විසින් දහසක් දෙනා තෝරාගන්නා ලදි. බෞද්ධ දේශනා යළි සජ්ඣායනා කරමින් මාස 09ක් තිස්සේ පැවැත්වූ සංගායනාව අවසානයේ දී පළමුවෙනි සංගායනාවේ දී එළඹගත් තීරණවලටම එළඹුණි.

### iii. ලක්දිව බුදු සසුන ස්ථාපනය කිරීම

තුන්වෙනි ධර්ම සංගායනාව අවසානයේ මොග්ගලීපුත්ත තිස්ස මහා තෙරුන්ගේ උපදෙස් පරිදි ඒ ඒ රටවල බුද්ධ ශාසනය ස්ථාපිත කිරීම සඳහා විවිධ ප්‍රදේශ නවයකට ධර්මදූත පිරිස් යැවීය. එහිදී මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රධාන ඉට්ටිය, උත්තිය, සම්බල, භාද්‍රශාල යන ස්ථවිරයන් සිව්දෙනා ලක්දිවට එවීමට තෝරා ගැණින. එවකට ලක්දිව සිහසුන දරමින් සිටියේ වයස්ගතව සිටි මුටසිව රජතුමා වූ බැවින් බුදු සසුන පිහිටුවීමට එය සුදුසු කාලය නොවන බව තීරණය කළ මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට පැමිණීමට පෙර තම මව දැක ගැනීම සඳහා උන්වහන්සේගේ උපන් භූමිය වූ දක්ෂිණගිරියට වැඩම කළහ.

එහිදී මහරහතන් වහන්සේගේ ධර්මය අසා සෝවාන් ඵලයට පත්වූ භණ්ඩුක උපාසක ද (දෙේදිස දේවියගේ ඥාතියෙකි.) සංඝමිත්තා මෙහෙණියගේ ගිහි ජීවිතයේ පුත්‍රයා වූ සුමන සාමණේර ද දූත පිරිසට එකතු කර ගනු ලැබීය. එහිදී භණ්ඩුක උපාසක එකතු කර ගැනීමේ අරමුණ වූයේ ගිහියෙකු පැවිදි ජීවිතයට පත්වීමේ පළමු අවස්ථාව ජනතාවට පැහැදිලි කරදීම සඳහාය. එපරිද්දෙන් සත් දෙනෙකුගෙන් යුක්ත දූත පිරිස පොසොන් පුන් පොහෝ දින මිස්සක පව්ව හෙවත් මිහින්තලේ කඳු මුදුනට සැපත් වූහ.

දේවානම්පියතිස්ස රජු සිය සෙනඟ පිරිවරාගෙන මුව දඩයමේ ගොස් සිටි අවස්ථාවේ මිහිඳු මහරහතන් වහන්සේ හමුවීම සිදුවිය. ලෝක ඉතිහාසයේ පැවැත්වූ ප්‍රථම බැරෑරුම් බුද්ධි පරීක්ෂණය ලෙස සලකනු ලබන ප්‍රශ්නාවලියක් මිහිඳු මහරහතන් වහන්සේ විසින් රජුගෙන් අසන ලදි. ඒවාට රජතුමා දුන් පිළිතුරු අනුව බුදුදහම අවබෝධ කරගන්නට අවශ්‍ය බුද්ධිය රජුට ඇති බව පැහැදිලි වීමෙන් පසුව දේවානම්පියතිස්ස රජුගේ නුදුටු මිතුරෙකු වූ ධර්මාශෝක අධිරාජයාගේ පණිවුඩය මිහිඳු මහරහතන් වහන්සේ විසින් දේවානම්පියතිස්ස රජුට දන්වන ලදි. එපරිද්දෙන් මිහිඳු මහරහතන් වහන්සේ විසින් ආරම්භ කොට මෙරට ව්‍යාප්ත කිරීමට විධි විධාන සලසනු ලැබුවේ පළමුවෙනි, දෙවෙනි, තුන්වෙනි ධර්ම සංගායනාවල දී ශුද්ධ කර ස්මරණයෙන් පවාත්වාගත් ථෙරවාදී පාලි ත්‍රිපිටකයයි.

### iv. බුද්ධ ශාසනය ස්ථාපිත කිරීමට පෙර ජනතාවට ලබාදිය යුතු වූ දහම් දැනුම ලබාදීම

රජතුමා ඇතුළු පිරිසට අඹ උයනේදී චුල්ලහත්ථිපදෝපම සූත්‍රය දේශනා කිරීමෙන් බුද්ධ ශාසනය ස්ථාපිත කිරීමට අවශ්‍ය දහම් දැනුම ලබාදීම සඳහා ධර්ම දේශනා පැවැත්වීම ආරම්භ කෙරිණි. පළමුවෙනි දිනයේදීම භණ්ඩුක උපාසක පැවිදි දිවියට ඇතුළත් කිරීමෙන් රජු ඇතුළු පිරිස තුළ කිසියම් සැක සාංකා තිබුණේ නම් එය දුරලන ලදි. මිහිඳු මහරහතන් වහන්සේ මෙරට භාවිත භාෂාවෙන් ධර්මය දේශනා කළ බව සඳහන් වීම අතිශය වැදගත් කරුණකි. මිහිඳු මහරහතන් වහන්සේ මෙරට භාෂාව දැන සිටි බව එයින් හෙළිවෙන එක වැදගත් කරුණක් වන අතර, එදා අපේ රටේ භාවිත වූ සිංහල භාෂාව බුදු දහම වැනි ගැඹුරු ආගමක් පැහැදිලි කිරීමට තරම් පොහොසත් භාෂාවක් වූ බව තවත් වැදගත් කරුණකි.

මිහිඳු මහරහතන් වහන්සේගේ ආශිර්වාද ලද උන්වහන්සේගේ සුරතින් රන් නඟුලකින් සීමා නියම කොට සාංඝික භූමියක් ලෙස පූජා කළ මහමෙව්නා උයන තුළ ඉදිරි කාලයේ දී භික්ෂු භික්ෂුණීන් සඳහා ආවාස, පිරිවෙන් පමණක් නොව, විශේෂයෙන් ස්තූප සඳහා සහ ශ්‍රී මහා බෝධිය රෝපණය කිරීම ආදී විවිධ පූජනීය ස්ථාන ඉදිකිරීම සඳහා ස්ථාන 32 ක සීමා ලකුණු කරන ලදි.

මිහිඳු හිමියන් මෙරටට වැඩම කිරීමෙන් පසු දෙවෙනි දවසේ රජ මාලිගාවේ රාජකීයයන්ට ප්‍රේත වත්තු සහ විමාන වත්තු තේමා කොටගෙන ධර්මය දේශනා කළ අතර, එම ධර්මය ශ්‍රවණය කළ 500ක් පමණ දෙනා සෝවාන් තත්ත්වයට පත්වූහ. ඊළඟ දිනයේ ධර්ම ශාලාව ලෙස සකස් කරගත් රජුගේ ඇත්හල තුළදී විශාල ජනකායකට දේවතා සූත්‍රය දේශනා කළහ. ඉන් අනතුරුව ජනතාවට සාමාන්‍ය කරුණු පැහැදිලි කළ සූත්‍ර කිහිපයක්ම දේශනා කිරීමෙන් ජනතාව ධර්ම දේශනාවලට සවන් දීමට හා ඒවා අවබෝධකර ගැනීමට පුරුදු කිරීමෙන් පසුව බෞද්ධ දේශනාවල වඩාත් ගැඹුරු ධර්මය ඇතුළත් ධම්මචක්කපවත්තන සූත්‍රය වැනි චතුරාර්ය සත්‍ය සහ ආර්ය අෂ්ඨාංගික මාර්ගය යනාදිය පැහැදිලි කළ ධර්ම දේශනා පැවැත්වීය.

එපරිද්දෙන් මෙරට ථෙරවාදී ත්‍රිපිටකයේ ඉගැන්වීම්වලට අනුකූලව බුද්ධ ශාසනය ස්ථාපිත කිරීමට අවශ්‍ය දහම් දැනුම ජනතාවට ලබාදීම සඳහා මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු දූත පිරිස දිනපතා විවිධ ස්ථානවල දී දිගින් දිගටම ධර්මය දේශනා කළහ. එසේම බුදු සසුන ස්ථාපිත කිරීමේ දී එයට අවශ්‍ය භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා යන සිව්වනක් පිරිස ගොඩනැඟීමට යුහුසුලු විය. ධර්ම දේශනා මගින් උපාසක උපාසිකා පිරිස් සැකසුන අතර, මිහිඳු මහරහතන් වහන්සේගේ ධර්මය ශ්‍රවණය කළ අනුලා බිසව සෝවාන් තත්ත්වයට පැමිණීමෙන් පසුව පැවිදිවීමට කැමැත්ත ප්‍රකාශ කළාය. එහෙත් කාන්තාවන් පැවිදි කිරීම භික්ෂූන්ට අකැප බව පැවසූ මිහිඳු හිමියෝ තම නැඟණිය වූ සංඝමිත්තා භික්ෂුණිය කැඳවා ගැනීමට විධි විධාන යෙදූහ. උන්වහන්සේ තම පියාණන් වූ ධර්මාශෝක අධිරාජයා වාසය කළ පාඨලී පුත්‍ර නගරයට දූත පිරිසක් යවන ලෙස දේවානම්පියතිස්ස රජතුමාට දැන්වූහ. ඒ සමඟ දඹදිව ශ්‍රී මහා බෝධි ශාඛාවක් ගෙන්වා ගැනීමට ද උපදෙස් දෙන ලදි. ඒ අනුව කටයුතු කළ දේවානම්පියතිස්ස රජු දූත ගමනේ ප්‍රධානියා ලෙස තම බෑනා කෙනෙකු වූ අරිට්ඨ ඇමතිවරයා තෝරාගත් අතර, තමා ආපසු පැමිණි පසුව පැවිදිවීමට අවසර දෙන්නේ නම් මෙම දූත ගමනේ නායකත්වය දැරීමට කැමති බව අරිට්ඨ ඇමතිවරයාගේ පිළිතුර විය. රජතුමා එම ඉල්ලීමට එකඟ වූ බැවින් අරිට්ඨ ඇමතිවරයාගේ ප්‍රධානත්වයෙන් සිදු වූ දූත මෙහෙවරේ දී සංඝමිත්තා භික්ෂුණිය මෙන්ම ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ද මෙරටට ලබා ගැනීමට හැකිවිය. තවත් භික්ෂුණීන් එකළොස් දෙනෙකු සමඟ මෙරටට වැඩම කළ සංඝමිත්තා භික්ෂුණිය විසින් අනුලා බිසව ඇතුළු තවත් කාන්තාවන් 500ක් දෙනා පැවිදි බිමට ඇතුළත් කර ගත්හ.

ඒ සමඟ රජතුමා අරිට්ඨ ඇමතිවරයාට පොරොන්දු වූ පරිදි ඔහු සහ ඔහුගේ සහෝදරයින් 55 දෙනෙකු පැවිදි බිමට ඇතුළත් කර ගැනීමට මිහිඳු මහ රහතන් වහන්සේ පියවර ගත්හ. එපරිද්දෙන් මාසයක් වැනි කාලයක් ඇතුළත මිහිඳු මහ රහතන් වහන්සේට ලක්දිව භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසෙන් යුක්තව අංගසම්පූර්ණ ලෙස බුද්ධ ශාසනය පිහිටුවීමට හැකි විය.

### V. භික්ෂූන්ට හා භික්ෂුණීන්ට පහසුකම් සැලසීම


සම්බුද්ධ ශාසනය ස්ථිරසාර ලෙස මෙරට ස්ථාපනය වීමට නම් පැවිද්දන් සඳහා වෙන් වූ සුදුසු උපෝසථ භූමියක් අවශ්‍ය බව මිහිඳු මහරහතන් වහන්සේ රජුට දැන්වූහ. ඒ අනුව නගරයට ආසන්නව පිහිටි නන්දන

උයන ඒ සඳහා සුදුසු නොවන බව පැහැදිලි කිරීමත් සමඟ නගරයට එතරම් සමීප නොවූ මහමෙව්නා උයන ඒ සඳහා වෙන් කිරීමට රජු තීරණය කළේය. මිහිඳු මහරහතන් වහන්සේගේ ආශිර්වාද ලද උන්වහන්සේගේ සුරතින් රන් නඟුලකින් සීමා නියම කොට සාංඝික භූමියක් ලෙස පූජා කළ මහමෙව්නා උයන තුළ ඉදිරි කාලයේ දී භික්ෂු භික්ෂුණීන් සඳහා ආවාස, පිරිවෙන් පමණක් නොව, විශේෂයෙන් ස්ථූප සඳහා සහ ශ්‍රී මහා බෝධිය රෝපණය කිරීම ආදී විවිධ පූජනීය ස්ථාන ඉදිකිරීම සඳහා ස්ථාන 32 ක සීමා ලකුණු කරන ලදි. මිහිඳු මහරහතන් වහන්සේ එම කටයුතු ඉටු කළ ආකාරය අනුව ක්‍රමයෙන් වර්ධනය වන්නා වූ පමණක් නොව, දීර්ඝ කාලයක් පවතින ආකාරයේ ආයතනයක් ආරම්භ කළ බව ද උන්වහන්සේට බුද්ධකාලීන ඉන්දියාවේ පැවති ආකාරය පිළිබඳව යථාවබෝධයක් තිබූ බව ද එම දැනුම ප්‍රයෝජනයට ගෙන ලංකාද්වීපය තුළ ද එවන් ආරාම සංකීර්ණයක් ඉදි කිරීමට ක්‍රියා කළ බව ද පැහැදිලි වේ.

එපරිද්දෙන් මහමෙව්නා උයන සාංඝික කර පූජා කිරීමෙන් අනතුරුව රජු එදිනම මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු භික්ෂු පිරිසට වාසය කිරීම සඳහා ප්‍රාසාදයක් ඉදි කළේය. එය මැටියෙන් ගොඩනඟා හදිසියේ මැටි වේලා ගැනීම සඳහා ගින්නෙන් පිලිස්සූ බැවින් කළු පැහැය ගත් බව ද, ඒ නිසා එය කාල ප්‍රාසාදය නමින් හැඳින් වූ බව ද සඳහන් වේ. එම ආරාම භික්ෂූන් වහන්සේගේ වාසස්ථානයට මෙන්ම පිරිවෙනක් ලෙස ද භාවිතා කෙරිණි.

රජතුමා භික්ෂුණීන් උදෙසා 'උපාසිකා විහාර' නමින් භික්ෂුණී ආරාමයක් ද ඉදි කළ අතර, සංඝමිත්තා භික්ෂුණිය විසින් එය පුළුල් කර ඉදි කරවා ගෙන කාමර තුනක ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම වූ නැවේ රුවල, සුක්කානම සහ තුඹ ගස තැන්පත් කළාය. ඒ අනුව ලෝකයේ ප්‍රථම කෞතුකාගාරය ද එමඟින් ආරම්භ වූ බව සැලකේ.

පසුව සංඝමිත්තා භික්ෂුණියගේ ඉල්ලීම පරිදි වඩාත් පහසුකම් සහිතව හත්ථාලක භික්ෂුණී ආරාමය ද රජු විසින් ඉදි කරවන ලදි. එය භික්ෂුණීන්ගේ වාසය සඳහා පමණක් නොව භික්ෂුණීන්ට සහ කාන්තාවන්ට අධ්‍යාපනය ලබා දෙන මධ්‍යස්ථානයක්




බවට ද පත් කෙරිණි. ඊටත් අමතරව රජු සුනහත, දීඝචංකමනත, පලග්ග, මරගන, තේරපස්සය ආදී වශයෙන් තවත් පිරිවෙන් කිහිපයක් ද ඉදි කරවීය. මේ අනුව මිහිඳු මහරහතන් වහන්සේ මෙරට බුද්ධ ශාසනය ආරම්භ කළ මුල් අවධියේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසට අධ්‍යාපනය ලබා දීම සඳහා විධි විධාන යෙදූ බව දැකිය හැකිය.

මහතෙරුන් වහන්සේ මහමෙව්නා උයන පිළිග ැනීමෙන් පසු වස්සාන කාලය ගත කිරීම සඳහා මිස්සක පව්වට වැඩම කිරීමත් සමඟ එම ස්ථානය ද අවශ්‍ය පරිදි සකස් කළ රජතුමා ලෙන් 68 ක් ඉදිකර වූයේය. මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රධාන සෙසු භික්ෂු පිරිස ද එම වස්සාන කාලය එහි ගත කළ අතර, දානමය අවශ්‍යතා සඳහා පමණක් නගරයට වැඩම කළහ.

### vi. පූජනීය වස්තූන් ලබා ගැනීම

බුද්ධ ශාසනය ස්ථාවරව පිහිටුවීම සඳහා ධර්ම දේශනා පැවැත්වීම හෝ ධර්මය අධ්‍යයනය කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බව ද බුදුන් වහන්සේගේ උද්දේශික සහ පාරිභෝගික වස්තූන්ට



වන්දනා කිරීම මඟින් උන්වහන්සේ වන්දනා කළ යුතු බව මහරහතන් වහන්සේ විසින් දේවානම්පියතිස්ස රජුට පැහැදිලි කරන ලදි. ඒ අනුව උන්වහන්සේගේ උපදෙස් පරිදි ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව ගෙන්වා ගෙන මිහිඳු මහා රහතන්වහන්සේ විසින් මහමෙව්නා උයන සැලසුම් කළ අවස්ථාවේ ඒ සඳහා වෙන්කර තිබූ ස්ථානයේ ශ්‍රී මහා බෝධිය රෝපණය කරන ලදි. එපමණක් ද නොව, එම බෝධි රෝපණ අවස්ථාවේ දී රැස්වූ දහස් සංඛ්‍යාත ජනතාව බලා සිටියදීම බෝධි ශාඛාවේ එක් අත්තකින් ඵල අටක් ද, පසුව සෙසු අතු රිකිලිවලින් තවත් ඵල තිස් දෙකක් ද බිහි වූ අතර, රට පුරා වැදගත් ස්ථානවල රෝපණය කිරීමට රජතුමා විසින් ඒවා බෙදා දෙන ලදී. එය රට පුරා ජනතාවට බුදු දහමේ පහස ලබා දීමට අනුගමනය කළ වැදගත් පියවරක් විය.

බුදුන් වහන්සේගේ අග්‍රතම පාරිභෝගික වස්තුව වශයෙන් ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවාගෙන පැමිණි සංඝමිත්තා භික්ෂුණිය ප්‍රධාන දූත පිරිස සමඟ බෝධීන් වහන්සේට සුපුරුදු පරිදි ආවතේව කිරීම සඳහා ධර්මාශෝක අධිරාජයා විසින් විවිධ සේවා ශ්‍රේණි අටකින් අටදෙනා බැගින් හැට හතර දෙනෙකු එවූ අතර, එමඟින් අපේ රටට අලුත්ම සේවා ශ්‍රේණි ක්‍රමයක් ද ලැබුණි. එසේම බෝධීන් වහන්සේ රැකබලා ගැනීම සඳහා පැමිණි එම සේවා ශ්‍රේණිවල වියදම සඳහා එක සේවා ශ්‍රේණියකට රන් සහ රිදී පිර වූ භාජන අට බැගින් ද එවූ බව සඳහන් වේ.

මෙම මුල් අවදියේම බුදුරජාණන් වහන්සේ ශාරීරික ධාතූන් වහන්සේලා ද මෙරටට වඩම්මවා ගැනිණි. මිහිඳු මහරහතන් වහන්සේගේ ඉල්ලීම පරිදි ධර්මාශෝක රජු විසින් ලක්දිවෙන් ගිය දූත පිරිසට බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතුව පරිත්‍යාග කළ අතර, එය මෙරටට වැඩමවීමත් සමඟ ශ්‍රී මහා බෝධිය රෝපණය කළ ස්ථානය අසලම චෛත්‍ය

සඳහා වෙන්කර තිබූ භූමියෙහි ථූපාරාම චෛත්‍ය ඉදිකරවා එහි තැන්පත් කරනු ලැබීය. එපරිද්දෙන් බුද්ධ ශාසනය ස්ථාපනය කිරීමට අවශ්‍ය පිරිස් පමණක් නොව, භික්ෂු භික්ෂුණී දෙපාර්ශ්වයටම වාසය කිරීමට අවශ්‍ය ආවාස ඉදි කිරීමෙන් ද බුදු දහම ඉගෙන ගැනීම සඳහා පිරිවෙන් ඉදි කිරීමෙන් ද ජීවමාන බුදුන් වහන්සේට වන්දනාමාන කිරීමට උන්වහන්සේගේ උද්දේශික සහ පාරිභෝගික ධාතු ලබාදීමෙන් ද බුද්ධ ශාසනය ස්ථාපනය කිරීමට අවශ්‍ය මූලික දෑ සියල්ල සපුරා අවසන් කෙරිණි.

අනතුරුව මිහිඳු මහරහතන් වහන්සේ ඇමතූ දේවානම්පියතිස්ස රජතුමා දැන් ලක් දෙරණ තුළ බුදු සසුන ස්ථාපිත වී දැයි විමසීය. බුදු සසුන පිහිටුවා ඇති නමුත්, එය මුල් බැස නොමැති බව මහරහතන් වහන්සේගේ පිළිතුර විය.

එම තත්ත්වය සපුරා ගැනීම සඳහා කළ යුතු දෑ පිළිබඳව විමසූ රජුට ලැබුණ පිළිතුර වූයේ "මෙරට දෙමව්පියන්ට දාව මෙරටේ ඉපිද, මෙරටදීම පැවිදි වී, මෙරට දීම අධි සිල් ලබා, මෙරටදී බුදු දහම ඉගෙනගත් භික්ෂුන් වහන්සේ නමක් විසින් මෙරට දී සද්ධර්මය විග්‍රහ කරමින් ධර්මය දේශනා කිරීමෙන් පසුව පමණක් බුදු සසුන මුල්බැස ගනු ලබන බවයි." එකී සුදුසුකම් සියල්ල සපුරා ලූ භික්ෂුන් වහන්සේ නමක් මෙරට සිටි බව ද මිහිඳු හිමියෝ පෙන්වා දුන්හ. එනම් ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩමවීමට ගිය දූත පිරිසේ නායකත්වය දැරුවා වූ ද ශ්‍රී මහා බෝධීන් වහන්සේ සමඟ ආපසු පැමිණීමෙන් පසුව පැවිදි දිවියට ඇතුළත් වූවා වූ ද අරිට්ඨ මහා තෙරණුවෝ වූහ. අරිට්ඨ මහා තෙරණුවන් ලවා ධර්ම සාකච්ඡාවක් පැවැත්වීම සඳහා මිහිඳු මහරහතන් වහන්සේ සහ මහ අරිට්ඨ තෙරණුවෝ සම අසුන් ගෙන අරහත් ඵලයට පත් තවත් භික්ෂුන් 500 ක් දෙනා රැස්වූ මහා සම්මේලනයක් ථූපාරාමයේදී පැවැත්වීය. බුද්ධ ශාසනය මෙරට මුල් බැස ගැනීම ස්ථාවර කිරීමේ උත්තරීතර අවස්ථාව වූ ද මිහිඳු මහරහතන් වහන්සේ විසින් මෙරටට ගෙන එන ලද ථෙරවාදී ත්‍රිපිටකය ලක්දිව භික්ෂු පරපුරට උරුම කර දුන්නා වූ ද අතිශය වැදගත් වූ මෙම සම්මේලනය හතර වෙනි ථෙරවාදී ත්‍රිපිටක සංගායනාව ලෙස ද පිළිගනු ලැබේ.

මෙහිදී මිහිඳු මහරහතන් වහන්සේ විසින් අනුග මනය කරන ලද ප්‍රතිපත්ති මඟින් ථෙරවාදී ත්‍රිපිටකය මත පදනම් වී පිහිටුවන ලද බුද්ධ ශාසනය නියත වශයෙන්ම ජාතික ආයතනයක් ලෙස පිහිටුවා එය දැයට දායාද කරදුන් බව පැහැදිලිය.

එපරිද්දෙන් මෙරටට උරුම කර දුන් ථෙරවාදී ත්‍රිපිටක ධර්මය දිගු කලක් තිස්සේ ස්මරණයෙන් පවත්වාගනු ලැබීය. ඒ අනුව ධර්මය ශ්‍රවණය කිරීම, ඒවා ස්මරණයේ තබා ගැනීම සහ ඒවා සජ්ඣායනා කිරීමෙන් පවත්වාගත් මෙම ක්‍රමය 'භාණක' ලෙස හැඳින්වේ. ඒ අනුව මිහිඳු මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවලට බෙදාගෙන අට්ඨකතා ද ඇතුළුව ත්‍රිපිටකයේ සියලු ධර්මය කණ්ඩායම් වශයෙන් කටපාඩම් කරගෙන ජනතාවට දේශනා කරන ලදී. එක් පිටකයක් පමණක් කටපාඩම් කළ භික්ෂුන් එම ධර්ම කොටස නමින් හෙවත් උදාහරණ වශයෙන් අංගුත්තර භාණක, දීඝ භාණක ආදී වශයෙන් ද සමස්ත ත්‍රිපිටකය කටපාඩම් කළ භික්ෂූහු ත්‍රිපිටක භාණක ලෙස ද හැඳින්වූහ. ඒ අනුව බුදුන් වහන්සේ ජීවමානව වැඩසිටි කාලයේ දී කළ පරිදි මෙන්ම 1, 2, 3 සංගායනාවලදී කළ පරිදිම ලක්දිව තුළ පැවැත් වූ 4 වෙනි සංගායනාවෙන් පසුව ද හෙවත් ථූපාරාම සංගායනාවෙන් පසු ලාංකේය භික්ෂුන් වහන්සේ ද තව වසර 218 පමණ තිස්සේ ධර්මය ස්මරණයේ තබාගෙන ඒවා ජනතාවට දේශනා කිරීමෙන් ථෙරවාදී ත්‍රිපිටකය සුරක්ෂිත කළ බව ඉතිහාසයේ දැක්වේ.

**vii. ත්‍රිපිටකය ග්‍රාන්ථාරූඪ කිරීම**

එපරිද්දෙන් සම්ප්‍රදායානුකූල භාණක ක්‍රමය වසර 200 ඉක්මවා පවත්වා ගනිද්දී බුද්ධ වර්ෂ 454 - 466 දක්වා රජකළ වළගම්බා රාජ්‍ය සමයේදී එයට බාධා පැමිණ වූ සිදුවීම් කිහිපයක් මතුවිය.

1. තිය බමුණාගේ කැරැල්ල

2. බැමිනිටියා සාය

3. ෂඩ් දෙමළ ආක්‍රමණය යනු එම සිදුවීම් කිහිපයකි. බැමිණිටියා සය හේතු කොට රටේ ගොවිතැන් පාළු වී, වැව් අමුණු වියළී, සතා සිව්පාවුන් විනාශ වී, සිය

දහස් ගණනින් මනුෂ්‍යයෝ ද මරුමුවට පත්වූහ. ඒ අතර රාජ්‍ය බලය උදුරා ගැනීම සඳහා තිය නමැති බමුණා දේශීය වශයෙන් ඇති කළ කැරැල්ල පමණක් නොව, දකුණු ඉන්දියාවෙන් දෙමළ ප්‍රධානීන් සය දෙනෙක් ද ආක්‍රමණ එල්ල කළහ. දෙමළ හමුදාවට පරාජය වූ රජුට පලායාමට සිදුවිය. මෙම තත්ත්වය යටතේ ඇතැම් භානකවරු මියගිය අතර, බොහෝ දෙනා ජීවිතය බේරාගැනීම සඳහා ඉන්දියාවට පලා ගියහ. කෙසේ හෝ ජීවිතය පරදුවට තබා හෝ ත්‍රිපිටකය ආරක්ෂා කර ගැනීමේ අදිටනින් මධ්‍යම කඳුකරයේ කොළ මුල් ආදිය අනුභව කරමින් ජීවිතය බේරාගත් භානකවරු පිරිසක් ද වූහ.

අවසානයේ භික්ෂූන් වහන්සේ සහ ජනතාවගේ සහය ඇතිව වළගම්බා රජු යළි සිහසුනට පත්විය. මුඛ පරම්පරාවෙන් පවත්වාගත් ථෙරවාදී ත්‍රිපිටකය විනාශ වී යාමේ අභියෝගය හමුවේ මහා විහාරවාසී භික්ෂුහු එය ආරක්ෂා කර ගැනීම සඳහා ලේඛනගත කිරීමේ තීරණයට එළඹුණහ. මෙම ලේඛනගත කිරීම පිළිබඳව දීපවංශය සහ මහාවංසය වැනි මූලාශ්‍රවල සඳහන් වී ඇත්තේ ඉතා කෙටි වැකියක් හෝ දෙකක් පමණි. නිකාය සංග්‍රහය සහ අස්ගිරි තල්පත වැනි මූලාශ්‍රය ඊට වඩා විස්තර දක්වා ඇත. මෙම අතිවිශේෂ කාර්යයට රජුගේ අනුග්‍රහයක් ලැබුණ බවත් සඳහන් නොවන අතර, මාතලේ අලුවිහාරයේදී ථෙරවාදී ත්‍රිපිටකය පුස්කොළවල ලේඛනගත කළ බව විශ්වාස කෙරෙන මෙම සද් කාර්යයට අනුග්‍රහ දක්වා ඇත්තේ එම ප්‍රදේශයේ ප්‍රාදේශීය පාලකයෙකු බව මූලාශ්‍රවල සඳහන් වේ. මෙම සම්මේලනය වසර තුනයි මාස තුනක් තිස්සේ පැවැත් වූ අතර එහිදී ලේඛනගත කළ ථෙරවාදී පාලි ත්‍රිපිටකය ජනගත කිරීමට රජතුමා ද සහභාගී වූ බව සඳහන් වේ. පසුකාලීනව තායිලන්තය, මියන්මාර් වැනි රටවලට යවනු ලැබුවේ එලෙස මෙරට ලේඛන ගත කළ ථෙරවාදී ත්‍රිපිටකයයි.

මෑතක් වන තෙක්ම පිළිගෙන තිබූ පරිදි ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරනු ලැබුවේ මාතලේ අලුවිහාරයේදීය. එහෙත් මෑතක සිට විවිධ විද්වතුන් විසින් එම කාර්ය සිදු කරනු ලැබුවේ කෑගල්ලේ කරඬුපොත ආසන්නයේ අලුලෙනේදී බවට මතයක් ඉදිරිපත් කර ඇත. ලබාගත හැකි මූලාශ්‍රය අධ්‍යනය කොට

> මිහිඳු මහරහතන් වහන්සේගේ ඉල්ලීම පරිදි ධර්මාශෝක රජු විසින් ලක්දිවෙන් ගිය දූත පිරිසට බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතුව පරිත්‍යාග කළ අතර, එය මෙරටට වැඩමවීමත් සමඟ ශ්‍රී මහා බෝධිය රෝපණය කළ ස්ථානය අසලම චෛත්‍ය සඳහා වෙන්කර තිබූ භූමියෙහි ථූපාරාම චෛත්‍ය ඉදිකරවා එහි තැන්පත් කරනු ලැබීය.

ඒ පිළිබඳව නිගමනයකට එළඹිය යුතු බැවින් දැනට අපගේ කාර්යය සඳහා මෑතක් වන තෙක් පිළිගෙන තිබූ පරිදි ත්‍රිපිටකය ලේඛනගත කිරීම මාතලේ අලුවිහාරයේ දී සිදුකළ බව කියවෙන මතය පිළිගෙන අපට ඉදිරියට යා හැකිය. මන්ද මේ රට තුළ කුමන ස්ථානයක ලේඛනගත කළා වුව ද එම ලේඛන ගත කිරීම මඟින් ඒතාක්කල් ස්මරණයෙන් පවත්වා ගනිමින් මෙරට භික්ෂු පරපුරට උරුම වී තිබූ ත්‍රිපිටකය ලේඛනගත කිරීම මඟින් එය ජනතාවට ද උරුම වූ බව පැහැදිලිය.

එපරිද්දෙන් විශ්වසනීය මූලාශ්‍රය මත ගොඩ නැඟී ඇති ශ්‍රී ලාංකේය ඉතිහාසය අනුව බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඇතුලත් ථෙරවාදී ත්‍රිපිටකය මිහිඳු මහරහතන් වහන්සේ විසින් මෙරටට ස්මරණයෙන් ගෙන ආ බව ද, එය උන්වහන්සේ විසින් මහා අරිට්ඨ තෙරුන් ප්‍රධාන ශ්‍රී ලාංකේය භික්ෂූන් වහන්සේලාට ථූපාරාම සම්මේලනයේ දී ජාතික උරුමයක් ලෙස භාරදුන් බව ද එතැන් පටන් සියවස් දෙකකටත් වැඩි කාලයක් තිස්සේ භාණකවරුන් මඟින් එය ආරක්ෂා කොට ව්‍යාප්ත කරමින් පවත්වාගත් බව ද බුද්ධ වර්ෂ 435 දී පමණ උද්ගත වූ බාධක කිහිපයක් හේතුකොටගෙන ත්‍රිපිටකය විනාශ වී යාමට ඉඩ ඇති බව පැහැදිලි වීමත් සමඟ මහාවිහාරිය භික්ෂූන් විසින් එය ලේඛනගත කිරීමෙන් මෙරට ජාතික උරුමයක්

ලෙස ස්ථාවර තත්ත්වයට පත්කර ගත් බවත් පැහැදිලිය. එතැන් පටන් තවත් අවස්ථා දෙකක දී විවිධ අභියෝගවලට මුහුණ දුන් ථේරවාදී ත්‍රිපිටකය ආරක්ෂා කර ගැනීමට ශ්‍රී ලාංකේය උගත් භික්ෂූන් විසින් අවශ්‍ය පියවර ගන්නා ලදි.

### 01. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පාලකයන් යටතේ පැවති අවධියේ අනුගමනය කළ ක්‍රියාමාර්ග

ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන් විසින් සමස්ත ශ්‍රී ලංකාව යටත් කරගෙන පාලනය කිරීම නිසා ශ්‍රී ලාංකේය ජාතික සභ්‍යත්වයට කිසිසේත්ම නොගැළපෙන ආගමික, දේශපාලන, සමාජ, ආර්ථික සංස්කෘතික, අධ්‍යාපන ආදී සියලු ක්ෂේත්‍රවල අධිරාජ්‍යවාදයට උචිත ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරනු ලැබීය. එමඟින් රාජ්‍ය සහ අධ්‍යාපන මාධ්‍ය ඉංග්‍රීසි බවට පත් කිරීම සහ ඉතිහාසය පුරාම භික්ෂූන් වහන්සේ ප්‍රධාන කොටගත් සියලු දෙනාට දැනුම ලබාදුන් අධ්‍යාපන ආයතන ක්‍රමය වූ පිරිවෙන් නොසලකා හැරීම යනාදී ක්‍රියාමාර්ග හේතුකොට බුද්ධ ශාසනය පිරිහීමට පත්වෙමින් තිබිණි.

1760 දශකය වන විට එකදු උපසපන් භික්ෂූන් වහන්සේ කෙනෙකු හෝ නොමැතිව පරිහානියට පත්වෙමින් තිබූ බුද්ධ ශාසනය කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් යළි උපසම්පදාව පිහිටුවා වැලිවිටියේ ශ්‍රී සරණංකර සංඝරාජ තනතුරට පත්කොට පිරිවෙන් සහ භික්ෂු අධ්‍යාපනය යළි නඟා සිටුවීමට පියවර ගනු ලැබීය. එහි ප්‍රතිඵල වශයෙන් 1860 දශකයෙන් පසුව මෙරට අතිශය පුළුල් ජාතික, ආගමික සහ සංස්කෘතික පුනරුදයක් ඇති වූ අතර ඊට සමගාමිව 1867 දී පැල්මඩුල්ල පුරාණ විහාරස්ථානයට අනුබද්ධිකව ඉදිකළ ධර්ම ශාලාව නමින් හැඳින්වූ ගොඩනැගිල්ලේ ධර්ම සංගායනාවක් ද පැවැත්විණි. ඉද්දමල්ගොඩ බණ්ඩාර රටේ මහත්තයාගේ අනුග්‍රහයෙන් සංගායනාවට සුදුසු පරිදි ධර්ම ශාලාව ද ඉදිකරගෙන ප්‍රධාන පෙළේ භික්ෂූන් වහන්සේ එහි රැස්වී පළමු වන ධර්ම සංගායනාවේ සිට සෙසු සියලු සංගායනාවල දී අනුගමනය කළ ක්‍රියා පිළිවෙත අනුව කටයුතු කරමින් ථේරවාදී පාලි ත්‍රිපිටකය පිරිසිදු කොට යළි පිටපත් කරන ලදි. එහි පිටපත් එක බැගින් දළදා මාලිගාවේ පිහිටි ප්‍රාචීන් පුස්තකාලයට සහ ජාතික කෞතුකාගාරයට ලබා දෙන ලදි.

### 02. නිදහස් ශ්‍රී ලංකාවේ ත්‍රිපිටක සංරක්ෂණය

ථෙරවාදී ත්‍රිපිටකය සිංහල භාෂාවට පරිවර්තනය කොට පාලි පිටපත ද සමඟ කඩදාසියේ මුද්‍රණය කොට ප්‍රකාශයට පත්කිරීම ශ්‍රී ලංකා රාජ්‍යයේ අනුග්‍රහයෙන් මෑත කාලයේදී ත්‍රිපිටකය සංරක්ෂණයට අදාළව ඉටුකර ඇති අවසාන කර්තව්‍ය වේ. මෙම කාර්යයේ ආරම්භක පියවර වශයෙන් එවක ස්වදේශ කටයුතු භාර අමාත්‍යවරයා වූ අබේරත්න රත්නායක මහතා ඉදිරිපත් කළ යෝජනාවකට අනුව අග්‍රාමාත්‍ය ශ්‍රීමත් ජෝන් කොතලාවල විසින් ඒ සම්බන්ධයෙන් වාර්තාවක් සැපයීම සඳහා සත් දෙනෙකුගෙන් උක්ත කමිටුවක් පත්කරන ලදි. එකී කමිටුවේ වාර්තාව අනුව 1956 වසරට යෙදී තිබූ බුද්ධ ජයන්ති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා 1954 ඔක්තෝබර් 12 වෙනි දින කොළඹ නිදහස් මන්දිරයේ දී අගමැතිවරයා විසින් 'ලංකා බෞද්ධ මණ්ඩලය' පිහිටුවන ලදි.

එකී බෞද්ධ මණ්ඩලයේ ව්‍යවස්ථාව අනුව ථෙරවාදී පාලි ත්‍රිපිටකය පරිවර්තනය කිරීම සඳහා කාරක සභාවක් පිහිටුවා එමඟින් පත්කරන ලද ත්‍රිපිටක පරිවර්තන සංස්කරණ මණ්ඩලය විසින් 1955 ජුලි මස 10 වෙනි දින එකී මණ්ඩලයට පවරන ලද කාර්යභාරය ආරම්භ කරන ලදි.

1956 පවතී මහා මැතිවරණයෙන් ආණ්ඩු පෙරළියක් සිදු වී එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා අගමැති තනතුරට පත්වීමෙන් පසුව ප්‍රථම වරට පිහිටුවන ලද සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතට 'ලංකා බෞද්ධ මණ්ඩලය' පත්කරනු ලැබීය. ඒ අනුව ථෙරවාදී පාලි ත්‍රිපිටකය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමේ කාර්යභාරය පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය ජයවීර කුරුප්පු, සංස්කෘතික අධ්‍යක්ෂ ඇන්. කියු. ඩයස් ප්‍රධාන සම්පාදක වින්සන්ට් පණ්ඩිත සහ සහකාර සම්පාදක මුදලිඳු එන්.එම්. පීරිස් යන මහතුන්ගේ මෙහෙයවීම යටතේ ඉටු කෙරිණි. වසර තිස්පහක් තිස්සේ මෙම බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව සකස් කිරීමේ කටයුතු

සිදු කළ අතර, 1989 මාර්තු 31 වෙනි දින වනවිට ථෙරවාදී ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ සියල්ල සහ තවත් අමතර ග්‍රන්ථ සිංහල භාෂාවට පරිවර්තනය කොට ප්‍රකාශයට පත්කරන ලදි.

ථෙරවාදී පාලි ත්‍රිපිටකය සිංහල භාෂාවට පරිවර්තනය කර සංස්කරණයෙන් ප්‍රකාශයට පත් කිරීමේ කාර්යය පැවරුන උත්තරීතර සංස්කාරක මණ්ඩලයට පණ්ඩිත වැලිවිටියේ සෝරත නායක හිමි, ආචාර්ය පරවාහැර වජිරඥාන නායක හිමි, අග්ගමහා පණ්ඩිත බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය නායක හිමි, පණ්ඩිත ලබුගම ලංකානන්ද නාහිමි සහ පණ්ඩිත කෝදාගොඩ ඥාණාලෝක නායක හිමි යන විද්වත් නා හිමිවරු අයත් වූහ. ඊට අමතරව පරිවර්තන සංස්කරණ මණ්ඩලයට විද්වත් භික්ෂූන් වහන්සේ 28 නමක් ඇතුළත් වූ අතර, මෙම සත් කාර්යයට තෝරාගත් සියලු හිමිවරුන් අතුරින් සුදුසු පරිදි තෝරාගත් නා හිමිවරු සහභාගී වූයේ උපදේශක ධුරය, ප්‍රධාන සම්පාදක ධුරය ඇතුළු වෙනත් සම්පාදක ධුර සහ ලේකම් ධුරය යන තනතුරු දැරූහ.

ථෙරවාදී පාලි ත්‍රිපිටකය සිංහල භාෂාවට පරිවර්තන කොට පාලි පිටපත ද සමඟ මුද්‍රණය කිරීමට ගත වූ වසර 37 ක කාලය තුළ දැරීමට සිදු වූ වියදම සපුරාලීමට විවිධ පුද්ගලයන් සහ ව්‍යාපාරික ආයතනවලින් ද ආධාර සහ අනුග්‍රහ ලැබුණි. එසේම මෙම දීර්ඝ කාලය තිස්සේ තනතුරු දැරූ ජනාධිපති ඇතුළු ඇමතිවරුන් සහ අධ්‍යක්ෂ, ලේකම් තනතුරු දැරූ නිලධාරීන් විශාල පිරිසක් ද මෙම සත් කාර්යයට ආධාර සහ අනුග්‍රහ සැපයූහ.

එපරිද්දෙන් 3 වෙනි සංගායනාවේදී සංගෘහිත වූ සම්පූර්ණ ථෙරවාදී පාලි ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ 32 සහ එම ග්‍රන්ථ මාලාවට අයත් නොවන තවත් ත්‍රිපිටක ධර්මයේ න්‍යාය ග්‍රන්ථ ලෙස සලකනු ලබන 'නෙත්තිප්පකරණය' සහ 'පේටකෝපදේශය'ද පරිවර්තනය කොට ප්‍රකාශයට පත්කරන ලදි.

ඒ අනුව එකී න්‍යාය ග්‍රන්ථ දෙක හැර ථෙරවාදී ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ 32 සිංහල භාෂාවට පරිවර්තනය කිරීමෙන් අනතුරුව ග්‍රන්ථ වශයෙන් 52කින් යුක්තව ප්‍රකාශයට පත්කර ඇත. මෙම කාර්යය ඉටුකිරීමේදී ආරම්භයේ සිට වසර 15 ක් පමණ කොළඹ දෙමටගොඩ පධානගර විහාරස්ථානයේ දී 1970 සිට එකී කාර්යය අවසන් කරන තෙක් කොළඹ විජේරාම මාවතේ මහානායක චාරිකාරාමයේ දී ද පරිවර්තන සහ සංස්කරණ කටයුතු සිදුකරන ලදි.

එපරිද්දෙන් සියවස් 20 කටත් වඩා දීර්ඝ කාලයක් තිස්සේ සම්ප්‍රදායානුකූලව ශ්‍රී ලාංකේය ජාතික උරුමයක් ලෙස සුරක්ෂිත වූ ථෙරවාදී පාලි ත්‍රිපිටකය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා විසින් 2019 පෙබරවාරි 07 වෙනි දින නිල වශයෙන් ශ්‍රී ලාංකේය ජාතික උරුමයක් බවට පත්කරන ලදි.


**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සාමාජික හා සාමාජික සමිති සංවර්ධනය පිළිබඳ ජාතික මණ්ඩලය**

**දිවයිනේ සියලුම බෞද්ධ සමිති සංවිධානයන්ට අප හා එක්වී බුද්ධ ශාසනයේ උන්නතියට ඔබේ දායකත්වය ලබාදෙන ලෙසට කරන ගෞරවනීය ආරාධනයයි.**

ලිපිනය:

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
අංක 380, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

දුරකථන අංක: 011 2691695/ 011 2667017/ 076 5611374
ෆැක්ස් 011 2688517 web www.acbc.lk
විද්‍යුත් ලිපිනය acbc380@gmail.com
buddhistinfo380@gmail.com



# බහු භණ්ඩික තෙරුන් හා විළිබිය නැති මොනරා

**රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති දිසානායක හේරත්**
හතර ඇල - හිදෝගම, අනුරාධපුරය.

බහු භණ්ඩික තෙරුන් වහන්සේ ලෝබ සහගත පුද්ගලයෙකි. ඒ නිසා ඔහු නිතර දානමාන ආදියෙන් ලැබෙන පිරිකර එක්රැස් කරගත් පුද්ගලයෙකි. එයින් එකදු වස්ත්‍රයක් හෝ නැති බැරි භික්ෂුවකට දුන්නේ නැත. ලැබෙන සෑම පිරිකරක්ම තම ආරාමයේ වෙනම කාමරයක තැන්පත් කර තැබීය, දිනක් මහ වැස්සක් වැසීම නිසා තම ආරමය තැනින් තැන තෙමෙන්නට විය. තමන් සිවුරු පිරිකර තබා තිබූ කාමරය ද තෙමෙන්නට විය.

එසේ වැස්ස නිසා කාමරයේ තිබූ සිවුරු සියල්ලම තෙමී තෙත බරිත විය. බහු භණ්ඩික තෙරුන් වහන්සේ පසුදා උදෑසනම නැගිට තෙමුන පිරිකර තම ආරාමයේ ඉදිරිපිට මිදුලේ දමා අව්වේ වේළමින් ඒ මේ අත හරවමින් සිටියේය. පිරිකර සමඟ අනිත් භාණ්ඩ ද ඒ අතර විය. ඒ නිසා ඒ හිමිනම 'බහු භාණ්ඩික' නමින් ප්‍රසිද්ධියට පත් විය.

මෙම සිද්ධිය දුටු භික්ෂුන් වහන්සේලා මේ හිමි නම ගැන බුදුන් වහන්සේ දැනුවත් කළහ. ඒ සමයෙහි බුදුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ විසූහ. බුදුන් වහන්සේ භික්ෂුන් වහන්සේලා

සමඟ පිළිසිඟා වඩින අතරේදී මෙම බහු භණ්ඩික භික්ෂුවගේ ආරාමය ළඟින් වැඩියහ. ඒ අවස්ථාවේදී බහු භණ්ඩික තෙරුන් වහන්සේ සිවුරු පිරිකර අව්වේ වේළමින් ඒ මේ අත හරවමින් සිටියේය.

ඒ අවස්ථාවේ දී භික්ෂුවක සිවුරු දෙකකට වඩා තබා ගැනීමට කැප නැත යැයි ඒ භික්ෂුවට දොස් පවරා, පසුව අනුශාසනා කරනවිට, බහු භණ්ඩික භික්ෂුව තමා ඇඳ සිටි අඳනය බුදුන් වහන්සේ ඉදිරිපිට ගලවා දමා "මට මෙහෙම ඉන්නද කියන්නේ?" යැයි පැවසීය. එයින් ලැජ්ජාවට පත් වූ ඒ භික්ෂුව බුදුරජුන්ගෙන් සමාව අයැද සිටියේය. එවිට බුදුපියාණන් වහන්සේ මේ භික්ෂුව අද විතරක් නොවේ මෙයට පෙර ආත්ම භාවයේදීත් මෙබඳු දෙයක් කළා යැයි රැස්ව සිටි භික්ෂූන් අරභයා දේශනා කළ සේක.

එවිට බුදුහු ඇතුළු පිරිස දහවල දානය වළඳා ඒ භික්ෂුව සමඟ ජේතවනාරාමයට වැඩම කළහ. එහි දී සවස් භාගයේ දී දම්සභා මණ්ඩපයට වැඩම කර ඒ බහු භණ්ඩික භික්ෂුවගේ අතීත භවයේ කතාව මෙසේ වදාළහ. ඒ කෙසේද යත් යටගිය දවස ප්‍රථම කල්පයෙහි දී සිව්පා සතුන් එක් වී සිංහයකු තම රජා බවට පත් කර ගත්තේය. මත්ස්‍යයෝ ද එක්වී ඔවුන්ගේ රජා බවට 'ආනන්ද' නම් මාළුවෙකු පත්කර ගත්තේය. මේ අතර වනයේ සිටි පක්ෂීන් එකතු වී ස්වර්ණ හංසයකු රජ බවට පත් කර ගත්තේය. පක්ෂීන්ට මේ නිසා මහත් සතුටක් දැනුණේ සිව්පා සතුන්ට වගේම, මාළුන්ට වගේම ඔවුන්ටත් රජෙකු සිටින නිසාය.

මේ ස්වර්ණ හංසයාට රූමත් දියණියක් සිටියේය. ඇය ද බැලූ බැල්මට සිත්කලු මන පිනවන තැනැත්තියක වූවාය. ඇයගේ කල දසාව හොඳ නිසා ඇයට කුමාරයකු සොයා ගැනීමට හංස රාජයා හිමාල වනයේ සිටින පක්ෂීන් සියලු දෙනාට රැස්වන ලෙස දැනුම් දුන්නේය.

මේ ආරාධනයට අනුව නොයෙක් ආකාරයේ හංසයින් මොනරුන් ආදී තරුණ පක්ෂීන් වනයේ විශාල ගල්තලාවක් මතට රැස්වූහ. එසේ රැස්වූ පසු මේ හංස රාජයා තම දියණිය ද ඒ ගල්තලාවට කැඳවීය. ඉන්පසු හංස රාජයා දියණිය අමතා...

"දියණියනි, දැන් ඔබ කැමති පරිදි ස්වාමියෙකු තෝරා ගන්න"යි කීය.

එය ඇසූ හංස දියණිය ද රැස්ව සිටි පක්ෂි සමූහය දෙස බලා මැණික් කැට මෙන් බෙල්ලක් ඇති, විසිතුරු පියාපත් ඇති මොනරෙකු දැක ඌ තම ස්වාමියා බවට පත්කර ගැනීමට කැමැත්ත පළ කළ නිසා, රැස්ව සිටි පක්ෂි සමූහයා මොනරා වෙත පැමිණ මෙසේ කීය.

"මිත්‍ර මොනරාණෙනි" මේ හංස රජුගේ දියණිය මේ තරම් පක්ෂි සමූහයා මැද තොප ස්වාමියා වශයෙන් තෝරා ගත්තේය. එබැවින් අපගේ සුබ පැතුම් පිරි නමන්නෙමු...යි කීහ.

එකෙනෙහිම අතිශය ප්‍රීති ප්‍රමෝදයට පත් තරුණ මොනරා පක්ෂි සමූහය මැද විළි බියෙන් තොරව පිල් කළඹ දිග හැර නටන්නට විය. එවිට ඔහුගේ ගුද මාර්ගය ඇතුළු පෙදෙස විවෘතව පෙනෙන්නට වීම නිසා ලැජ්ජාවට පත් හංස රජු කෝපයට පත්ව - "විළිබිය නැති මොහුට මාගේ දියණිය නොදෙන්නෙමියි සිතා පක්ෂි සමූහයා මැද තරුණ මොනරා අමතා මෙසේ කීය,

"එම්බා මොනර! තොපගේ ශබ්දය සිත්කලුය. බාහිර පෙනුමද සිත්කලුය. තොපගේ බෙල්ල දියමන්ති මැණිකක පාටට සමානය. පියාපත් සමූහය ද බඹයක් පමණ දිගය. මේ අයුරින් රූමත් වුව ද ලැජ්ජා බිය නොමැතිව නැටීම නිසා එවන්නන්ට මාගේ දියණිය නොදෙන්නෙමි...යි කියා පවසා ඒ පක්ෂි සමූහයා මධ්‍යයේම තමන්ගේ බෑණා කෙනෙකු වූ තරුණ හංසයකුට දියණිය විවාහ කර දුන්නේය.

අනතුරුව විළිබිය නැතුව නැටීම නිසා ලැබෙන්නට ගිය ලාභය අහිමි කරගත් මොනරා ලැජ්ජාවට පත්ව පලා ගියේය. හංස රජතුමා ද දියණිය විවාහ කර දී සතුටින් වාසය කර ආයු කෙළවර මිය පරලොව ගියහ. එකල විළිබිය නැතිව නැටූ මොනරා නම් මේ බහු භණ්ඩික තෙරුණුවන්ය. හංස රජ නම් තිලෝගුරු බුදුරජාණන් වහන්සේය.



## ඇසළ සඳයි දම් සිසිලයි

ගගනතට ඇසළ පුන් සඳ නැඟුනු රාත්‍රියේ
අග බිසව් මහා මායා, දුටුව ස්වප්නයේ
සග ලොවින්, ඇතු සොඬින් පියුමකින් ශාන්තියේ
මඟ කියා, මවු කුසට බෝසතුන් පැමිණියේ

ලොව පෙලන, නිමිති දැක, වේදනා නිම් නැති
බව රැහැන සිඳ දමන අරමුණක අරුමැති
තව බැඳුම් එයි නිතී සිඟිති පුතු ගැන සිතී
ඉවසුමෙන් නික්ම යයි, ඇසළ රෑ සුව ඇති

සසර කප් සුවහසක් මහා පෙරුමන් පුරා
පවර බුදු පදවි ලැබ, පිවිස බරණැස කරා
විසිර සඳ රැස ඇසළ ඉසිපතන බිම අරා
පතුරුවති මුනිඳු මල් දහම් නද ලොවුතුරා

මානයෙන් සිත් පිරුණු තීර්ථක අබිමුවේ
පාන පෙළහරින් ගන්ඩබ්බ රුක් ඉසව්වේ
සාදුකාරම එදා දෙවියනුත් පැතිරුවේ
පාන සේ සඳ දිලුනු ඇසළ පොහොයකම වේ

අපමණක් පිරිවරින් රා සිංහ රජු එදා
සුපසන්ව සියම් දෙස මහ තෙරුන් බැති පුදා
අප රටට වැඩමවා පුරා උපසම්පදා
සපත කෙරුවේ සසුනෙ බල ඇසළ පෝයදා


සියලු තුම් සඟ රුවන වස් විසුම් අරඹනා
සිය දහස් සිත් බැතින් තෙරුවනට පුද දෙනා
නිය දහම වුව සරුම මල් පලඳ පුබුදනා
පිය නඟමු ඇසළ පෝ දින බවුන් වඩමිනා

සසල මහ කෙලෙස් මල නිබඳ දෙන සෝ තැවුල
නිසල සඳ මඬල ලෙස නිවෙයි ඇති විට කුසල
නිමල මහ දම් ගඟුල පිහිනමින් විඳ සිසිල
හසළ නුවණින් සුසිල් පුරමු පොහොයෙහි ඇසළ

**මල්ලිකා රෝහණී දිසානායක**
86, නාරම්මල පාර, කටුපොත.

## බිනර පෝදා ශාසනාලෝක වැඩසටහන - 2021

ITN ශාසනාලෝක වැඩසටහන බිනර පෝදා 2021 සැප්තැම්බර් 18 වන දින දන්කොටුව කිරිමැටියාන ශ්‍රී සුධම්ම වංශාරාම මහා විහාරයේ දී සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික ආගමික හා සංස්කෘතික මණ්ඩලයේ සභාපති ලක්ෂ්මන් කෝට්ටගේ මැතිතුමාගේ දායකත්වයෙන් සාමණේර හිමිවරුන් හා දෙමාපියන් වෙත රුපියල් ලක්ෂයකට අධික පරිත්‍යාග පිරිනමන ලදි.



# සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික සමාජසේවා මණ්ඩලය කොරෝනා උවදුරෙන් මිදීම සඳහා හතරවන වතාවටත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසවලට බෙදාදෙන අවස්ථාව

2020 වර්ෂයේ දී කොරෝනා වසංගත තත්ත්වය ආරම්භ වූ අවස්ථාවේම ජාතික සමාජසේවා මණ්ඩලය විසින් මෙම වසංගත තත්ත්වය දිගුකල් පවතින රෝගයක් බවට තේරුම් ගෙන සෑම ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසයකටම චක්‍රලේඛයක් නිකුත් කරමින් එම නිවාසවල මෙන්ම එහි නිවැසියන්ගේ පිරිසිදුකම, සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රම පවත්වාගෙන යාම, ඉදිරි මාසයක පමණ කාලයක් සඳහා වියළි ආහාර රැස්කර තබාගැනීම වැනි කරුණුවලට වැඩි සැලකිල්ලක් දක්වන ලෙස උපදෙස් මාලාවක් නිකුත් කරන ලදි.

සෑම ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසයක්ම මෙම චක්‍රලේඛය අනුව ක්‍රියා කළ බැවින් ආහාර ප්‍රශ්න මෙතෙක් ඇතිවී නොමැති බව සතුටින් ප්‍රකාශ කරමු.

ජාතික සමාජසේවා මණ්ඩලය විසින් සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසයක් සඳහාම සෞඛ්‍යාරක්ෂිත භාණ්ඩ තුන් වතාවක් ලැබීමට සලස්වන ලදි.

ඒවා අතර සැනිටයිසර්, මුඛ ආවරණ, නිවාසවල සේවකයන් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල ප්‍රධාන තැනක් ගනී.


ඉන් අනතුරුව මෙම වසරේ අගෝස්තු මස නැවත වරක් ආරක්ෂිත ඇඳුම් කට්ටල, මුහුණු ආවරණ, මුඛ ආවරණ, අත් සේදුම් දියර, විෂබීජ නාශක දියර, ශරීරයේ ඔක්සිජන් ප්‍රමාණය මනිනු ලබන ඔක්සිමීටර ආදිය සෑම නිවාසයකටම යැවීමට කටයුතු යොදන ලදි.

මෙහිදී මෙම භාණ්ඩ මිලදී ගැනීම සඳහා අපමණ වෙහෙසක් දැරූ ගරු සමලේකම් දිලුම් වාහලතන්ත්‍රී මහතා වෙත ජාතික සමාජසේවා මණ්ඩලයේ ස්තූතිය පුදකරමු.



එමෙන්ම මෙම භාණ්ඩ ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසවලට බෙදාදීමේ දී ගරු සභාපතිතුමා නිවාස තුනකට පෞද්ගලිකවම ගොස් බෙදාදුන් අතර, ජාතික සමාජසේවා මණ්ඩලයේ භාණ්ඩාගාරික කසුන් ජයතිලක මහතා නිවාස දෙකකටත්, ගරු සම්ලේකම් දිලුම් වාහලතන්ත්‍රී මහතා නිවාස දෙකකටත් බෙදාදීම පිළිබඳව ජාතික සමාජසේවා මණ්ඩලයේ ස්තූතියි පුදකරමු.

මෙම භාණ්ඩ නිවාස සඳහා වෙන් කිරීමේ කටයුතු සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සමලේකම් දිලුම් වාහලතන්ත්‍රී, සමාජසේවා මණ්ඩලයේ ජාතික සමාජසේවා මණ්ඩලයේ ගරු සභාපති වසන්ත ද සිල්වා, ලේකම් නන්ද මිගුන්තැන්න, භාණ්ඩාගාරික කසුන් ජයතිලක යන මහත්වරුන් විසින් සිදුකළ අවස්ථාව.



# නිදාවැටී සිටි ජාතිය අවදි කළ අනගාරික ධර්මපාලතුමා

**ශාස්ත්‍රපති ලොකු බණ්ඩාර මුණසිංහ**
(මුළු දිවයිනටම සාමවිනිසුරු)

අප බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලැබූ පින්බිම බුද්ධගයාව අන්‍යාගමිකයන්ගෙන් මහා සටනක් කර බෞද්ධ ජනතාවට වන්දනාමාන කරන්නට බේරා දී බරණැස ඉසිපතනයේ නව මූලග න්ධකුටි විහාරය ඉදිකරවා බෞද්ධයන්ට දඹදිව සිද්ධස්ථාන වන්දනාවට ඉඩ සලසා දුන් ශ්‍රීමත් අනගාරික ධර්මපාල උතුමාණන්ගේ 57 වැනි ජන්ම දිනය නිමිත්තෙනි.

"සිංහල ජාතිය වෙනුවෙන් දිවි පුදන්නට මම සැරසී සිටිමි. මගේ රට, මගේ ජාතිය, මගේ ආගම, මගේ භාෂාව යන රත්න හතරක් මට තියෙනවා. ඒ රත්න හතර ආරක්ෂා කිරීම භාර ගැනීම මගේ යුතුකමයි. සිංහල බෞද්ධ දරුවනි, දිවි යහන් බොරුවක් නොකියන්නට අධිෂ්ඨාන කරගනිමු.

දිවා රෑ දෙකේහිම සිංහලයන් වීර්යය කළහොත් රට තුළ සිංහල ජාතිය දියුණු අඩියකට පමුණුවාගත හැකිය. එබැවින් සිංහලයෙනි වීර්යයෙන් කටයුතු කරව. සිංහලයින්ට විෂ මත්පැන් බොන්න දී සිංහලයන් නැති කළ සුද්දා අපේ පරම්පරා හතුරෙකු ලෙස මම සලකමි. වරද දුටු තැන පෙන්නාදීම මගේ ගතියයි. මගේ අවවාද පිළි ගැනීමට අසතුටු නම් ඒ බව දැන්වූ විට මට වෙන රටකට ගොස් සිටිය හැකි යැයි අපේ රට, ජාතිය, ආගම වෙනුවෙන් මහත් සේවයක් කළ අනගාරික ධර්මපාලතුමා එදා මේ රට ගොඩගැනීමේ උත්සාහයක යෙදුණු අයුරුයි ඒ.

බුදු දහම පිරිහුණු, සිංහල සිරිත් විරිත් පිරිහුණු, අධ්‍යාපනය පිරිහුණු, ජාතිකාභිමානය හීන වූ යුගයක, හරිහමං සිංහලයවත් නොදත් බොහෝ දෙනා ඉංග්‍රීසි නොදැන ගන්නත් ඉංග්‍රීසියෙන් අත්සන් කිරීමට පෙලඹුණහ. ඉංග්‍රීසි පාලනයේ නිවටයන් වී සිටි යුගයක ජාතික ආගමික හැඟීම් පුබුදුවා ඔවුන් නින්දෙන් අවදි කිරීමට වීරයෙක් සිංහලයින් අතරින් උන්නේය. ඒ වීරයා නම් අනගාරික ධර්මපාලතුමාය.

1864 සැප්තැම්බර් 17 වන දින උපත ලද මේ වීරයාගේ මුල් නම වූයේ දොන් ඩේවිඩ් හේවාවිතාරණයි. එතුමාගේ පියා මාතර හීන්තැටියේ දොන් කරෝලිස් හේවාවිතාරණ මුදලිගේය. මව මල්ලිකා හේවාවිතාරණ ළමාතැනීය. මේ පිරිස (පවුල) පදිංචි වී සිටියේ කොළඹ කොටහේන ප්‍රදේශයේය.

ඒ කාලයේ අද වාගේ රජයේ පාසල් හෝ බෞද්ධ පාසල් නොතිබුණු යුගයක ඩේවිඩ් හේවාවිතාරණට ඉගෙනීමට සිදුවූයේ ක්‍රිස්තියානි පාසල්වලය. දෙමටගොඩ බැප්ටිස්ට් සිංහල පාසලෙන් ඉගෙනීම

ආරම්භ කරමින් ඔහු පිළිවෙළින් කොටහේනේ ශාන්ත බෙනඩික්ට් විද්‍යාලය, කෝට්ටේ ක්‍රිස්තු විද්‍යාලය යන පාසල්වල දී ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලැබීය. මෙම පාසල්වල ක්‍රිස්තු ධර්මය අනිවාර්යය විෂයක් විය.

මෙම පාසල්වල අධ්‍යාපනය ලබන ගමන් ඩේවිඩ් හේවාවිතාරණ ශිෂ්‍යයා කොළඹ විද්‍යෝදය පරිවේණාධිපති හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන්ගෙන් සිංහල, පාලි හා බුදු දහම ඉගෙන ගැනීම තුළින් තම දැනුම වර්ධනය කරගනිමින් ජීවිතයට ආලෝකය ලබා ගත්තේය.

1878 දී හේවාවිතාරණ ශිෂ්‍යයා උසස් අධ්‍යාපනය සඳහා ගල්කිස්සේ ශාන්ත තෝමස් විද්‍යාලයට ඇතුළු විය. ඉගෙනීමේ ඉතා දක්ෂයෙකු වූ මොහු එහි දී අනිවාර්යය විෂයක් වූ බයිබල් පාඩමෙන් හැම වරම පළමුවෙනියා විය. පසු කාලයේ දී එතුමාගේ කටයුතු සාර්ථක වීමට එක් හේතුවක් වූයේ බුදු දහමත්, කිතු දහමත්, ඉංග්‍රීසියත්, එතුමා මැනවින් දැනගෙන සිටීමයි. තව ද එතුමා පාසල් කාලයේ සිටම දක්ෂ කථිකයෙක් බවට පත්ව සිටියේය.

මේ සමයේ දී බෞද්ධයන් හා ක්‍රිස්තු භක්තිකයන් අතර 'පානදුරාවාදය' නම් ආගමික වාදයකට සම්බන්ධ වී සිටියේ ය. මෙම වාදයේ බෞද්ධ පක්ෂයේ නායකත්වය ගෙන කටයුතු කළේ වාදීභසිංහ මිගෙට්ටුවත්තේ හිමිපාණන්ය. ඒ හිමියන්ගේ ඇසුර ලබාගෙන සිටි හේවාවිතාරණ ශිෂ්‍යයා පානදුරාවාදය නැරඹීමට ගියේය. මේ සමයේ දී ශ්‍රී ලංකාව ගැන පළවූ වාර්තා කියැවූ අමෙරිකන් ජාතික කර්නල් හෙන්රිතුමා දිවයිනේ ධර්ම ප්‍රචාරක කටයුතු ආරම්භ කර තිබුණි ඕල්කොට්තුමාගේ ඉංග්‍රීසි කතා සිංහලයට පරිවර්තනය කළේ අනගාරික ධර්මපාලතුමාය. දක්ෂ කථිකයෙකු වූ එතුමා ද ජාතික සිරිත් විරිත් හා සිංහල ආර්ය නම් භාවිත කිරීමේ අගය පහදා දෙමින් කතා පැවැත්වීය.

අනගාරික ධර්මපාලතුමාගේ කතාවලින් බොහෝ විට සිංහලයන්ගේ නිවට ගති හා උදාසීනකම් නිග්‍රහයට ලක් විය. සමහර විට එතුමා වැරදි හා නිවටකම් දුටු තැන බැණ වැදුණේය. කොයි තරම් ලොකු මුදලි මුහන්දිරම් කෙනෙකු වුවත් ඔහු පරගැතියකු නම්, එසේම කුසීත කම්මැලි නම් එතුමා ඔහුට නිර්දය ලෙස පහර දුන්නේය. එතුමා දුටු දෙයක් පිළිබඳව එකල ප්‍රචාරය වූ සිංහල බෞද්ධයා පත්‍රයේ පළ වී තිබූ කථාවක් සඳහන් කරමි.

"දිවා ආහාරය ගෙන විවේක ගන්නා දෙමළ රික්ෂෝකාරයා මොකද කරන්නේ. තමන් ඇදගෙන යන රික්ෂෝවට හේත්තුවී පුවත් පතක් හඬ නඟා කියවනවා. උගේ ජාතියේ අනෙක් උදවිය ඌ වටකර ගෙන එයට කන්දී අසා සිටිනවා. අපේ සිංහල ගොන්තඩියා මොකද කරන්නේ. එක්කෝ රා බොනවා - නැත්නම් සූදු කෙළිනවා. ඒත් නැත්නම් දෙදණ තුරුල් කරගෙන බුරු ඇඳක නිදි."

"සිංහලයන්ගේ කුසීතකම ගැන එතුමා නිතර දෝෂාරෝපණය කළේය. අපේ මිනිසුන්ගේ වැඩේ කෑමයි-බීමයි නිදාගැනීමයිනේ. ඉතින් කොහොමද දියුණු වෙන්නේ? දේශීය කර්මාන්ත නඟා සිටුවීමට කටයුතු කළ එතුමා පිටරට භාණ්ඩ ගෙන්වීමට විරුද්ධ විය. මෙරට කර්මාන්ත නඟා සිටුවීම සඳහා විශේෂඥ පුහුණුව ලද අය අවශ්‍ය වුවත්, ජාතික අවශ්‍යතාව තම රටින් සපුරා ගත යුතු බව පෙන්වා දුන්නේය.

එතුමා එකල පවත්වා ගෙන ගිය අමද්‍යප සටනේ දී පතාක යෝධයකු විය. ගව මස් කෑමට එතුමා තදින් විරුද්ධ විය. එතුමාගේ ප්‍රචාරක රථයේ 'හරක් මස් නොකනු' යන පාඨය ප්‍රදර්ශනය කරන ලදී. හරක් මස් කන්නන්, රා බොන්නන් ධර්මපාලතුමා සැලකුවේ වසලයන් මෙන්ය.

1915 දී - සිංහල මුස්ලිම් අරගලය ඇති විය. එහි ප්‍රතිඵලය වශයෙන් ඉංග්‍රීසි ආණ්ඩුව සිංහල නායකයින් සිරභාරයට ගත්තේය. එකල අනගාරික ධර්මපාලතුමා සිටියේ ඉන්දියාවේය. එහිදී සිරභාරයට පත් එතුමා අවුරුදු හතක් නිවාස අඩස්සියේ වෙසෙමින් එම කාලය ආගමික කටයුතුවලට යෙදවීය.

1931 දී නැවත ඉන්දියාවට ගිය එතුමා එහි ආරම්භ කළ මූලගන්ධ කුටි විහාරයේ දී සිරි දේවමිත්ත නමින් පැවිදි වී 1932 දී උපසම්පදාව ලැබීය. ඒ වන විට එතුමා රෝගාතුරව පසුවූ අතර 1933 අප්‍රියෙල් 29 දින අපවත් වූහ. බුදු දහම ලෝකයේ ප්‍රචාරය කිරීම පිණිස තවත් විසිපස් වතාවක් උපදීවා යැයි එතුමා ප්‍රාර්ථනා කළ බව ද කියැවේ.



# අනිච්ජා වත සංඛාරා!

**පූජ්‍ය මීදෙණියේ ධම්මවංස හිමි**
(බෞද්ධ දර්ශනය විශේෂවේදී විද්‍යාර්ථී - කැලණිය විශ්වවිද්‍යාලය)

'අනිච්ජා වත සංඛාරා' නම් පාඨය නෙත ගැටීමෙන්ම හෝ කන වැකීමෙන් ම පමණක් අප සිත් තුළ ජනිත වන්නේ ඉතා බියකරු හැඟීමකි. ඒ පිළිබඳ තත්ත්වාකාරයෙන් නොදැනීම ඊට හේතුව වන අතර, එම නොදැනීම අප ලද අතිමහත් අභාග්‍යයක් බව කිවමනාය. මෙම ලිපියෙහි අරමුණ වන්නේ නිර්වාණය පිළිබඳ ගුණ වැනීමක් නොවන අතර, ලොව පවත්නා උත්තරීතරම සංකල්පය, පර්යේෂණය මෙන් ම ඉගැන්වීම පිළිබඳ පාඨක ඔබ තුළ යම් අදහසක් තැන්පත් කරලීමයි. එම උත්තරීතර සංකල්පය, පර්යේෂණය හා ඉගැන්වීම අනෙකක් නොව, ඔබ අප ඉතා හොඳින් අසා පුරුදු අනිත්‍යතාව වන අතර ලොව පවත්නා කිසිවක් ස්ථිර හෙවත් සාදාකාලික නොවනු, නිරතුරුව ම අතොරක් නැතිව වෙනසට ලක්ව පවතිමින් විනාශය කරා එළැඹෙන බව පසක් කරන උත්තරීතර ඉගැන්වීමයි.

නූතන විද්‍යාව ගරු කරන සමාජයක් තුළ ඒ අනුව ගත් විට විද්‍යාඥයන් සිදු කරන්නේ කිසියම් නියැදියක් හෙවත් ආදර්ශයක් (sample) පිළිබඳ පරීක්ෂණ හා නිරීක්ෂණ හා අත්හදා බැලීම් ඔස්සේ ඒ පිළිබඳ නිගමනයන් ඉදිරිපත් කිරීමයි. විද්‍යා විෂය ලොව ඇති වීමටත් පෙරාතුව බුදුරජාණන් වහන්සේ ඒ අයුරින් තම නිගමනයන් ඉදිරිපත් කොට ඇත. එසේ ඉදිරිපත් කළ එක්තරා සුවිශේෂී නිගමනයක් නම් 'අනිච්ජා වත සංඛාරා' යන්නයි. මීට අමතරව 'සබ්බං පහාය ගමනීයං', 'ආරෝග්‍යා පරමා ලාභා' හා 'මනො පුබ්බංගමා ධම්මා' යනාදිය ද බුදුරජාණන් වහන්සේ විසින් ඉදිරිපත් කළ විද්‍යාවේ කුළුගෙඩි පහරවල්වලින් පවා කිසිදා දෙදරා නොයන නිගමනයන් වේ.

අනිත්‍යතාව නම් පරම පර්යේෂණය සිදු කරනු වස් ගෞතම ගෝත්‍රයෙහි ශාක්‍යය වංශයෙහි ඔක්කාක රාජ පරම්පරාවෙහි උපන් සැබෑ මානව හිතවාදියා

වූ සිදුහත් කුමාරයා ලෞකික ජීවිතයෙහි ඉහළ ම පදවිය වන සක්විති රාජ සම්පත්තිය ඇතුළු සියලු සැප සම්පත්තීන් අතැර වනගත වූහ. එහිදී උන්වහන්සේ සිදු කළ රූක්ෂ මූලයට වී දෑස් වසාගෙන භාවනා කිරීම ම නොවන අතර, සාමාන්‍ය පුද්ගලයෙකුට වඩා වෙනස් ම අයුරකින් ප්‍රඥා ඇස විහිදුවමින් ලෝකය පිළිබඳ සුපරික්ෂාකාරී ව අධ්‍යයනය කිරීමයි. ඒ අනුව තමන් වහන්සේ අභිමුඛයෙහි ඇති තුරුලතාවන්හි පිපී ඇති මල් දෙස උන්වහන්සේ බලා සිටියහ.

ඒවා ක්‍රමයෙන් පිපී පරව ගොස් නටුවෙන් බිමට වැටී විනාශ වන අකාරය උන්වහන්සේ දුටුවාහ.

තුරුලතාවන්හි ඇති කොළ සමූහය ළා කොළ පාට දල්ලෙන් ඇරඹ අනුක්‍රමයෙන් වැඩෙමින් මෝරමින් අවපැහැ ගැන්වෙමින් බිමට වැටී එම ගස්වැල්වලට ම පොහොර වී විනාශයට යන ආකාරයත් නැවත කොළ දළුලමින් ඒවාට ද එම ඉරණම ම අත් වන ආකාරය නිරීක්ෂණය කළහ. මේ අයුරින් ම අළුයම නැගෙන හිරු සන්ධ්‍යා කාලයෙහි බැස ගොස් නැවතත් අලුයම පැමිණීම, උදෑසන ගෙවීමෙන් දහවලත්, දහවල ගෙවී සන්ධ්‍යාවත්, සන්ධ්‍යාව ගෙවී රාත්‍රියත්, රාත්‍රිය ගෙවී නැවතත් උදෑසන එළඹෙන ආකාරයත් දැක්කාහ. කිසිඳු විටෙක ඒකාකාරී ව නොතිබෙන මහා ඝණ වලාකුළු දෙස බැලූහ. වනාන්තරයෙහි උපත ලබන සතුන් ක්‍රමක්‍රමයෙන් වර්ධනය වී කාලයක් ජීවත්ව සිට මිය යන ආකාරය දුටුවාහ. සියල්ල විනාශ වන බවත්, විනාශ වන තුරු වෙනසට ලක්වෙමින් පවතින ආකාරයත් අවබෝධ කරගත්හ. මෙවැනි නියැදීන් පිළිබඳ මනා පරීක්ෂණ හා නිරීක්ෂණ ඔස්සේ සත්‍ය අවබෝධ කොටගෙන ලොවුතුරා බුද්ධත්වයට පත් වූ උන්වහන්සේ තම නිගමනය ඉදිරිපත් කළහ. එනම්, ‘සබ්බෙ සංඛාරා අනිච්ඡා’ යන්නයි. මෙතුළින් පෙනී යන තවත් ඉතා සුවිශේෂී කරුණක් ඇත. එනම්, ස්වභාව ධර්මය වනාහි අනිත්‍යතාව සම්බන්ධයෙන් ඉතා අනඟි පාඩම් උගන්වන බවයි. අනිත්‍යතාව යනු ලෝකය හා සම්බන්ධ පරම සත්‍යය මිස බෞද්ධයන්ට පමණක් උරුම වූ සත්‍යයක් නොවේ. බුදුසමය වනාහි විශ්වීය වූ දහමක් වන්නේ ඒ හෙයිනි. බෞද්ධයන්ට පමණක් දේශනා කොට ඇති කරුණක් ලෙස වටහා ගනිමින් ක්‍රියා කිරීම අතිශයින් අමනෝඥ ක්‍රියාවකි.

බුදුරජාණන් වහන්සේගේ ධර්මය පදනම් කොට ඒ අනුව හැසිරෙන්නන් හා ජන්ම පත්‍රිකාවෙහි බෞද්ධ ලෙස සඳහන්ව ඇති පිරිස ව්‍යවහාරික වශයෙන් බෞද්ධයන් ලෙස හැඳින්වුව ද බුදුරජාණන් වහන්සේ ඒ නයින් බෞද්ධ නොවේ.

බුදුදහම අශුභවාදී දර්ශනයක් ලෙස ඇතැමුන් අදහස් දක්වන්නේ ද මෙම අනිත්‍ය සංකල්පය ඉවහල් කොට ගෙනය. ඊට හේතුව වන්නේ ඔවුන් තත්ත්වාකාරයෙන් ඒ පිළිබඳ නොදැනීමයි. කරුණු පිළිබඳ මනා අධ්‍යයනයකින් තොර ව ගනු ලබන තීන්දු තීරණවලින් සිදුවන්නේ පුද්ගලයා අගාධයට පතිතවීමයි. බුදුරජාණන් වහන්සේ සිදු කොට ඇත්තේ ඇත්ත ඇති සැටියෙන් දේශනා කිරීමකි. ලොව පවත්නා ජීවී හා අජීවී සියල්ල අනිත්‍ය හෙවත් ස්ථිර නොවන කල්හි එය එසේ නොවන වග දේශනා කිරීමට උන්වහන්සේට නොහැකිය. ලොව පවත්නා පරම සත්‍යය එය වන විට ඒ බැව් ඒ අයුරින් ම ප්‍රකාශ කිරීම හැර වෙනත් විකල්ප මාර්ගයක් අනුදැනීම බුදුසමය තුළින් කිසිසේත් බලාපොරොත්තු නොවිය යුත්තකි. බුදුසමය අශුභවාදයක් නොවී යථාර්ථවාදයක් වන්නේ ද එබැවිනි.

ජෝන් ඩෝල්ටන් (John Dalton, 1766 - 1844) නම් විද්‍යාඥයා විසින් ලොව පවත්නා සියලු දෑ විශ්ලේෂණය කරමින් යන විට තවදුරටත් බෙදිය නොහැකි කුඩාම අංශුවකට බෙදෙන බවත්, එය පරම අණුව හෙවත් පරමාණුව (Atom) ලෙසත් දැක්වීය). මින් අදහස් වන්නේ පරමාණුව යනු විනාශයට ලක් නොවන නිත්‍ය පදාර්ථයක් බවයි). මේ හේතුවත් සමඟ බුදුසමයේ එන අනිත්‍ය සංකල්පය පසෙකට විසිකරමින් බොහෝ දෙනා ඩෝල්ටන් සරණ යන්නට වූහ). එතැන් සිට කාලයක් ගෙවීයත් ම ඩෝල්ටන්ගේ ම ගෝලයන් වන රොබට් ඩී. රූපට් (Robert D. Rupert), පීටර් මිලිකන් (Peter Millican) හා ජේ.ජේ. තොම්සන් (J.J. Thomsan) යනාදීහු පරමාණුව පිළිබඳව තම ගුරුවරයා වූ ඩෝල්ටන්ගේ නිගමනය ඛණ්ඩණය කරමින් පරමාණුව ද ඉලෙක්ට්‍රෝන (Electron), ප්‍රෝටෝන (Proton) හා න්‍යුට්‍රෝන (Neutron) වැනි ඉතා කුඩා අංශූන්ට බෙදිය හැකි බව අවධාරණය කළහ. මේ අනුව පරමාණුව යනු නිත්‍යය නොවන,

වෙනස් වෙමින් පවතින අංශුවක් බව ඔව්හු නිගමනය කළහ. අනිත්‍යතාව හෙවත් සියල්ල වෙනස් වීම යනු අකාලික වූ අවිපරීත ධර්මතාවක් බව වැඩිදුරටත් මේ අනුව පැහැදිලි වේ.

බුද්ධ දේශනාවන් සංස්කෘතිමය වශයෙන් ගත් කල්හි ඊට බිය ඇති වේ. නිදසුනක් ලෙස 'අනිච්චා වත සංඛාරා' යන බුදු වදන අප බහුල ලෙස දකින්නේ අවමංගල්‍යය උත්සවයන්හි මාර්ගවල දමා ඇති කොඩිවල, පරිසරය අපවිත්‍ර වන පරිදි විදුලි කණුවල හා තාප්පයන්හි අලවා ඇති දැන්වීම්වලිනි.

> අවුරුදු අසූවක් 80 ආයු වැළඳීමට සමත් ව මෙලොව උපදින යම් මිනිසෙක් වේ ද හෙතෙම සෑම තත්පරයක්, මිනිත්තුවක්, පැයක්, දවසක්, සතියක්, මාසයක් හා අවුරුද්දක් පාසා මොහොතින් මොහොත මරණය කරා නොහොත් අනිත්‍යයතාව කරා එළඹේ. කිසිම අයුරකින් ආයුෂ ගෙවීමක් මිස වර්ධනයක් බලාපොරොත්තු විය නොහැකිය.

මෙපරිද්දෙන් අනිත්‍යතාව නම් ප්‍රායෝගික සංකල්පය අවමංගල්‍යය කටයුතුවලට පමණක් සීමා කොට අගුලු දමා ඇත. එම සීමාවෙන් එහා ඒ පිළිබඳ සිතීමට නොපෙලඹෙන අතර, ඒ සඳහා අනවශ්‍ය බියක් සිත්හි මවා ඇත.

කොටින් ම කියතොත් යමෙක් මිය ගිය කල්හි 'මැරුණා' යැයි කීමට ද අපි බිය වෙමු. ඒ සඳහා අන්ත්‍රා වුණා, කළුරිය කළා, අභාවප්‍රාප්ත වුණා, නැති වුණා, මියපරලොව ගියා, දිවංගත වුණා, නැසී ගියා, වියෝ වුණා හා සදහට ම වෙන් වුණා වැනි වචන භාවිත කෙරේ. අනිත්‍යය යන සංකල්පය පිළිබඳ මිනිසුන් කෙතරම් නම් බියක් ද යන්න පිළිබඳ මෙය කදිම සාක්ෂ්‍යයකි. රථ වාහන හා නිවෙස්වල යම් යම් අරුත්බර හා අරුත්බර නොවූ වැකි ප්‍රදර්ශනය කොට තිබීම සුලභ කරුණකි. ඒවායෙහි වුව ද අනිත්‍යතාව අරුත් ගන්වන 'වයධම්මා සංඛාරා', 'සබ්බෙ සංඛාරා අනිච්චා' හා 'සබ්බං පහාය ගමනීයං' වැනි වදන් දක්නට නැති තරම්ය. අනිත්‍යතාව පිළිබඳ නිසියාකාර ව නොදන්නා බව ඊට හේතුවයි. එය ප්‍රායෝගික ව තම ජීවන දර්ශනයට එක් කර ගැනීමෙන් තමාට මෙන් ම අනුන්ට අත්වන ප්‍රතිලාභයන් පිළිබඳ පුද්ගලයා විමසිලිමත් විය යුතු වේ. සියලු දෑ නැති වන බව අවබෝධ කරගත් විට සිතට අප්‍රමාණ සැනසීමක් ලැබෙන්නේ සියලු දෑ නැතිවන විට සිතට දුකක් ඇති නොවන හෙයිනි.

තමාගේ යැයි බැඳී සිටිනා තරමට දුක ද සාපේක්ෂ වේ. කිසියම් පුද්ගලයෙක් තමාට කිසි සබඳතාවක් නොමැති අයෙක් මරණයට පත්වීමෙන් ඔහුට කිසිඳු දුකක් ඇති නොවේ. ස්වග්‍රාමයෙහි යම්තාක් දුර සබඳතාවක් ඇති අයෙක් මිය ගියේ නම් යම් ප්‍රමාණයක් දුකක් ඇති වේ. එමෙන් ම තම පවුලෙහි ඥාතියෙකු මිය ගිය කල ගම්වැසියා පිළිබඳ ඇති වූ දුකට වඩා වැඩි දුකක් ඇති වන අතර, තම පවුලේ ම පුද්ගලයෙකු හෙවත් අම්මා, තාත්තා, සහෝදරයා, සහෝදරිය, බිරිඳ, ස්වාමියා හා දරුවන් වැනි සමීපතම ආදරණීයයන් මියගිය විට වචනයට පෙරළිය නොහැකි මෙන් ම දැරිය නොහැකි අප්‍රමාණ වූ දුකක් ඇති වේ. ඒ බැඳීමේ ස්වභාවය අනුවය. තව ද එක්වීම සිදුවන මොහොතෙහි ම වෙන්වීම සනිටුහන් කොට ඇත. ගිහි සමාජයෙහි ඇති බැඳීම් අවබෝධයෙන් යුක්ත ව ඉදිරියට ගෙන යා යුතුය. කිසියම් වූ දිනක තම ආදරණීයයන් තමන්ගෙන් වෙන්ව යන බව වටහා ගෙන ජීවත් විය යුතුය. අනිත්‍යතාව පිළිබඳ සවිඥ්ඥාණික නම් මෙහි දී ඇති වන දුක තුනී කර ගැනීමට අපට හැකි වේ.

ලොව පවත්නා සියලු දෑ නිරතුරු ව ම ගමන් කරන්නේ අවසානය කරාය. කිසිවක් සදාකාලික පැවැත්ම කෙරේ ගමන් නොකරයි. ඔබ කියවන මෙම ලිපිය ද අනුක්‍රමයෙන් නිෂ්ටාව කරා ළඟා වේ. අපගේ ජීවිතය ද එසේ මය. අවුරුදු අසූවක් (80 ආයු වැළඳීමට සමත් ව මෙලොව උපදින යම් මිනිසෙක් වේ ද හෙතෙම සෑම තත්පරයක්, මිනිත්තුවක්, පැයක්, දවසක්, සතියක්, මාසයක් හා අවුරුද්දක් පාසා මොහොතින් මොහොත මරණය කරා නොහොත් අනිත්‍යයතාව කරා එළඹේ. කිසිම අයුරකින් ආයුෂ ගෙවීමක් මිස වර්ධනයක්

බලාපොරොත්තු විය නොහැකිය. බාල, තරුණ හා මහලු ආදී වශයෙන් ජීවිතයෙහි අවස්ථාවන් බෙදා සිටින අතර, තුරුණු විය ජීවිතයෙහි හොඳම කාලය ලෙස අපි සිතමු. ශරීරය ලස්සන කිරීමට නොයෙක් දෑ සිදුකරමු.

අන්‍යයන්ට වඩා තමා ලස්සන යැයි සිතමින් උඩඟුව වසමු. නොදැනීම නිසා දක්නා දේ ම සත්‍යය ලෙස දකිමින් එහි ඇලී ගැලී මුසපත් වන්නෙමු. අතොරක් නැති ව වෙනසට ලක්වන සිරුරෙහි මෙම තුරුණු වියද අනිත්‍යයතාවේ ම එක් අදියරක් බව සිතීමට නොපෙළඹෙමු. පෙම්වතුන් හා පෙම්වතියන් ආදී වශයෙන් බැඳී අන්‍යෝන්‍ය වශයෙන් සිරුරට වසඟ වී රාගයෙන් උමතුව සිටීමටත් තම අභිමතය පරිදි කටයතු සිදු නොවීමෙන් කලකෝලාහල, මිනීමැරුම් වැනි අනුවණ දෑ සිදු කිරීමටත් පුද්ගලයා පෙලඹෙන්නේ අනිත්‍යතාව හෙවත් වෙනස් වීම යන ධර්මතාව ප්‍රගුණ නොකරන හෙයිනි. තව ද වක්කලී හිමියන් විසින් රැයක්, දවාලක් නොමැති ව භාග්‍යවතුන් වසන්සේගේ ශරීර සෝභාව දෙස බලා සිටිද්දී උන්වහන්සේ දේශනා කළේ තමන් වහන්සේගේ කුණු ශරීරය දෙස නො බලන ලෙසයි.

එක්තරා මලක ආයු කාලය දින තිහක් (30) හෙවත් මසක් නම් එය පරවීමට පටන් ගත්තේ කවරදා සිටදැයි යන පැනයට පිළිතුරු ලෙස දවස් දහයකට, විස්සකට පසුව ආදී වශයෙන් නිශ්චිත ව කිව නොහැක. සත්‍යය පරිදි සිදුව ඇත්තේ මල පිපුණු දා සිට පරවීමයි. ඒ අනුව මලෙහි ආයු කාලය මල පර වූ කාලයට සමානය.

අපගේ ජීවිත ද එවැනිය. ඉපදුණු දා සිට මරණයට පත්වන තුරු වෙනස් වේ හෙවත් අනිත්‍යතාවට ගොදුරු වේ.

'අනව්හාතො ඉතො ආග අනනුඤ්ඤාතො ඉතො ගතො' යන බුදු වදනට අනුව තම මව, පියා ඇතුළු කිසිවෙකුගේ ආරාධනාවක් නොමැතිව අපි මිනිස් ලෝකයට චිත් මවු කුසක ප්‍රතිසන්ධිය ලද්දෙමු. අපි මරණය කරා යන මොහොත වන විට ද කිසිවෙකුගේ ආරාධනාවක් නොමැති ව මරණය කරා යන්නෙමු. මිනිස් ලොව ඉපිද ජීවත් ව සිට මිය යෑම යනු බස් රථයකට ගොඩ වී නික්ම යෑම හා සමානය. කොළඹ සිට නුවර බලා ධාවනය වන බස් රථයකට බොහෝ මිනිසුන් ගොඩ වූ පසු බසය ගමන් ගන්නා විට පිරිසක් නිට්ටඹුවෙන් ද, පිරිසක් වරකාපොළින් ද, පිරිසක් කෑගල්ලෙන් ද, තවත් පිරිසක් නුවරින් ද වශයෙන් එකිනෙකාට අවශ්‍ය පරිදි බසයෙන් බැස තමාගේ ගමන යනු ලබයි. බස් රථයට ගොඩ වීමට කිසිවෙකු අපට ආරාධනා නොකරන අතර, බසයෙන් බැසීමට ද ආරාධනා නොකරයි. නමුත් අප සියල්ලෝ ම සිටින්නේ එක ම බස් රථයේ ය. ඒ අනුව යමෙක් මිය යෑම යනු ඉන්නා බස් රථයෙන් බැස තමන්ගේ ගමන යෑම පිණිස තවත් බසයකට ගොඩවීම මෙනි. එනම්, වෙනත් භවයක තවත් ජීවිතයක් කරා ළඟා වීමයි.

අද වන විට බොහෝ ගැටලුවලට හේතුව ද අනිත්‍ය සංකල්පය පිළිබඳ මනාව නොදැනීමයි.

දනිතත් ඒ පිළිබඳ ප්‍රායෝගිකත්වයක් නොමැතිකමයි. සියල්ල වෙනස් වන වග අවබෝධ කරගත් විට තණ්හාවෙන් වස්තු සම්පත් පොදි බැඳීම ද, එකෙකු පරයමින් තවකෙකු නැඟී සිටීම හා මනුෂ්‍යත්වය නොඅදහන යන්ත්‍ර සූත්‍ර වැනි සිත් ඇති තරගකාරී සමාජ රටාවක් උද්ගත නොවනු ඇත. තමාට අහිමිවන බිම් අඟල ගැන සිතමින් ඒ පිළිබඳව කලකෝලාහල කොට මිනීමැරුම් දක්වා ගැටුම් දුරදිග යන්නේ මෙම තත්ත්වය මතය. සෑම පොහොයකට ම සිල් ගන්නා උවසු උවැසියන් තුළ ද මේ තත්ත්වය බහුලව දක්නට ඇත. ඇතැමුන් ජාතිවාදය, ආගම්වාදය හා කුලවාදය පතුරුවමින් තමන් ඇතුළු තම පාර්ශ්වයන් පමණක් ජීවත් විය යුතු බව සිතමින් කටයුතු කරන්නේ ඔවුන් සදාකාලික වේයැයි සිහිනෙන් හෝ සිතනවා විය හැකි බැවිනි.

සජීවී මෙන් ම අජීවී සියලු දෑ සමඟ අනිත්‍යතාව නම් මෙම පරම සත්‍ය බැඳී පවතී. එය තේරුම් ගැනීමට උගත්කම හෝ ශරීර ශක්තිය වැදගත් නොවන අතර, අවශ්‍ය වන්නේ ප්‍රඥාවයි. උගත්කම අවශ්‍යවන්නේ විභාග සමත්වීමටය. උගතුන් වනාහි ප්‍රඥාවන්තයින් නම් ආචාර්ය, මහාචාර්යවරු සියල්ලෝ ම නිවන් දැක තිබිය යුතුය. ඒ අනුව සමාජය පිළිකුල් කරන තිත්ත ම ඇත්ත අනිත්‍යතාව වේ.

නමුත් මේ පිළිබඳ තත්ත්වාකාරයෙන් වටහා ගතහොත් එය තිත්ත ම ඇත්ත නොවී සුමිහිරි ම ඇත්ත වනු ඇත.



# පරිසරය හා මානවයා

**ශාස්ත්‍රවේදී චන්ද්‍රසිරි වැලිගමගේ**

වසර මිලියන දෙකක පමණ මානව ඉතිහාසයේ භෞතික වශයෙන් මානවයා අත්කර ගත් උසස්ම අවධිය ලෙසින් විද්වත්හු වත්මන් විසි එක් වෙනි (21) සියවස සලකති. විද්‍යා තාක්ෂණික ක්ෂේත්‍රයේ මිනිසා අත්කර ගත් සුවිශේෂ ජයග්‍රහණ ඊට සෘජුවම දායක වී තිබේ.

නමුත්, බොහෝ විද්වතුන් ඒ ආකාරයට මානව සමාජයේ උසස්ම අවධිය ලෙසින් අර්ථකථනය කරන විසි එක්වෙනි සියවස තුළ මානවයාගේ පැවැත්මට බරපතළ අභියෝග එල්ල වී තිබීමත් සුවිශේෂ කාරණයකි. එහෙයින් බලන කල මානව සමාජයේ පැවැත්මට ඉතිහාසයේ අන් කවරදාවත් එල්ල නොවුණු ආකාරයේ බිහිසුණු අභියෝග එල්ල වී ඇත්නම් එවැනි යුගයක් උසස්තම අවධිය යැයි කිව හැක්කේ කෙසේද යන ප්‍රශ්නයක් කෙනෙකු තුළ මතුවීම සාධාරණය.

මානවයාගේ සම්භවයට පෙර වසර ලක්ෂ හැටකට (60) පෙර දී ග්‍රාහකයක් පෘථිවියේ ගැටී නිර්මාණය වූ ශීත යුගය නැතහොත් අඛණ්ඩ ශීත සෘතුව ඩයිනෝසර්ලා මිහි මතින් තුරන් කිරීමට හේතු වූ බවට විද්‍යාඥයෝ විශ්වාස කරති. ඒ බිහිසුණු යුගයෙන් පසුව වසර ලක්ෂ හතළිහක් පමණ ගතවෙද්දී මානව සම්භවය නැතහොත් මානව පරිණාමයේ ඇරඹුම සිදුවූ බවට විශ්වාස කෙරේ. එහෙත්, ඉන් අනතුරුව ක්‍රි.පූ. දහදාහේ (10,000) දී ලොව උතුරුකරයේ අයිස් යුගය නිමාවීම නිසා භූගෝලීය වශයෙන් සිදු වූ සුවිශේෂ වෙනස්කම් මෙන්ම මානව ජනාවාසකරණය පුළුල් වීමටත් හේතු කාරක වී තිබේ.

මානව සම්භවය සිදුවීමෙන් අනතුරුව මිනිසාගේ පැවැත්මට තීරණාත්මක ආකාරයෙන් බලපෑ ස්වභාවික පාරිසරික හෝ මානවීය සංසිද්ධියක්



පිළිබඳව ගෙවී ගිය වසර ලක්ෂ විස්සක කාලය තුළ දැක - දැනගන්ට මෙතෙක් ලැබී නොමැති වීමත් සුවිශේෂ කාරණයකි. සුනාමි, භූ චලන, ගිනි කඳු පිපිරීම්, ගංගා පිටාර ගැලීම්, නාය යාම් සේම නියඟ සිදුවී ඇතත්, ඒවා මානව සමාජයේ පැවැත්මට අභියෝග කිරීමට තරම් බිහිසුණු නොවීමත් කැපී පෙනෙන කාරණයකි.

ජුදාගමේ බයිබලය හෙවත් පැරැණි තෙස්තමේන්තුවේ සඳහන් මහා ජල ගැල්ම හා නෝවාගේ යාත්‍රාව පිළිබඳ කථා පුවතේ දැක්වෙනුයේ ද කල්ප විනාශයක දී සිදුවන බව කියන පෘථිවිය වසා පැතිරෙන මහා ජල ගැල්මක් ලෙසිනි. එහෙත්, එය ක්‍රි.පූ. 2500 දී පමණ සුමේරියානු ශිෂ්ටාචාරය වනසා දැමූ යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගා ගැලීමේ මහා ඛේදවාචකය විනා ලෝක විනාශයක් ගෙන දෙන මහා ජල ගැල්මක් නම් නොවන බව තර්කානුකූලය.


සන්නිවේදනය එතරම් දියුණු නොවූ ක්‍රි.පූ. 2500 හෙවත් වසර 4500කට පෙර දී සිදු වූ එවක ලෝකයේ දියුණුම මානව ශිෂ්ටාචාරයක් වූ සුමේරියානු ශිෂ්ටාචාරය විනාශ වීම ලෝක විනාශයක් ලෙසින් දැකීමට පැරැණි තෙස්තමේන්තු රචක ජුදාගමිකයන් පෙලඹුණාට කිසිදු සැකයක් නැත.

ක්‍රි.පූ. 1500 දී ආර්ය සංක්‍රමණයෙන් පසුව සිදුකෙරුණු ඉන්දු නිම්න ශිෂ්ටාචාර විනාශය මිනිසා විසින් සිදුකළ බිහිසුණුතම මානව ක්‍රියාදාමයකි.

ඒජියානු මුහුදේ පිහිටි දිවයින පාදක කරගෙන ගොඩනැඟුණු සුවිශේෂ නාවුක ශිෂ්ටාචාරය ක්‍රි.පූ. 4000 වන විටදිත් නයිල් නිම්න ශිෂ්ටාචාරය සමඟ වෙළෙඳ ගනුදෙනුවල යෙදුණු ආකාරය ජගත් ඉතිහාසයේ දැක්වේ. ක්‍රි.පූ. 3000 වන විට නොසොස් අග නගරය නිර්මාණය කරමින් අක්කර හයක් පුරා පැතිරුණු මාලිගය ඇතුළු දැවැන්ත මහල් ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකිරීමට තරම් දියුණු ජනවර්ගයක් වූ ඒජියානුවෝ ක්‍රි.පූ. 1800 වන විට ලයිනියර් ඒ (Linear A Script) නමින් හැඳින්වෙන රේඛාක්ෂර ලොවට හඳුන්වා දීමට ද සමත් වූහ. ක්‍රි.පූ. 1500 දී ඒජියානු රාජ්‍යය ආක්‍රමණය කළ මයිසිනායිවරු ඒජියානු ශිෂ්ටාචාරය විනාශ කළහ.

මිනිසා විසින් ඊළඟ දැවැන්ත විනාශය සිදුකළෙත් ක්‍රි.පූ. 800 දී ඇරඹුණු විශිෂ්ට ශිෂ්ටාචාරයක් වන ෆිනිෂියානු ශිෂ්ටාචාරය වනසා දැමීම මඟිනි. එය සිදුකෙරුණේ රෝම අධිරාජ්‍යය මඟිනි. දෛවයේ සරදමකට මෙන් වසර 1000ක් මුළුල්ලේ ගොඩනැඟුණු රෝම අධිරාජ්‍යය ක්‍රි.ව. සිව් වෙනි සියවසේ දී විනාශ කිරීමට ම්ලේච්ඡ ජර්මානු ගෝත්‍ර සමත්වීම කැපී පෙනෙන සිද්ධියකි.

මේ අතර ක්‍රි.ව. පළමු සියවසේ දී සිදු වූ විසුවියස් ගිනිකන්දේ පිපිරීම මත පොම්පේ නගරය විනාශ වීමත් මිනිසාට එරෙහිව ස්වභාවධර්මය ක්‍රියාත්මක වූ ඓතිහාසික අවස්ථාවකි. ක්‍රි.පූ. දෙවෙනි සියවසේ දී ලක්දිව සිදුවූ සුනාමියක් කැලණිතිස්ස රාජ සමයේ සිදුවූ මුහුද ගොඩ ගැලීමක් ලෙසින් වංශ කථාකරුවෝ සඳහන් කරති.



ලන්ඩන් නගරය ගින්නෙන් දා අළුවීමත්, පෘතුගාලයේ ලිස්බන් නගරය සුනාමියට ගොදුරු වීමත්, ක්‍රි.ව. දෙවෙනි සහශ්‍රයේ දී සිදුවූ පරිසරයට හානිකර වූ ස්වභාවික විපත් ලෙසින් ජගත් ඉතිහාසයට එක්ව තිබේ. මානව සමාජය සිදුකළ මේ සියලු විපත් සේම සොබාදහම මිනිසාට එරෙහිව සිදු කළ විපත් සියල්ලටම මුහුණ දෙමින් භෞතික වශයෙන් මානව සමාජය සිය ඉතිහාසයේ උසස්ම අවධියට ළඟාවීම විසි එක්වෙනි සියවසේ දී සිදුවීම සුවිශේෂ කාරණයකි.

එහෙත්, අප අමතක නොකළ යුතුම කාරණයක් වනුයේ මානව සමාජය අධ්‍යාත්මික වශයෙන් විශිෂ්ටතම යුගයට ළඟා වූයේ ක්‍රි.පූ. හය වැනි සියවසේ දී වීමත්, ඒ හා සමඟින් මානව සමාජය පැවැත්ම පිළිබඳ අභියෝගයකට ලක් නොවීමත් මෙහිලා සිහිපත් කිරීම වැදගත් බවයි. මානව සමාජයේ නොදියුණු යැයි ප්‍රචලිත යුග තුළ දී මානව ක්‍රියාකාරකම් මත හෝ ස්වභාවධර්මයේ ප්‍රතික්‍රියා මත සිදු වූ විපත්තිකාර සිද්ධීන් මානව සමාජයේ පැවැත්මට තීරණාත්මක අභියෝග එල්ල කිරීමට ගෙවීගිය වසර ලක්ෂ විස්සක කාලය පුරාම අසමත්ව තිබේ. එය මානව සමාජයේ අඛණ්ඩ පැවැත්මට ලබාදුන් දායකත්වය, ආශීර්වාදය ඔප්පු කරනුයේ නොදියුණුභාවය දැයි විමසා බැලීම වැදගත්ය. මානව සමාජයේ පැවැත්මට තීරණාත්මක ලෙස අභියෝග එල්ල කිරීමට සමත් යුගයක් මානව සමාජයේ උසස්තම හෝ උත්තරීතරම යුගය ලෙසට සැලකීම හෝ අර්ථකථනය කිරීම කෙතරම් බුද්ධිගෝචර දැයි විමසා බැලීමත් වැදගත් විය නොහැකිද?

ගෝත්‍ර, දඩයම්, එඬේර, වහල්, වැඩවසම් යුගවල දී මිනිසා ස්වභාවධර්මයට අභියෝග නොකරමින් ඊට අනුගතව කටයුතු කිරීම නිසා මානව සමාජයේ පැවැත්මට අභියෝගයක් එල්ල කිරීම සිදුනොවුණි. නමුත්, විසි එක්වෙනි සියවසේ දී මානව සමාජයේ පැවැත්මට බරපතළ අභියෝගයක් එල්ල වීමට සමාජ පරිණාමයේ ධනේෂ්වර යුගය දායක වී ඇත්තේ කෙසේදැයි විමසා බැලීමත් වැදගත්ය.

කාර්මික යුගය විසින් වැඩවසම් යුගය යල් පැනගිය තත්ත්වයට පත් කරමින් ධනේෂ්වර යුගයට මානව සමාජය පරිණාමය කිරීමට දායක

විණි. එම ධනේශ්වර සමාජ ක්‍රමය තුළ දී කාර්මික විප්ලවය ද යල්පැනගිය තත්ත්වයට පත් කරමින් තාක්ෂණ යුගයට මානව සමාජය අවතීර්ණ කිරීමට විසිවෙනි සියවසේ දෙවෙනි භාගය වන විට සමත් විය.

එහි එක් විපාකයක් වශයෙන් දෙවෙනි ලෝක මහා සංග්‍රාමය අවසානයේ දී පරමාණු බෝම්බය නිර්මාණය කිරීමට අමෙරිකාව සමත් විය. න්‍යෂ්ටික යුද්ධයක් සිදු වුවහොත් මිනිසාට ඊළඟ සටන කිරීමට සිදුවනුයේ දුනු හා ඊතලවලින් යැයි මහා දාර්ශනික බර්ට්‍රන්ඩ් රසල් සාමිවරයා සිය Has man a Future කෘතිය මඟින් ලොව හමුවේ පැවසුවේ විසිවෙනි සියවසේ මැද භාගයේදීය. එමඟින් ඔහු පෙන්වා දුන්නේ තුන්වෙනි ලෝක සංග්‍රාමය සිදුවුවහොත් එය න්‍යෂ්ටික යුද්ධයක් වන බවත්, එමඟින් මානව ශිෂ්ටාචාරය විනාශ වන බවත්ය.

න්‍යෂ්ටික යුද්ධයකින් නිර්මාණය කෙරෙන න්‍යෂ්ටික ශීත ඍතුව ප්‍රභාසංස්ලේෂණය අහිමි කරමින්, මානව සමාජය පමණක් නොව, දශක හයකට පෙර දී සිදුවූවාක් මෙන් සත්ත්ව හා ශාක විනාශය ද තීරණාත්මකව සිදු කෙරෙන බව විද්‍යාඥ මතයයි. මානව සමාජය ඇතුළු මුළුමහත් සත්ත්ව ලෝකයම විනාශ කිරීමට මිනිසාගේ උසස්ම අවධිය වූ තාක්ෂණ යුගය දායක වනුයේ, එය මිනිසා විසින්ම සිදු කිරීමේ අවදානම ලොව හමුවට ළඟාකර ඇත්තේත් මේ විසි එක්වෙනි සියවසයි.

ඊට අමතරව තාක්ෂණ යුගයේ දී පෘථිවිය ආරක්ෂා කරන ස්වභාවික ඕසෝන් ස්ථරයට හානිකර හරිතාගාර වායු නිපදවීම කරණකොට ගෙන පෘථිවියේ උෂ්ණත්වය වර්ධනය වීම මානව සමාජය මුහුණ පා සිටින දෙවෙනි බිහිසුණු අභියෝගය වී ඇත. මේ ආකාරයට පෘථිවියේ උෂ්ණත්වය වර්ධනය වීමට සාපේක්ෂව ධ්‍රැව ප්‍රදේශ තුළ පවත්නා අයිස් දියවීම අඛණ්ඩව සිදුවුවහොත් සාගරයේ ජල මට්ටම ඉහළ නැගීම් මත කුඩා දිවයින් රාජ්‍යයන් සේම සාගර වෙරළ තීර ජලයට යට වී යාම කෙටි කාලයක් තුළදීම සිදු වීමත් වැළැක්විය නොහැකිය. මානව සංහතියේ පැවැත්මට හානිකර එම සංසිද්ධියටත් ඍජුවම දායක වනුයේ මිනිසාමය.

පරිසරයට අභියෝග නොකරමින්, පරිසරයට අනුගතව වසර ලක්ෂ විස්සක පමණ කාලයක් පුරා මානව සමාජය පැවැත්ම පිළිබඳ අවදානමකින් තොරව පැවතිණ. එහෙත්, මිනිසා විද්‍යා තාක්ෂණ යුගය නිර්මාණය කර පරිසරයට අභියෝග කරමින් වසර 60ක් ගත වන විට ම පැවැත්ම පිළිබඳ අවදානම මානව සමාජය කරා ළඟාවීම තුළින් සනාථ කෙරෙනුයේ, මානව කෙළෙස් අවදි කරවන නව ලිබරල්වාදී අර්ථ ක්‍රමය තුළින් මානව සමාජයේ



පැවැත්මට කොතරම් අවදානමක් ළඟා කර දීමට සමත්ව ඇද්ද යන්නයි.

මේ ආකාරයට පරිසරය ගැන නොසිතා තවත් වසර පනහක් කටයුතු කළහොත් මානව සමාජයට අත්විය හැකි ඉරණම කෙතරම් ඛේදජනක වේදැයි සිතා ගැනීමත් අසීරු විය හැක. එහෙත් මානවයාගේ පැවැත්මට අභියෝග කරන න්‍යෂ්ටික අවි තරගය මෙන්ම පොසිල ඉන්ධන භාවිතය නිමා කිරීමට ධනවත් බලවත් රාජ්‍යයන් යොමු වනතාක් මිනිස් සමාජය මුහුණ පා සිටින මේ අවදානම් ඉවත් නොවීම ද පරම සත්‍යයකි.

මානව සමාජයේ අභ්‍යවකාශ ගවේෂණ තාක්ෂණය හා එම වැඩපිළිවෙළවල් වර්ධනය වීමට සාපේක්ෂව මානව සමාජයේ වටිනාකම වඩ වඩාත් වැඩි වර්ධනය වීම තර්කානුකූල සත්‍යයකි. එය එසේ වන්නේ පෘථිවියට ආලෝක වර්ෂ ගණනාවක් ආසන්නයේවත් මානව හෝ මානවයාට සමාන ජීවීන් ජීවත් වන බවට කිසිඳු සාක්ෂියක් මේ දක්වා සිදු කළ ගවේෂණ මඟින් අනාවරණය නොවීම නිසාය. විශ්වයේ අතිශය දුලබ වස්තුවක් වනුයේ මනුෂ්‍යයාය යන්න මතවන දිනත් පාසා සනාථ වෙමින් පවතී.


සිද්ධාර්ථ කුමාර උපතත්, සිද්ධාර්ථ බෝසතාණන්ගේ බුද්ධත්වයට පත්වීමත්, ගෞතම බුදුන් වහන්සේගේ පරිනිර්වානයත් යන තෙමඟුල ම ස්වභාවික පරිසරය තුළ විනා මිනිසා නිර්මාණය කළ කෘත්‍රිම ඉදිකිරීම් තුළ සිදු නොවීම තුළින් මානවයාගේ පැවැත්මත්, පරිසරයත් අතර පවත්නා අනුලංඝනීය සදාකාලීන පැවැත්ම හා එහි වැදගත්කම මානව සමාජයට ප්‍රායෝගිකව පෙන්වා දුන් තවත් අවස්ථාවක් මානව ඉතිහාසයේ දක්නට, අසන්නට ඇත්තේ නැත. එමඟින් සනාථ කෙරෙනුයේ මානව සමාජයේ බිහි වූ විශිෂ්ටතම පරිසර හිතකාමියාත්, පරිසරවේදියාත් ගෞතම බුදුන්වහන්සේම බවයි.

ඒවාගේම සොබා දහමෙන් බැහැරව මිනිසාට පැවතිය නොහැකිය යන යථාර්ථය විද්‍යා ප්‍රබන්ධ රචකයන් පවා හොඳින්ම අවබෝධ කරගෙන සිටින අයුරු පසුගිය කාලයේ රචනා කෙරුණු හා විකාශය කෙරුණු විද්‍යා ප්‍රබන්ධ මඟින්ද කදිමට තහවුරු කෙරිණි.

විද්‍යා තාක්ෂණ ක්ෂේත්‍රයන්ගේ දියුණුව හෝ වර්ධනය වැදගත් වනුයේ මිනිසාගේ ජීවිතය භෞතිකව සුරක්ෂිත කිරීමට හා පහසු කිරීම උදෙසා පමණක්මය. නමුත්, එසේ ජීවිත සුරක්ෂිත කිරීමට නම් සොබා දහමේම කොටසක් වන මිනිසාගේ සම්භවයට දායක වන සොබාදහම සුරැකීම අත්‍යවශ්‍යමය. පෘථිවියේ උපත වසර මිලියන 4500 ක් වෙද්දී මානවයාගේ උපතට හෝ පරිණාමයට වසර මිලියන දෙකක් පමණක් වීම මඟින් සොබා දහමේ ජ්‍යෙෂ්ඨත්වය මොනවට පැහැදිලි වේ. පරිසරය සුරැකීම කොතරම් වැදගත් ද යන්න ඉන් වඩ වඩාත් පැහැදිලි වේ.

## පුණ්‍යානුමෝදනාත්මක ස්තුතිය

- *බෞද්ධාලෝක සඟරාවට ධර්ම දානයක් ලෙස, ලිපි සැපයූ ලේඛක ස්වාමීන් වහන්සේ හා මහත්ම මහත්මීන්ට ද,*
- *සියලුම ලිපි පුද්ගලිකවම කියවා බලා වැරැදි නිවැරැදි කළ, සම්මානිත මහාචාර්ය මාලිනී ඇඳගම මහත්මියට ද,*
- *මුද්‍රණ දෝෂ නිවැරැදි කළ නාලක ජයසේන මහතාට ද,*
- *බෞද්ධාලෝක සඟරාව සකස් කිරීමේ දී සහාය දැක්වූ සම්මේලන කාර්යමණ්ඩලයේ සියලු දෙනා, විශේෂයෙන් දුෂාන්ති, ක්‍රිෂාන්ති හා ශ්‍රියානිට ද ධර්මදානයට ලබාදුන් සහාය වෙනුවෙන් පුණ්‍යානුමෝදනාත්මක ස්තුතිය පුද කරමි.*



# රසවත් වූ වැකිය සාධුත්වය පිළිබඳ අනුශාසනාවකි

**ආචාර්ය රංජිත සේනානායක**
ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය - සිංහල අංශය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය
B A (Hons) Ruhuna Edip - Colombo
Mphil - Peradeniya
PHD - Sri Jayawardhanapura

**හැඳින්වීම** හෙළ ගද්‍ය පද්‍ය සමස්ත සාහිත්‍යාවලී කතුරුවන්ගේ හෘදයංගමශීලි මුඛ්‍ය පරමාර්ථය සමාජය සාධුත්වය ඉෂ්ඨ සිද්ධ කිරීමයි. අමාවතුර, බුත්සරණ, සද්ධර්මරත්නාවලිය ඇතුළු ගද්‍ය කාව්‍යයන්ට මූල බීජ සැපයුයේ බෞද්ධ පාලි සාහිත්‍යයේ ආශ්‍රය කර ගනිමින් ය. විසිරී ගිය පාලි සූත්‍ර ධර්මයන් අනුවර්තන පරිවර්තන ස්වාධීන ස්වරූපයෙන් ගොඩනැගුණු උක්ත ගද්‍ය කාව්‍ය තුළින් හෙළ සාහිත්‍ය ලැබූ ඒකාලෝකයත් ඒ ඇසුරෙන් වසර සිය ගණනක් බෞද්ධාලෝකයෙන් ලාංකේය ජනතාව ප්‍රබෝධමත් වූහ.

**අරමුණ** සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍යාවලිය මූල බීජ කර ගත්තේ සමස්ත බෞද්ධ සාහිත්‍යයේ විවිධ කතා වස්තු උකහා ගනිමින් ය. මේ අධ්‍යනයේ අරමුණ වූයේ විවිධ පාලි සාහිත්‍ය පොතපත ඇසුරින් ගොඩනගා ගත් සිංහල ගද්‍ය සාහිත්‍යාවලියේ

අමවතුර බුත්සරණ සද්ධර්මරත්නාවලිය යන කෘති සාමජ සාධුත්වය උදෙසා ගොඩනගුණු ආකාරය විමසා බැලීම යි.

**'සහිතස්ස භවෝ සාහිත්‍යම්'** හිතෙෂී භාවය ම සාහිත්‍ය නම් වේ. මනුෂ්‍ය සමාජයේ පැවැත්මට, මානුෂික හැඟීම් (Human Emotions) වර්ධනයට, මානවයා හා සමාජය දෙස සානුකම්පික (Compassionate) දෘෂ්ටියක් හෙළීමට සාහිත්‍ය කෘතියකින් අප්‍රමාණ කාර්යභාරයක් කෙරේ. පෙරාපර දෙදිග ලෝකයේ විවිධ වශයෙන් ප්‍රාදුර්භූත වූ සාහිත්‍ය නිර්මාණවලට ආගමික බලපෑම සිදු වී තිබෙනු දක්නට ලැබේ. ඉන්දීය සාහිත්‍යයට මහා භාරතය, පංච තන්ත්‍රය සෘජුව බලපාන්නට ඇති බව කාව්‍ය නාටක පිරික්සීමෙන් පෙනේ. චීනය, ජපානය, ලංකාව ආදී රටවල බුදු දහම බලපෑමෙන් නොයෙකුත් සාහිත්‍ය නිර්මාණ ගොඩ නැගිණි. මේ සඳහා මූලික වශයෙන් මූලාශ්‍රය වූයේ ලෝක සාහිත්‍යයේ විශ්ව කෘතියක් ලෙස සම්භාවනාවට (Honour) පාත්‍ර වූ පන්සිය පණස් ජාතක පොතයි. සම්බුදු දේශනාව හා බැඳුණු පාලි සාහිත්‍යයේ විසිරී ගිය සූත්‍ර පිටකයට අයත් **දීඝ නිකාය, මජ්ජිම නිකාය, සංයුක්ත නිකාය, අංගුත්තර හා ඛුද්දික නිකාය** ආදී වශයෙන් හෙළ සාහිත්‍යයේ ගද්‍ය පද්‍ය නිර්මාණ සාහිත්‍ය රචනයට බුද්ධ දේශනාවෙන් ලැබුනේ අපරිමිත බලපෑමකි.

සම්භාව්‍ය හෙළ ගද්‍ය සාහිත්‍යයේ **අමාවතුර, බුත්සරණ, සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, නිකාය සංග්‍රහය, සද්ධර්මාලංකාරය** ආදී කෘති රචනයට වස්තු බීජ සපයනු ලැබුවේ **ජාතකට්ඨ කථාව, ධම්ම පදට්ඨ කථාව, විමාන වත්‍ථු, පේත වත්‍ථු, විනය, සූත්‍ර අභිධර්ම** ආදී පාලි සාහිත්‍යයේ විසිරී ගිය බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය,බුද්ධ චරිතය, බෝසත් චරිතය ශාසන ඉතිහාසය යනාදී කෘතීන් ය.

දැනට විද්‍යමාන වන ඉපැරණි ම ගද්‍ය නාට්‍ය කෘතිය වන්නේ පොළොන්නරු යුගයේ දී සිංහල සාහිත්‍යයට එක් වූ ගුරුළුගෝමී පඬිවරයාගේ 'අමාවතුර' යි.

**'මේ කර්මයන් ගෙ විභාග ධර්මප්‍රදීපිකාව නම් මහා බෝධිවංශ පරිකථාවෙන් දන්නේ යැ හේ බුද්ධ ධර්මය මේ බුද්ධ චරිතය'** (ඥාණාලෝක හිමි (2004 142 පිටුව)) ධර්ම ප්‍රදීපිකාව නම් මහා බෝධි වංශ පරිකථායෙන් දන්නේ ය. යන පාඨයෙන් ගම්‍ය වන්නේ ගුරුළුගෝමීන් විසින් විරචිත ධර්ම ප්‍රදීපිකාව බුද්ධ ධර්මය හා බැඳුණු කෘතියක් බවත්, අමාවතුර බුද්ධ චරිතය අළලා ලියවුණක් බවත් ය.තත් කතුවරයාගේ අමාවතුරෙහි පරමාර්ථ පාඨය වන්නේ ,

**'බුදුගුණ අනන්ත වන බැවින් නව ගුණ හැම කියත් නො පිළිවතින් පුරිස ධර්ම සාරථී යන පදය ගෙන අප බුදුන් පෙරුම් පුරා බුදුවැ...... විෂම පුරුෂයන් දමා....'**අමා මහ නිවන් පැමිණ වූ සේ (එම) 1 පිටුව)

ගද්‍ය කාව්‍ය රචකයෙකු වන ගුරුළු ගෝමීන්ගේ අමාවතුරෙහි ආරම්භක පාඨය විෂම පුරුෂයන් දමනය කිරීම තේමා කර ගෙන රචිත කෘතියකි. අටලොස් පරිච්ඡේදයකින් යුක්ත මේ ග්‍රන්ථයෙහි විෂම පුරුෂයන් ලෙස සලකනු ලැබුවේ සමකාලීන සමාජයේ පමණක් නො ව පූර්ව හා පසු කාලීන සමාජවලද මිනිස් වර්ගයාට එරෙහි වූ පුද්ගල කොට්ඨාසය යි. අංගුලිමාල, ආලවක, තීර්ථක ආදී දමන කථාවලදී සමාජයට එරෙහි වූ පුද්ගල කොටස් දමනය කළ ආකාරය දක්වා තිබෙන්නේ බුද්ධ ශක්තිය අනෙක් සියලු බලවේගවල ශක්ති විශේෂයන්ට වඩා මෛත්‍රී, කරුණා බලයෙන් යුක්ත බව අනාවරණය කරමින් ය.

**''නොවියත් හුදී ජනන් සඳහා සිය බසින් මා විසින් සැකෙවින් දක්වනු ලැබේ.** (එම 1 පිටුව)යන පාඨයට අනුව පාලි, සංස්කෘත නොදත් සිංහල කියවිය හැකි පාඨක පිරිස අරභයා අමාවතුර රචනා කොට ඇති බවයි.

දමන කථා තුළින් අනාවරණ කළේ මෙබඳු පුද්ගල චරිත බුද්ධ කාලීන භාරතයේ පමණක් නො ව ඉන් ඔබ්බටත් නොයෙකුත් රටවල, සමාජවල දක්නට ලැබෙන නිසා තුන් කල් දුටු ලේඛකයෙකු හැටියට පාලි සාහිත්‍යයේ විසිරී ගිය කථා ඇසුරින් විශිෂ්ට පරිවර්තනයක් ලෙසින් අමාවතුර රචිත බව දක්වමිනි. අටළොස් පරිච්ඡේදයෙන් **'දුර්දාන්ත දමනය'** නැමැති ප්‍රථම පිරිවැජ ගොඩ නගන ලද්දේ **ජාතකට්ඨ කථාවෙහි** නිදාන කථාව ඇසුරිනි.

**'සන්නිකෙ නිදානං පන භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමේ විහරති මහා වනේ (පියතිස්ස හිමි 1946 පිටුව 46)** යනුවෙන් අප බුදුන් පාරමිතා ධර්ම පුරා දෙව්රම් වෙහෙර පිළිගෙන යනුවෙන් වස්තු නිර්දේශය දක්වමින් ජාතක කථා 208ක් යොදා ගෙන බුදුන්ගේ දමන ශක්තිය බෝධි සම්භාර කාලයේ සිට එතුමා තුළ තිබූ බව දැක්වූයේ පෘථුල පාඨක පිරිසක් මූලික කර ගෙන ය. එයින් බෝසත් චරිතයේ ගති ලක්ෂණ අතර දමන ශක්තිය පිළිබඳ අවබෝධයක් ලබා දෙමින් ය.

පූර්ව කාලීන සමාජවල මෙන් ම වර්තමාන සමාජයෙහි ද උද්ධච්චකම, (Arrogance) කුහකකම, (Dishonest) අභිමානය, (Pride) අනුන් හෙළා දැකීම, (Condemmation of others) මිත්‍යා විශ්වාස (Believe in the myth) තදින් පැවතුණි. මිනිස් සමාජයට අහිතකර ලෙසින් මේවා බලපෑ බවත් සමහර බමුණු , සිටුවරු මිත්‍යා දෘෂ්ටිකයෝ මේ මත දරමින් පොදු සමාජයට හිරිහැර කරමින් හැසිරුණු බවත් ඒවා පිළිකුලෙන් යුතුව අවඥාවට ලක් කළ යුතු බව ගුරුළුගෝමීන් අමාවතුරෙහි දී දක්වා තිබෙන්නේ සාහිත්‍ය රචකයෙකු ලෙස සමාජය දෙස සානුකම්පික දෘෂ්ටියකින් සිත් යොමු කරමින් ය.

**මැදුම් සැඟියේ උපාලි සූත්‍රය** (ආනන්ද හිමි, 1962), 60-82 පිටු)හා එහි අටුවාව ඇසුරින් ගහපති දමනය රචනා කළ ගුරුළුගෝමීන් බුද්ධ ධර්මයේ හරය ඇති ශාස්තෘවරුන්ගේ දේශනාවන්ට වඩා අර්ථවත් බවත් තත් කාලීන ඉන්දියාවේ පැවති ආගමික සංකල්ප මිත්‍යා දෘෂ්ටික අදහස් උපහාසයට ලක් කළ අයුරුත් විවරණය කෙරෙන කථාවකි.උක්ත කථාවෙහි දී ස්වකීය කවිත්වය නිරූපණය වන අයුරින් ගුරුළුගෝමීන් උපාලි සූත්‍රයෙහි දැක්වෙන ඇතැම් පාඨ පරිවර්තනය කොට තිබේ. එහි දී පාලි, සංස්කෘත මාතෘ භාගවලින් ගද්‍යය පෝෂණ කර ගෙන තිබීම ද විශේෂත්වයකි.

**'සෙය්‍යතාපි නාම බලවා පුරිසො දීඝලෝමකංඑලකං ලෝමෙසු ගහෙත්වා ආකඩ්ඩෙය්‍ය....'**(ලංකානන්ද හිමි,1972) 54 පිටුව) යන පාඨය ඇසුරින්

**'යම් සේ බල ඇති පුරුෂයෙක් දික් ලොම් ඇති එළුවක්හු ලොමැ ගෙන මොබට ඔබට ඇදැ ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරේ ද?'** (ඤාණාලෝක හිමි (2004) 54 පිටුව)

විචාරවත් පාඨකයාට අදාළ අවස්ථාව රූචි ගෝචර අයුරින් ගොඩ නැඟීමටත් සමකාලීන ලාංකේය පරිසරය පිළිබඳ තොරතුරු ගෙන හැර දැක්වීමටත් අමාවතුර කවියා විසින් කැප කරන්නට යෙදුනේ ගද්‍ය කාව්‍ය රචකයෙකු හැටියට රසෝද්දීපනය වන අයුරිනි.


'යම් සේ සූරාධූර්තයෙන් රහ පරහන මටුළුකස්ස දෙව්යට වූයේ කසට හරනා සඳහා දෙකනැ
ගෙන කිඹිසිණි කොටැ පිඹ පියා ද උඩුකුරු කොටැ පිඹ පියාද....(එම, 55 පිටුව)

යනුවෙන් සුරා පානයට ලැදි පුද්ගලයෙක් රා මදින කිතුල් හෝ පොල් ගසකට නැග සුරාව බීමට පෙර මටුළු කැබැල්ලකින් එය පෙරා පානය කරන අයුරු ඉදිරිපත් කළේ පාඨක අවධානය යොමු වන අයුරින් පමණක් නො ව ලාංකේය සමාජ පරිසර හා ඇතැමුන්ගේ ජීවිත තොරතුරු විවරණයට හසුකර ගනිමින් ය.

පන්සිය පනස් ජාතක පොතේ **මාතෘග ජාතකය** මූලාශ්‍රයෙන් අතුරු කථාවක් ලෙසින් රචිත දිට්ඨ මංගලිකා කතාව භාරතයේ බ්‍රාහ්මණ සමාජයෙහි පැවති අධික කුල මානය, හෙළා දැකීම, කුලවාදයට පහර ගැසීම, විශේෂ කොට ගත් ප්‍රවෘත්තියක් ලෙසිනි. එය ගුරුළුගෝමී සියුම් ලෙස පොළොන්නරු සමයේ භාරතීය බලපෑමෙන් පැවතුණු බ්‍රාහ්මණ සංකල්පය උපහාසයට ලක් කර තිබෙන්නේ

**'මානෙල්මලකුදු ''ඉතා බරැයි'' නොපළඳනා සියුමැලි දැරි ''නැගෙව හිමි'' කියන්නී'' උට්ඨාහි සාම යි කිවැ. මහසත් ''මම් 'උට්ඨාහි' නම් නො වෙමි ''යි කීයැ. වැළිකුම් යෙම්''දැයි කිව. ''නැඟෙව, හිමි මාතංගය.....'' තිගෙ මිනිස්සු මා නැගී හිඳුනා පමණ ශක්ති නැති කළහ. දෙ අත්කරැ ගෙන නඟ ගනැයි කී යැ.'**

අධික කුලමානයෙන් පිරී ගිය දිට්ඨමංගලිකාට සිදු වූයේ සැඩැල් කුලයෙහි උපන් මාතංගට අපහාස,



උපහාස පමණක් නො ව ශාරීරිකව සිදු කරන ලද පීඩනයන් හේතු කොට ගෙන චණ්ඩාලයෙකු කරින් නගරයෙහි වීථියක් වීථියක් පුරාම රැගෙන යාම යි. මාතංගගේ ඉඳුල් දියර බීමට සිදුවීම ඔහු දාව දිට්ඨමංගලිකාවට පුතෙක් ලැබීම, අධික මානයෙන් ක්‍රියා කළ පුතුට ද දඬුවම් ලබා දීම මේ ආදී සියලු අවස්ථා තුළින් මිනිස් සමාජය පිළිකුල් කරන කුල භේදය, පන්ති භේදය, අධික මානය දැඩි ලෙස අවඥාවට ලක් කොට තිබේ. එයින් ලේඛකයාගේ පරමාර්ථය වූයේ පොදු සමාජයට අහිතකර ව බලපෑම් කරන පුද්ගල කොටස් ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව පිළිකුලට ලක් කොට මානව හිතවාදී සමාජයක් ගොඩ නැගීමට ය. මේ සම්බන්ධයෙන් විචාරක අවධානය ද යොමු වී තිබේ.

**'රුවැති සියුමැලි දැරියකගේ කරින් සැඬොල් පිරිමියෙකු ගෙයක් දොරක් පාසා යැවීම ශෝභන නො වෙතියි හැඟුණ ද එයින් කුල මානයෙන් දැවුණවුන්ට කළ පරිහාසය නම් අගනේ ය.** (වික්‍රමසිංහ, (2003) 21 පිටුව)

බෞද්ධ කථා මූලාශ්‍රයෙන් ගද්‍ය කාව්‍ය රචකයෙකු ලෙස ගුරුළුගෝමී ගොඩ නගන ලද අවස්ථා සිද්ධි, කථාවල චරිත නිරූපණ භාවිතයෙන් සිදු කොට තිබෙන්නේ මිනිස් සමාජයේ සෑම පැති කඩක් දෙස ම දයානුකම්පාව මිනිස් සිත් සතන්වල ජනිත කරමින් සාධු සමාජයක් ගොඩ නැගීමට උත්සුක වීම යි.

**දීඝ නිකායේ කූටදන්ත සූත්‍රය** වස්තු කොට ගෙන බ්‍රාහ්මණ දමනය පිළියෙල කළ ගුරුළුගෝමීන් යහපත් පාලකයන් වශයෙන් රට වැසියන් තලා පෙළා, ධනය රැස් නො කොට රටවැසියන්ගේ සහාය පතා ගෙන සතෙකුටවත් හිංසා නො කළ යුතු බව අවබෝධ කරවමින් ගොඩ නැගුණ කථාවකි.

රාජ දමනය යටතේ දී දෙව්දත් තෙරුන් බුදුන් මැරීමට යෙදූ උපක්‍රම, අවසානයේ අජාසත් රජු සාසනයේ ප්‍රධාන දායකයා බවට පත් වීම යන සිදුවීම් අළලා බෞද්ධ සාහිත්‍ය රචකයෙකු ලෙස සතුරාටත් මානව දයාව පළ කළ යුතු බව අවබෝධ කර දෙනු ලැබුවේ **දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රය** (එම, 82-148 පිටු) වස්තු බීජ කරමිනි.

**සූත්‍ර පිටකයෙහි මජ්ඣිම නිකායේ අංගුලිමාල සූත්‍රය**(ලංකානන්ද හිමි, (1972), 516-523 පිටු)සහ **පපංච සූදනි අට්ඨ කතාව** ආශ්‍රය කොට ගෙන ගුරුළුගෝමීන් විසින් රචනා කරන ලද ඇඟුල්මල් දමන කතාව අදාළ චරිතය, සපුරා විග්‍රහ

කෙරෙන්නකි. සිංහල සාහිත්‍යාවලියෙහි විශිෂ්ට නිර්මාණයක් වන අමාවතුරේ අංගුලිමාල දමනය කාලීන සමාජ ගත තොරතුරු පමණක් නො ව පුද්ගල චරිත ලක්ෂණ හා මානසිකත්වය විවරණය කරන්නක් බව ඇතැම් විචාරකයන්ගේ ද අවධානයට ලක් වී තිබේ.

**'පරිවර්තනය පවා ඇතැම් විට ශ්‍රේෂ්ඨ කවිත්වය දැක්වෙන කැඩපතකි. ඊට නිදසුන් කළ හැකි කාව්‍ය ලෝක සාහිත්‍යයෙහි හිඟ නොවේ.** (වික්‍රමසිංහ (2008), 92 පිටුව)

අමාවතුර ගද්‍ය කාව්‍යය ඒකාලෝක වූයේ බෞද්ධ සාහිත්‍ය බලපෑමෙනි. එහි දී චරිත, අවස්ථා, සිද්ධි නිරූපණ භාවිතයට ද ගනු ලැබුවේ ද පාලි සාහිත්‍යයේ කථා මූලාශ්‍රයෙනි. බුදුන් පසු පස හඹා යන අංගුලිමාලගේ ශරීර ස්වභාවය වෙනස් වූ අයුරු දක්වන ගුරුළුගෝමී

'සොර ක්ලාන්ත වියැ. මියෙහි කෙළ සිඳී ගියේ, ශරීරයෙන් ස්වේද බස්සි. එකලැ අඟුල්මල් සොර විස්මිත වැ මම් පූර්වයෙහි දුවන ඇතුන් ලුහුබැඳැ ගනිම් මැ යැ, අසුන් ලුහුබැඳැ ගනිම් මැ යැ.

උපමාවෙන් හෝ අලංකාරයෙන් හෝ අතිශයෝක්තියෙන් බර කිරීම අමාවතුරේ කාර්යය නො වේ. පාඨකයා වෙහෙසට පත් නො කොට හැකිතාක් කෙටියෙන්, අරපිරිමැස්මෙන් වචන භාවිත කරමින් කෙටි වාක්‍ය රීතිය ඔස්සේ සිද්ධි විස්තර කළේ ඖචිත්‍යයට(To Suitable) බර වෙමිනි. බුදුන් සහ අංගුලිමාල පිළිබඳ අවබෝධය පෘථුල පාඨකයාට ඇති කිරීමට කළ උත්සාහය කවියාගේ භාෂා නෛපුණ්‍යත්වය (Languages skill) පිළිබිඹු කරන්නකි. අමාවතුරේ භාවිත කරන ලද බස පිළිබඳ ව සටහනක් තබන බලංගොඩ ආනන්ද මෛත්‍රිය හිමියෝ

**'අමාවතුරෙහි බස මැනවින් විමසන්නෙකුට මෙහි වෙසෙසි ලකුණු කිහිපයක් මතු වෙයි. මෙහි සකු ද අඩු යැ. සමස් පද අඩු යැ. කියවන්නුහුටවෙහෙස කරන වැඩි වැනුමෙක් හෝ පුන පුනා එක් බඳු දෑ, හැර පෑමෙක් හෝ නැත. පෙළ අටුවාහි ආ දෑ හෙළ බසට නැඟීමේදී පදරුතට වඩා හව් අරුතට මුල් තැන දින**'(ඥාණාලෝක හිමි (2004)**ii** පිටුව)

සාහිත්‍ය රචකයෙකුගේ පරමාර්ථ සාධනයට බෙහෙවින් ඉවහල් වන්නේ ඔහු විසින් භාවිත කරනු ලබන භාෂා ව්‍යවහාරයයි. ගුරුළුගෝමී ව්‍යක්ත වූ භාෂා සම්ප්‍රදාය භාවිතය, මාතෘ භාෂාවන්ගෙන් පෝෂණය ලැබීම, ගද්‍ය තුළ නැවුම් ස්වරූපයක් ඇති කිරීම, හ්‍රස්ව ස්වරාන්ත ක්‍රියා පද භාවිතය තුළින් හැඩ ගස්වා ගත් බස් වහර බුද්ධි ගෝචර වේ.

ගද්‍ය පද්‍ය නාට්‍ය ඕනෑ ම කාව්‍යයකට වාහනය හෙවත් මාධ්‍ය වන්නේ භාෂාව යි. ව්‍යංගාර්ථවත් භාෂාව භාවිතයෙන් භාවයන් උද්දීපනය කොට පාඨකයා හෝ ශ්‍රාවකයා හෝ ප්‍රේක්ෂකයා තුළ පහන් සංවේගය දැන විය හැකි ය. මේ සිද්ධාන්තය සංස්කෘත අලංකාරවාදීන්ට පෙර බුදුන් වහන්සේ හා ශ්‍රාවකයන් අන්තර් ඥානයෙන් දුටු බව පාළි සාහිත්‍යයෙන් ද හෙළි වන බව පැවසේ. (වික්‍රමසිංහ (2010), 68 පිටුව) රස දනවන සේ භාවයන් උද්දීපනය කළ යුතු යැයි රසවාදය කාව්‍යයක ආත්මය හැටියට සැලකූ භරතමුනිවරයා ද පිළිගත්තකි. හුදෙක් අමාවතුර පාලි රීතියට සමීප වෙමින් රචිත කාව්‍යයක් බැවින් පාලි ගද්‍ය පද්‍ය කාව්‍යයන්ගෙන් උකහා ගත හැකි විචාර සංකල්ප අනුව රසය පසිඳුරන් පිනවන ආස්වාදයක් සැපයෙන හුදු විනෝද කාව්‍යයක් නො වේ. ගැඹුරින් විමසා බලන කල රසය ආත්මය කොට ගෙන බුදුන්ගේ දමන ශක්තිය විද්‍යමාන කරමින් පාඨකයාට බුදුන් පිළිබඳ අවබෝධයක් ඇති කළේ සමාජ සාධුත්වය ඇති කිරීම පිණිස ය.

සිංහල ගද්‍ය කාව්‍ය සාහිත්‍යයේ බහුල ව්‍යවහාරයට හා ජනප්‍රියත්වයට පත් වූ ලේඛන සම්ප්‍රදායක ප්‍රාරම්භකයා විද්‍යාචක්‍රවර්තීන් ය. තත් කවියා ගද්‍ය රීතිය හැඩ ගස්වා ගත්තේ පෘථුල ශ්‍රෝතෘ ජනයාගේ සාධුත්වය වර්ධනය කිරීම පිණිස දොඩමලු කමට අනුබල දෙන ධර්ම දේශනා ග්‍රන්ථ ශෛලිය ඇසුරිණි. සංස්කෘත අලංකාර සංකල්පයට සමීප වෙමින් උපමාලංකාර, අතිශයෝක්ත්‍යාලංකාර, අනුප්‍රාසාලංකාර, උත්ප්‍රේක්ෂාලංකාර ආදී විවිධාලංකාර භාවිතයෙනි.

**'තුරු අගක රැව්දෙන මත් කොවුලකු සේ බුදුගුණ රසයෙන් මත් වූ සිතට නැගුණු අයුරින්**

**විද්‍යාචක්‍රවර්තීන් කළ බුද්ධාගිවාදනය කියවන්නන්ට කන්කලු හඬින් සිත් සතන් පිනවා ගත හැකි සේ ලියැවී තිබීම නිසා බොදු ජනප්‍රියත්වය බුත්සරණට ලැබී තිබේ.'** (සන්නස්ගල, (1964), 171 පිටුව)

විද්‍යාචක්‍රවර්ති බුත්සරණ රචනයේ දී ද බුදු දහම හා බුද්ධ චරිතය සම්බන්ධ පාලි සාහිත්‍යයේ විසිරී ගිය ත්‍රිපිටක සාහිත්‍යය හා අට්ඨ කතා ආදී පොතපත මූලාශ්‍රයට :To Source) ගෙන තිබේ. පුරිස දම්ම සාරථී ගුණය පමණක් නො ව සෑම බුද්ධ ගුණයක් ම දෘෂ්ටාන්තව දැක්වීමට උචිත කථා වස්තු නිර්මාණය කොට ගෙන තිබෙන්නේ පෘථුල ශ්‍රෝතෘ පිරිසක් අරභයා ය. එහිදී භක්ති කාව්‍ය රචකයෙකුට විෂය වන උදාර නායකත්වය, උදාර නායකයාගේ වීරත්වය, උදාර නායකයාගේ පසු පස ඇති අත්භූත බලවේගය, එමඟින් මිනිස් සිතේ ප්‍රකෘති හැඟීම් ජනනය කිරීම යන කරුණු සැලකිල්ලට ගෙන ගද්‍යය හැඩ ගස්වාගෙන තිබේ.

ගුරුළුගෝමීන්ගේ අරමුණ වූයේ පාඨකයාගේ බුද්ධියට ආමන්ත්‍රණය කිරීමයි. එහෙත් විද්‍යා චක්‍රවර්ති ශ්‍රාවකයාගේ බුද්ධියට ගෝචර වන පරිද්දෙන් ශ්‍රද්ධා භක්තිය වඩවමින් දහම් රසයෙන් කුල්මත් කරමින් නිර්මාණාත්මක ස්වරූපයෙන් ගද්‍යය හැඩගස්වා ගත්තේ පොදු ජනතාවට උපරිම රසයක් හා වින්දනයක් ලබා දෙමින් ය. පාලි සාහිත්‍යයෙන් වස්තු බීජ පමණක් තෝරා ගෙන කථා උච්චාවස්ථාවකට(To a Climax) පත් කොට නිමා කර තිබෙන්නේ භක්ති පූර්වක හැඟීම් ජනිත වන පරිද්දෙනි.පාලි අට්ඨ කථාවෙහි අහිංසක, අංගුලිමාල බවට පත් වූ අයුරු දැක්වෙන්නේ ඉතා සංක්ෂිප්තයෙනි.

'තතෝ විජ්ජිත්වා අංගුලීනං මාලං කත්වා ධාරේසි' (පඤ්ඤාසාර හිමි (1917)227 පිටුව)

මේ අවස්ථාව ඇසුරින් බුත්සරණ කතුවරයා අංගුලි මාල දමන කතාව ආරම්භ කරන්නේ නිර්මාණාත්මක ව හා සජීවී අයුරිනි.

**'තවද දහසක් ඇඟිලි කපා ගුරු පූජා කෙරෙමියි' මඟතට බැස යමයාගේ දළ සේ භයංකර වූ කඩුවක් ගෙණ වාත වේගයෙන් දිවැ මිනිසුන් මරා ඇඟිලි කපා, ගෙතූ ඇඟිලි කරලීමෙන් ''අංගුලිමාල'' යැයි ප්‍රසිද්ධ වැ....' මම යැ අංගුලිමාලයා'' යි කී හඬ ඇසූවිට මැ...** (සෝරත හිමි, (1966)61-62 පිටු)

අට්ඨ කථාවෙහි කෙටියෙන් දැක්වූ අදහස වඩාත් විසිතුරු කරමින් අංගුලිමාලගේ භයානක ස්වරූපය ශ්‍රාවකයාගේ සිතෙහි භීතිය, ත්‍රාසය ජනිත වන අයුරින් බුත්සරණ කතුවරයාගේ අසමසම කවිත්වය විද්‍යමාන වන අයුරින් කථාව පිළියෙල කොට තිබෙන්නේ පුද්ගල සාධුත්වය පිණිස ය. පොදු ජනයාට ධර්මය ඉගැන්වීම, බුදුන් සහ බුදු දහම කෙරෙහි සැදැහැතිව පෙම් වැඩීම, බෝධි සත්ව හා බුද්ධ චරිතවල උත්තමාංග ප්‍රකාශ කිරීම, එකල ලක්දිව සමාජයටත් රාජානුශාසනයට අනුරූපව ජීවත් වීමට පොදු ජනයා හුරු කිරීමත් පාලි කථා රසවත් ලෙස රචනා කරමින් ඔවුන්ට විනෝදාස්වාදයක් සැපයීමත් අරමුණු කොට ගත් බව විද්වතුන්ගේ මතය යි. (වික්‍රමසිංහ, (2008), 109-110 පිටු)

අංගුලිමාල බුදුන් පසු පස හඹා යද්දී බුදුන්ගේ හඬ නිසා ඔහුගේ සිතෙහි මොළොක් වූ ප්‍රකෘති විලාසය සුළු මොහොතකින් ඇති වේ. ඒ මානසික පරිවර්තන අවස්ථාව විද්‍යාචක්‍රවර්ති චිත්‍රණය කරන්නේ අතිශය චිත්තාකර්ෂණීය (Impressive) අපූර්ව විලාසයකිනි.

**'ඒ මිහිරි රුව ඇස හෙත් ම, ඒ මිහිරි හඬ කණැහේත් ම දකුණතින් ගත් කඩුව වැටී ගෙන බැව් නො දැන වමතින් ගත පලිහ වැටී හෙණ බැව් නො දැන දෙක දෙ අතින් හෙළා දතිම් ස්වාමීනි, හැඳින්නෙමි ස්වාමීනි මහාමායා දේවීන් වහන්සේගේ පුතණුවන් වහන්සේ නුඹ වහන්සේ ද?'**

කතාවේ උත්කර්ෂවත් අවස්ථාවේ බුදුන් වහන්සේගේ විජයග්‍රහණය ම ධ්වනිත කරවන මෙබඳු අවස්ථා තුළින් සහෘදයා කථාව කෙරෙහි බැඳ තබා ගැනීම පමණක් නො ව සිතෙහි යහපත් හැඟීම් ද ජනිත කරවයි. චිත්ත සන්තානය තුළ භක්ති රසය පිබිදේ. ගද්‍ය කාව්‍ය රචකයෙකු හැටියට සමකාලීන පොදු ජනයාගේ මෙන් ම පසුකාලීන සැදැහැවතුන්ගේ සිත් සතන් ප්‍රසන්න හැඟීම් ජනිත කරන්නේ සාධු සමාජයකට මං පෙත් විවරණ කරමිනි.

විද්‍යාචක්‍රවර්තීන්ගේ නිර්මාණ කෞශල්‍යය ප්‍රතිබිම්භනය කෙරෙන කථාවක් වන්නේ නාලාගිරි දමනය යි. **ජාතකට්ඨ කතාවේ අසීති නිපාතයට අයත් චුල්ල හංස ජාතකයේ** වර්තමාන කොටසෙහි

**'දේවදත්තේන හි තථාගතං විරිතා වෝරෝපේතුං**

**පයෝජිතේසු ධනුග්ගහේසු සබ්බ පඨමං පේසිතේන.....' (පියතිස්ස හිමි 1926 පිටුව 115)**

ගුරුළුගෝමී අමාවතුර කෘතියේ දී නාලාගිරි දමනය පිළියෙල කළේ පරිවර්තන ස්වරූපයට ළං වෙමින් පාලි රීතිය ඔස්සේ ය. එහෙත් විදුසක්විති වර්ණනීය අවස්ථා තෝරා ගෙන සැදැහැති පොදු ජනයාගේ නෙතට කඳුළු නගන තරම් අවිචාර උත්තාපයකින් කථාව ගොඩ නගා තිබෙන්නේ අනුවාදකයෙකුගේ ස්වරූපයෙනි. එහි දී දේවදත්ත තෙරුන්ගේ උපායශීලිත්වය ඉදිරිපත් කරන්නේ චරිතයට පණ පොවමින් ය.

**'මහරජ තෙපි තොප සිත ඇත්ත සාධා තොප පිනැති හෙයින් පියාණන් මරා මහරජ වුවැ. අප පින් මඳ හෙයින් බුදුන් මරා බුදු විය නො හෙන්නෙමි'**දෙව්දත් තෙරන්ගේ උපක්‍රමයට හසුවන අජාසත් රජු දෙව්දත්ගේ අනුදැනුමෙන් බුදුන් මැරීමට උපක්‍රම කිහිපයක් යොදනු ලැබුවත් එය අසාර්ථක වූ අයුරු

**'නුඹ මා හිසට පෙරළු ගල් පොළොවින් දෙගලක් නැගී පිළිගත. අප යැවූ දුනුවායෝ හයා ගත් හී දඬු හැර පියා නො හී සිතියම ඇන්දා සේ....'**

යනුවෙන් චරිත හැඩ ගස්වමින් චරිතයන්ගේ මුවඟට අදහස් නංවමින් සජීවී චරිත නිර්මාණයක යෙදුනේ බුදුන් කෙරෙහි ශ්‍රාවක පිරිස තුළ භක්ති පූර්වක හැඟීම් ජනිත කරමින් ය.

විද්‍යාචක්‍රවර්තීන් සතු උචිතානුචිත විවේක බුද්ධියත්, කවි ප්‍රයෝග වහල් කොට ගෙන අලංකරණය කළ වෙස්සන්තර කථාව අනුපමේය කවි ශක්තිය විද්‍යමාන කරන්නකි. මාර්ටින් වික්‍රමසිංහ පවසන ආකාරයට **''අනුචිත වර්ණනයෙන් අඩු මුඛ්‍ය රසභාව දෙකට තුඩු දෙන උචිත රමණීය වර්ණනයෙන් යුතු ඒ අගනා කථාව ශත වර්ෂ ගණනක් සිංහල ජනයාගේ ඇසට කඳුළු නගමින් සිංහල ස්ත්‍රීන්ගේ චරිතය හැඩ ගැස්වීමෙහි උපකාරී වූවකි.''** වික්‍රමසිංහ (2008), 111 පිටුව)

පන්සිය පනස් ජාතක පොත කුරුණෑගල අවධියේ දී සිංහලයට අනුවාද වීමට පෙර පාලි ජාතකට්ඨ කථාව මූලාශ්‍රයෙන් ගොඩ නගන ලද වෙස්සන්තර කථාව බුත්සරණේ දී සිංහලට අනුවාද කළේ ශ්‍රෝතෘ ජනතාවගේ හදවතට ආමන්ත්‍රණය කරනු ලබන විශිෂ්ට කථාවක් ලෙසිනි. වෙස්සන්තර රජු තපසට යන අවස්ථාවේ දී මන්ද්‍රී දේවිය පතිභක්තිනියක ලෙසින් ඇය ක්‍රියා කළේ

**''නුඹ වලට යාදී අප මෙනුවර හිඳිනන් කෙරේදැයි මාගේ දෙදරුවන් වඩා ගෙනෑ නුඹට පළමු කොට මා යන බව නො දත්තා දෑ ද ස්වාමිනි''** (සෝරත හිමි 1960 320 පිටුව)

යනුවෙන් ඇගේ හදපත්ලෙන් නැගෙන ස්වාමි භක්තිය විද්‍යමාන කළේ මන්ද්‍රී දේවියගේ මුවඟට නැංවූ වදන්වලිනි. වෙස්සන්තර වස්තුවේ සිදුවීම් අතර රජු පුතක බමුණාට දරුවන් දන් දෙන අවස්ථාව, ජාලිය සිය නැගණිය බමුණාට නො දෙන ලෙස පිය රජුගෙන් ඉල්ලා සිටින මොහොත, මන්ද්‍රී දේවිය සිය දරුවන් නො දැක හඬා වැළපෙන අයුරු, ඉදිරිපත් කරන්නේ කරුණා රසයෙන් පාඨක, ශ්‍රාවක හදවත් කුල්මත් කරමිනි.

**''පන්සලට කැඳවා ගෙන අවුත් කෙණ්ඩිකායෙන් බමුණු අතැ පැන් එවැසිත්කලු වූ මේ දරුවන් දන් දුන් පිණින්ලොවුතුරා සම්බෝධියට පැමිණෙම්ව යි කියා දරුවන් අත් බමුණා අත පිටැ තබා දන් දුන්හ.''**(එම 323 පිටුව)

නිතැතින් ගැබ් වූ ශාන්ත හා කරුණා රසයෙන් ගැබ් වූ වෙස්සන්තර වස්තුවෙහි දෙතුන් තැනෙක හැර අනික් සෑම තැන්හි ම උචිත වර්ණනාවෙන් ඒ රසයන් තීව්‍ර කරයි. මේ ආදී වශයෙන් බුත්සර ණසියලු කථා වස්තු ගොඩ නගා තිබෙන්නේ අලංකාරයට අභිමත පරිද්දෙන්. පෘථුල ශෝතෘ පිරිසකගේ සාධුත්වය හා භක්ති පූර්වක හැඟීම් ජනනය වන පරිද්දෙනි.

දඹදෙණි යුගයේ හෙළ ගද්‍ය සාහිත්‍යයට එක් වූ ධර්මසේන හිමිහුගේ සද්ධර්මරත්නාවලිය පාලි

ධම්මපදට්ඨ කථාවට සපයන ලද අනුවාදයකි. (Adaptation) කතුවරයාගේ පරමාර්ථය වූයේ

**''පාලි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි ක්‍රම විලංගනාද වූ අඩු වැඩි ඇතත් ඒ නො සලකා පැන් හා කිරි මුසු වුවත් කිරි පමණක් හැර ගන්න හංසයන් මෙන් ද''** (ඉන්ද්‍රජෝති හිමි 1914 02 පිටුව)

ගුරුළුගෝමී අමාවතුර රචනයේ දී පාලි පොත්වල කථා පරිවර්තනයකට බඳුන් කළ අතර විද්‍යාචක්‍රවර්ති තමන්ට අභිමත අවස්ථා පමණක් මූලාශ්‍රයෙන් ගෙන කථා ගොඩ නැගුවේ නිර්මාණ කෞශල්‍යය (Clevernese) ද ප්‍රතිබිම්භනය (Reflection) කරමින් ය. එහෙත් ධර්මසේන හිමියෝ පාලි ක්‍රමය ඉවත් කොට ධම්මපදට්ඨ කථාවේ උපුටා ගත් වස්තු බීජ කොට ගනිමින් තමන් අත්දුටු ජීවන ප්‍රවෘත්තීන් බහා විචිත්‍ර කළේ සංස්කෘත අලංකාර සංකල්පය ඔස්සේ කව්ලැකියට වඩා ලෙව් ලැකියට යොමු වෙමින් ගැමි ජීවිතයෙන් උකහා ගත් තොරතුරු ඇසුරිනි. පාලි ධම්මපදට්ඨ කතාවේ මට්ටකුණ්ඩලී වස්තුවෙහි ආරම්භයෙහි

**'සාවත්ථියං කිර අදින්නපුබ්බකො නාම බ්‍රාහ්මණො අහෝසි තෙන කස්සචි කිඤ්චි න දින්නපුබ්බං, තෙන තං අදින්නපුබ්බතෝථෙව සංජානිංසු තස්සේක පුත්තකො අහෝසි පියො මනා පො,** (රතනසාර හිමි (1919) 13 පිටුව)

උක්ත පාලි පාඨය සිංහල බසට පෙරළීමේ දී

'සැවැත් නුවර වනාහි අදින්න පුබ්බක නම් බමුණෙක් විය. ඔහු කිසිවෙකුට කිසිවක් දුන්නේ නැත. එම නිසා ඔහු අදින්න පුබ්බක නමින් හැඳින්වී ය. ඔහුට ප්‍රිය වූ එක ම පුතෙක් විය.'

ධර්මසේන හිමියෝ සද්ධර්මරත්නාවලියේ දී ධම්මපදට්ඨ කථාවේ මට්ටකුණ්ඩලී වස්තුව අනුවාදයට ලක් කිරීමේදී වස්තු බීජය පමණක් තෝරා ගෙන එයට සමකාලීන සමාජ සිරිත් විරිත් ඇතුළත් කිරීම

''උන්ට බතුත් දිය යුතුය. එසේ කලට නැකැත් වී සාල් වියදම් වෙයි.''

- ✓ 'සුවඳෙහි හුන් මැස්සන් කිසි කලෙක අමධ්‍යයෙහි හිඳිනා සේ' සත්ව ලෝකයෙන් ගන්නා ලද උපමා භාවිතය
- ✓ සමකාලීන සමාජ ජීවිතයෙන් ගන්නා ලද උපමා භාවිතය

  **'ආඳා යවා වල්පත ගත්තා සේ'**
  **'පය බරවායට පිටි කර බෙහෙත් බඳිනා සේ'**
- ✓ විවිධ වෘත්තීන් සම්බන්ධ උපමා භාවිතය

  'පැලය නැගී මුකුරණ කලට බිජුවට ඇට දිරා නැති වන්නා සේ'
- ✓ සමකාලීන සමාජයේ පවත්නා සාරධර්ම ඇසුරින් නිපදවාගත් උපමා

  **'කිරි බොන දරුවන් මෑණියන් අඩු කලට කිරට ලෙන්නා සේ'**
- ✓ ඒ හැරුණුකොට විවිධ උපමා ප්‍රස්ථාපිරුළු භාවිතයට සද්ධර්මරත්නාවලි කතුවරයා යොමු වෙමින් නවතම කතා වස්තු ගොඩනැගුවේ පාඨක ශ්‍රාවක අවධානය යොමු කරමින්ය.

  **නුග ගස මහත් වුවත් නුග ඵලය කුඩා වන්නා සේ**

  **පුස්කා ගිය පැණි කැවුම් සේ**
- ✓ 'බෙහෙත් සාදා විඳ විඳ සිටිය වුන්ට බුලත් දෙවා සාදය නිම වන්නා සේ'
- ✓ ඔබ වැලිත් ගොයම් කල මනාවක තබා කල් පසු කොට කරන ගෙබිමක් සේ......

  (ථුල්ලතිස්ස තෙරුන්ගේ කථාවේදී)

යනාදී වශයෙන් ධර්මසේන හිමියෝ ග්‍රාමීය ජනජීවිතයේ පතුලටම කිඳා බසිමින් ජීවන අත්දැකීම් ප්‍රකට කළේ හුදී ජනතාවගේ සිත් සතන් තුළ ප්‍රසන්න හැඟීම් ජනනය කොට සමාජ සාධුත්වය වර්ධනය කිරීම පිණිස ය. මාර්ටින් වික්‍රමසිංහයන්

**'රජගෙයි වුවද ගැමියාගේ පැලෙහි වුවද දක්නට ලැබෙන ප්‍රකෘති ජීවිතය එකය. එහෙයින් රජ මැදුරෙහි පමණක් නො ව පැල්පතෙහි ද ඔවුහු සුන්දරත්වයත්, විචිත්‍රත්වයත් දුටුහ.'** (වික්‍රමසිංහ, (2008) 128 පිටුව)

උක්ත කරුණු දැක්වූ ගද්‍ය කාව්‍යත්‍රය පමණක් නො ව පූජාවලිය, ථූපවංශය, නිකාය සංග්‍රහය, සද්ධර්මාලංකාරය ආදී කෘතීන් හා සම්භාව්‍ය පද්‍ය කාව්‍යාවලිය විමසන විට වෑත්තෑවේ හිමිහුගේ ගුත්තිල කාව්‍යය,

දියෙහි යන දණ්ඩ ට
පිහිටක් වෙතොත් පෙර සි ට
දුදනන් හට පිහි ට
නොවච් යන බස සැබෑ කෙළෙ ම ට

කොපමණ ගුණ කළ ත්
දුදනෝ නො වෙති යහප ත්
කිරි දියෙන් දෙවිය ත්
අඟුරු සුදු වන කලෙක් නම් නැ ත්

කවර නම් සාහිත්‍ය රචකයෙකුගේ පරමාර්ථය විය යුත්තේ සමාජයේ සෑම පැති කඩක් දෙස ම සානුකම්පිත දෘෂ්ටියකින් බැලීමයි. වී මැක්නස් විචාරකයාගේ ප්‍රකාශය වූයේ “Poetry is a prescision iitrument for recording a man's reactions of life” කවිය වූ කලි ජීවිතය පිළිබඳ මිනිසාගේ ප්‍රතික්‍රියා සටහන් කරවන සූක්ෂම උපකරණයක් බව යි.

තොටගමුවේ රාහුල ස්වාමීන්ද්‍රයන්ගේ කාව්‍ය ශේඛරය, වීදාගම මෙත් මා හිමියන්ගේ ලෝවැඩ සඟරාව, සීතාවක යුගයේ කාව්‍ය ක්ෂේත්‍රයෙහි නියමුවා වූ අලගියවන්න යන්ගේ සුභාෂිතය, රණස්ගල්ලේ හිමියන්ගේ ලෝකෝපකාරය ආදී ගද්‍ය, පද්‍ය, කෘති පමණක් නො ව බොහෝ නාට්‍ය කෘති, වෙස්සන්තර, සිංහබාහු, මනමේ, පේමතෝ - ජායතී සෝකෝ, ලෝමහංස රසවත් නිර්මාණයෝ ය. බෞද්ධ සංස්කෘතියේ පීවය ලබමින් චිකාලෝක වූ සමස්ත හෙළ සාහිත්‍ය ම වැකියක් පාසා රසඥතාව, ජීවිතාවබෝධය, සමාජ පරිඥාණය පුලුල් කරන අතර සමස්ත සමාජ සාධුත්වය නිර්මාණ රචකයන්ගේ අපේක්ෂාව බව ගැඹුරින් විමසන කල පෙනී යන්නකි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

1. ආනන්ද මෛත්‍රිය හිමි, බලන්ගොඩ (1962), දීඝනිකාය, ප්‍රථම භාගය, ලංකාණ්ඩුව මගින් ප්‍රකාශනය
2. ඉන්ද්‍රජෝති හිමි (සංස්) (1914) සද්ධර්මරත්නාවලිය, කොළඹ, ග්‍රන්ථ ප්‍රකාශක යන්ත්‍රාලය
3. කරුණාතිලක මාහාචර්ය ඩබ්.එස්. (සංස්) (1995) පන්සිය පනස් ජාතක පොත, දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
4. ජයතිලක ඩී.බී. (සංස්) (1979) සද්ධර්මරත්නාවලිය, කොළඹ, ඇම්.ඩී. ගුණසිංහ සහ සමාගම
5. ඤාණලෝක හිමි කෝදාගොඩ (2004) අමාවතුර, දෙහිවල නැදිමාල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
6. පඤ්ඤසාර හිමි ධම්මකිත්තිස්සර (1917), මජ්ඣිමන්කායට්ඨ කථා, සිරිනාථ කුමාරදාස මුනසිංහ, ත්‍රිපිටක මුද්‍රණාලය.
7. බටුවන්තුඩාවේ සහ සුමංගල හිමි හික්කඩුවේ (සංස්) (1960), කාව්‍යශේඛරය, කොළඹ රත්නපොත් ප්‍රකාශකයෝ
8. රතනසාර හිමි කහවේ (1919) ධම්ම පදට්ඨ කථාව, සිරිනාථ කුමාරදාස, ත්‍රිපිටක මුද්‍රණාලය
9. ලංකානන්ද හිමි , ලබුගම, (1972), මජ්ජිම නිකාය, දෙවන කොටස, ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.
10 ලියනාරච්චි ආර්.ඒ. 2007 කාව්‍යශේඛර මහා කාව්‍ය මරදාන, සමයවර්ධන පොත්හල වික්‍රමසිංහ මාර්ටින් (2008) සිංහල සාහිත්‍යයේ නැගීම, නුගේගොඩ, ගංගොඩවිල, අජිත් ප්‍රින්ටර්ස්
11 වික්‍රමසිංහ මාර්ටින් (2010) සම්ප්‍රදාය හා විචාරය, රාජගිරිය, සරස, සීමාසහිත පෞද්ගලික සමාගම
12 වික්‍රමසිංහ මාර්ටින් (2003)විචාර ලිපි, නුගේගොඩ, ගංගොඩවිල අජිත් ප්‍රින්ටර්ස්
13 විමලකිත්ති හිමි හල්දොල (1978) අලගියවන්න මුකවැටිතුමාගේ සුභාෂිතය, සරසවි වාණිජ විද්‍යාලයීය ප්‍රකාශනයකි'
14. සන්නස්ගල පුංචි බණ්ඩාර, (1964) සිංහල සාහිත්‍ය වංශය, කොළඹ, ලේක්හවුස් මුද්‍රණාලය
15. සන්නස්ගල පුංචි බණ්ඩාර (1964) සිංහල සාහිත්‍ය වංශය, කොළඹ, ලේක්හවුස් මුද්‍රණාලය
16. සීලානන්ද හිමි අරුක්ගොඩ 2002 (පාලි ජාතකට්ඨ කථාව) කොළඹ, සමය වර්ධන මුද්‍රණාලය
17. සෝරත නායක හිමි වැලිවිටියේ, (1966), බුත්සරණ, ගල්කිස්ස, අභය ප්‍රකාශකයෝ
18. හේමකුමාර ටී.එස්. (වසර නැත) රනස්ගල්ලේ මහ තෙරුණ් කල ලෝකෝපකාරය, මංගල ස්ටෝස් මරදාන
19. Adikaram A.W. (1946) Early Hisotry of Buddhism in Ceylon, Colombo
20. Godakumbura C.E. (1955) Sinhala Literuture, Colombo, Apothecaries com. Ltd.

# අපේ ගමේ ඒ කාලේ කඨින පින්කම

මට මතකයි, මං පොඩි කාලේ අපේ ආච්චිත් සමඟ මාගාල්ලේ සුධර්මාරාම විහාරය - අපේ ගමේ පන්සලට ඇසළ පෝයට පසුදා ගිහින් වස් ආරාධනය කළ අයුරු. ආච්චි (සුදු රෙදි යාර දෙකක්) වැහි සළුව හා බුලත් අතක් අරගෙනයි ගියේ. පෝයට පසුවදා නිසා පෝයදා මෙන් ලොකු සෙනඟක් හිටියේ නැහැ. තවත් ගමේ දායක දායිකා පිරිසක් සහභාගි වුණා. ඔවුන් අතේ ද වැසි සළු, බුලත් අත් තිබුණා. අද කාලේ කරන විදියට ප්‍රධාන කඨින දායකයෙක් නම් සිටියේ නැහැ. හිටපු කිහිප දෙනාම එහි වැඩ සිටි භික්ෂූන් වහන්සේලා කිහිප දෙනාට වැසි සළු පිළිග න්වා, "අප කෙරෙහි අනුකම්පාවෙන් මෙම වස් තුන් මාසය මේ පන්සලේ ගත කරන ලෙස ගෞරවයෙන් ආරාධනා කරමු. මෙම වස් කාලය තුළ සිවුපසය පුදා රැකබලා ගැනීමට පොරොන්දු වෙමු" කියා සාමූහිකව ආරාධනය කළ අතර, භික්ෂූන් වහන්සේ ද ගිහි පිරිස කෙරෙහි කරුණාවෙන් ආරාධනය ඉවසා වදාළ සේක. ඉන්පසු දායක පිරිස එකතු වී, සාකච්ඡා කර සිව්පසය අඩුපාඩුවක් නොකර වස් තුන් මාසයම භික්ෂු උපස්ථානය කරන ලදි. ඒ කාලය තුළ පන්සලේ ද සතිපතා - බුද්ධ පූජා - ධර්ම දේශනා පැවැතුන අතර, ගිහි පිරිස සමඟියෙන් බෙදාහදාගෙන දායකත්වය දරන ලදි.

වස් තුන් මාස අවසානයේ කඨින පින්කමට සියල්ලන්ම එකතුව වැඩපිළිවෙළ සකස් කරන ලදි. පිරිසක් එකතුව ගම පුරා සෑම නිවසකටම ඇවිද කඨින පූජාව සඳහා පිරිකර හා සාංඝික දානය සඳහා බත්, ව්‍යංජන, අතුරුපස සෑම නිවසකටම බෙදා දුන්නේ අද මෙන් කේටරින්, බුෆේ වැඩසටහන් නොතිබූ නිසාත්, සැමට සහභාගි වීමට ඉඩ සැලසීමත් පිණිසය. ඉන්පසු කඨින චීවරය සඳහා සුළු මුදලක් (ශත 50 ක්, රුපියලක්) සෑම නිවසකින්ම ලබාගත්තේ කඨින චීවරයේ වියදම රුපියල් දහයකටත් (ඎග 10රූ) අඩු නිසා ගමේ හැම දෙනාටම දායකවීමට ඉඩ සලසමිනි. කඨින පින්කම දා අරුණ වැටීමට පෙර අළුයම් කාලයේ කඨින චීවරය රැගත් පෙරහැර ගම පුරා සංචාරය කළේ සැම දෙනාටම අත ගසා පින් අනුමෝදන් කිරීමටය. කඨින චීවරය සැම දෙනාම හිසමත තබා ඇවිදීමේ සිරිත මා කුඩා කල දකින්නට නොතිබුණි. කඨින පෙරහැරේ හේවිසි කණ්ඩායම, කොඩි සහ බකට් රැගත් පිරිස චීවරයට ඉදිරියෙන් ගමන් කළ අතර, පිටුපසින් කොසු, ඉදල් හා පූජා භාණ්ඩ රැගත් කුඩා පිරිසක් ද විය. එය ඉතාම සරල, චාම් කඨින චීවරයට ප්‍රමුඛස්ථානය ලබාදුන් පෙරහැරක් විය. නැටුම් කණ්ඩායම්, සැරසිලි රථ, අලි ඇතුන් කඨින පෙරහැරේ දුටුවේ නැත. අද කඨින පෙරහැර කඨින චීවර පූජාව භාරගත් ප්‍රධාන දායකයාගේ ධනවත් බව ප්‍රදර්ශනය කරන සංදර්ශනයක් බවට පත්වී ඇත.

යන්තම් එළිය වැටීගෙන එද්දී පන්සල දොරකඩට ළඟාවන කඨින චීවර පෙරහැර ඇතුල් වෙන්නට අරුණ වැටෙන තුරු බලා සිටියි. හරියට අරුණ නැඟෙන වෙලාව ලෙස ගණන් ගන්නේ 'කොස් කොලේ නැට්ට පැහැදිලිව' පෙනෙන වෙලාවයි. ඒ වෙලාවට පන්සලට ඇතුල් වෙන පෙරහැර කඨින පින්කම සඳහා සූදානම්ව සිටින භික්ෂූන් වහන්සේ හා ගිහි පිරිස තැන්පත්ව සිටින ශාලාවට ඇතුල් වී සකසා ඇති මණ්ඩපය මත කඨින චීවරය තැන්පත් කරනු ලැබේ. ඉන්පසු භික්ෂූන් වහන්සේ, ගිහි පිරිස පන්සිල්හි පිහිටුවා, බුද්ධ පූජා පවත්වා, කඨින චීවර පූජාව ගිහි පිරිස ලවා නියමිත ගාථා සජ්ඣායනය කර ඉතාමත් ගාම්භීර අයුරින් සඟ සතුකර කඨින චීවරය හා සියලුම පූජා භාණ්ඩ පූජා කරවති. ඉන්පසු වැඩ සිටින භික්ෂූන් වහන්සේ වෙත දානය සාංඝික කර පිරිනමනු ලැබේ.

කඨින චීවරය සඳහා බොහෝ විට පූජා කරන්නේ සුදු රෙදි කච්චියකි. ඉන්පසු භික්ෂූන් වහන්සේ එම සුදු රෙද්ද විනයානුකූලව මගධ කෙතේ අනුරුවට කපා, මූට්ටු කර එදිනම පඬු පොවා අවසන් කරයි. එම සිවුර අයත් වන්නේ විනයානුකූලව වස් ආරක්ෂා කරගත් භික්ෂූන් වහන්සේ නමකටය. එය ලබන භික්ෂූන් වහන්සේ එම සිවුර පොරවා සවස් ජාමයේ රැස්වන පිරිසට කඨිනානිසංස දේශනාව පවත්වන සේක.

අද කාලයේ කඨින චීවරයම පොරවා ගෙන ධර්මය දේශනා කිරීම අනිවාර්ය නොවුණත්, දින කිහිපයක් පැවැත්වෙන පරිත්‍රාණ ධර්ම දේශනා ආදිය නිසා වෙහෙසට පත්වී සිටින භික්ෂූන් වහන්සේ හා ගිහි පිරිසගේ පහසුව පිණිස උදේ වරුවේම හීල් දානයෙන් පසු කඨිනානිසංස දේශනාව ද පවත්වා නිම කිරීම බොහෝ විට සිදුවේ.

ලෝකයත් සමඟ වෙනස් වී ඇති කඨින චීවර පූජාව විනයානුකූලව පැවැත්වීම ගැන භික්ෂූන් වහන්සේගේ උපදෙස් හා අනුශාසනා පිළිබඳව කතා කිරීමට ගිහියෙක් වශයෙන් මා හට අකැප නිසා එය භික්ෂූන් වහන්සේ අතින් ඉටුවෙනු ඇතැයි උපකල්පනය කරමි.

# ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලය

කොවිඩ් මාරයා හමුවේ ගිලන් වී ගම්පහ මහ රෝහලේ ප්‍රතිකාර ලබන සැම දෙනා වෙනුවෙන් වටිනා කිරිපිටි තොගයක් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ආගමික හා සංස්කෘතික මණ්ඩලයේ ගරු සභාපති ලක්ෂ්මන් කෝට්ටගේ මැතිතුමාගේ ධන පරිත්‍යාගයෙන් ගම්පහ මහ රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය ශිරෝමන් මැතිතුමා වෙත අගෝස්තු 13 වන දින පරිත්‍යාග කළ අවස්ථාව. ඒ පින් බෙලෙන් ලොව පුරා කොවිඩ් ආසාදනය වී හුස්ම යදින සියලු දෙනාම සුවපත් වේවා. දුකින් මිදෙත්වා.



---



ළමුන් පිරිසක් සහ පාලක මණ්ඩලය ඇතුළු සියලු දෙනාට අවශ්‍ය සහල්, වියළි ආහාර ද්‍රව්‍ය බෙහෙත් ද්‍රව්‍ය, බිස්කට්, ජෑම්, කිරිපිටි, බටර්, චීස්, පාන්, මාමයිට් වැනි වටිනා ආධාර තොගයක් ක්ෂණිකව ක්‍රියාත්මක වී ලබාදීමට සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ආගමික හා සංස්කෘතික මණ්ඩලය වෙනුවෙන් එම මණ්ඩලයේ ගරු සභාපතිතුමාගේ ආදරණීය දූ දරුවන්ගේ මැදිහත් වීමෙන් සිදු කෙරුණි. මෙවන් උතුම් පරිත්‍යාගවල පින් බෙලෙන් ලොවටම බලපා ඇති කොරෝනා උවදුර ඉක්මනින් දුරුවේවා යැයි ප්‍රාර්ථනා කරමු.

---

ජාතික රෝහලේ අධ්‍යක්‍ෂ වෛද්‍ය කුමාර වික්‍රමසිංහ මහතාගේ කාරුණික ඉල්ලීම අනුව වෛද්‍ය රාණී ප්‍රනාන්දුගේ මැදිහත් වීමෙන් රෝහලේ ස්වශන අපහසුතාවයෙන් පෙළෙන කොරෝනා රෝගීන්ට ස්වසන පහසුව පිණිස වැඩි පීඩනයකින් ඔක්සිජන් ලබාදීමට CPAP යන්ත්‍ර පහක් (රු. 875,000/= වටිනා) පරිත්‍යාග කරන ලදි. එක් යන්ත්‍රයක් සඳහා රු. 275,000/= බැගින් ලක්ෂ්මන් කෝට්ටගේ මහතා ද, නම සඳහන් කිරීමට අකැමති පින්වතියක් ද එක්සත් රාජධනියේ වෛද්‍යවරු තිදෙනෙක් ද මේ සඳහා දායකත්වය දරන ලදි.





## මාරාන්තික කොවිඩ්-19 වසංගතය වැළඳීමෙන් 2021 අගෝස්තු 28 වන දින අපෙන් සමුගත් නිශාන්ත කුමාර පීරිස් මහතා ගැන මතකය...

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ, ජාතික සමාජ සේවා මණ්ඩලයේ ගරු භාණ්ඩාගාරික ලෙස 2018 වසරේ සිට 2021 දක්වා විශිෂ්ට සේවයක් ඉටුකළහ.

ජාතික සමාජ සේවා මණ්ඩලයට ආධාර පිණිස මහජන බැංකු ශාඛා තුළ කැට ස්ථාපිත කිරීමේ දී මෙන් ම ලැබෙන ආධාර මුදල් එකතු කිරීමට එතුමාගේ වටිනා කාලය, ශ්‍රමය කැප කරමින් බෞද්ධ සම්මේලනයට එතුමාගෙන් ඉටු වූ මහඟු සේවය ඉතා අගනේ ය.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟින් පවත්වා ගෙන යන ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසවලට නිතර නිතර සම්බන්ධ වෙමින් ඒවායේ අඩුපාඩු, අවශ්‍යතා සහ ගිණුම් කටයුතු පිළිබඳ සොයා බලමින්, වැඩිහිටියන් සහ කාර්යමණ්ඩලය සමඟ පවත්වා ගෙන ගිය සුහදශීලිත්වය ඔහුගේ අප්‍රමාණ මනුෂ්‍යත්වයේ ගුණාංගයකි.

සම්මේලන කාර්යාලයේ මහජන බැංකුව සමඟ පැවති ගිණුම් කටයුතුවල දී ද අවශ්‍යතාවය කියන පමාවෙන් ඒ සියලු අවශ්‍යතාවයන් හැකිතාක් යුහුසුලුව ඉටුකර දීමට ඔහු සැදී පැහැදී සිටී.

නිශාන්ත කුමාර පීරිස් මහතා මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරයෙකි. මහජන බැංකු බෞද්ධ සංගමයේ ප්‍රධාන ලේකම්, ශ්‍රී මහා බෝධි අරමුදලේ මහජන බැංකුවේ භාණ්ඩාගාරික, මහජන බැංකුවේ සේවක සමුපකාර සමිතියේ ලේකම් සහ ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ උප සභාපති වශයෙන් රටට, ජාතියට, බෞද්ධ ජනතාවට ඉමහත් සේවයක් ඉටු කළ සොඳුරු මිනිසෙකි. එතුමා ගැන සමාජ මාධ්‍ය තුළ පළ වූ හැම ලිපියක ම සටහන්ව තිබුණේ ඔහුගේ අප්‍රමාණ මනුෂ්‍යත්වයේ සුවඳයි.

එතුමා සම්මේලනයට පමණක් නොව, සමස්ත ජනතාවටම කළ අපරිමිත සේවය කොවිඩ්-19 මාරයා හමුවේ පරාජය වී ඇත. තව ටිකක් සිය සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ සැලකිල්ලෙන් කටයුතු කළා නම් ඔහුට තව කලක් ජීවත් වීමට හැකියාව තිබුණේ යැයි සිතුණත් දැන් ඉන් ඵලක් නොවේ. ඔහු තම ජීවිතය හැරගියේ මෙම රෝගයේ භයානකකම පිළිබඳව තවදුරටත් අපට සිතන්න ඉඩ සලස්වමිනි.

2021 සැප්තැම්බර් 09 දින පැවති සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේ දී, නිශාන්ත පීරිස් මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාවක් සම්මත කරන ලද අතර, එය එතුමාගේ පවුලේ සාමාජිකයින්ට දන්වා යැවීමට ද තීරණය කරන ලදි. නිශාන්ත කුමාර පීරිස් මහතාණෙනි, යළිත් කවදා කොහේ හරි මුණගැසෙන තුරු ඔබට සුබ ගමන්! අජරාමර නිවන් සුව පතමු.

### පුණ්‍යානුමෝදනාත්මක ස්තූතිය

- බෞද්ධාලෝක සඟරාව ධර්මදානයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට, ලාභාපේක්ෂාවෙන් තොරව අවස්ථාව සලසා දුන් රජයේ මුද්‍රණාලයාධිපතිනි ගංගානි ලියනගේ මහත්මියට හා එයට සහයෝගය දැක්වූ මුද්‍රණාලයීය කාර්යමණ්ඩලයට, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගෞරවය හා පුණ්‍යානුමෝදනාත්මක ස්තූතිය පුද කරමු.

## ‘බෞද්ධාලෝකය’ සඟරාව ධර්මදානයක් ලෙස නව මුහුණුවරකින්




සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ නිල ප්‍රකාශනය වන ‘බෞද්ධාලෝකය’ සඟරාව ධර්මදානයක් ලෙස නව මුහුණුවරකින් මෙවර ඇසළ පෝදා නිකුත් විය. ඇසළ පෝදා සම්මේලන මූලස්ථානයේ පැවති සීල භාවනා වැඩසටහනේ දී සඟරාවේ ප්‍රධාන සංස්කාරක වෛද්‍ය රාණි ප්‍රනාන්දු විසින් සම්මේලනයේ අවුරුදු 22 ක් විධායක මණ්ඩල සාමාජිකත්වයක් හිමි ජ්‍යෙෂ්ඨතම සාමාජිකාවක් වන දහම් පාසල් ආචාර්ණී චන්ද්‍රලතා හෙට්ටිගේ මෙණෙවියට එම සඟරාව පිරිනමන ලදි.

### සබ්බ දානං - ධම්ම දානං ජිනාති
### සියලු දානයන්ගෙන් ධම්ම දානය උතුම් වේ

බෞද්ධාලෝකය - බෞද්ධ සඟරාව
ධර්ම දානයක් සේ පූජා කරන්න

බෞද්ධාලෝකය සඟරාව ධර්මදානයක් ලෙස විශේෂ මිලකට ලබාගත හැක

**සඟරා 50 ක් සඳහා රු.5000/=**
**සඟරා 100ක් සඳහා රු.8000/=**




ඔබගේ පවුලේ සාමාජිකයෙකුගේ

- උපන් දිනය නිමිත්තෙන්
- විවාහ සංවත්සරය සැමරීමට
- මියගිය ඥාතියෙකුට නිවන් සැප පතා




මාසයකට පෙර මුදල් ගෙවීමෙන් පිං පැමිණවීම සඟරාවේ පින්තූරයද සමග පලකරවා ගත හැක.

විමසීම් - 071 4812656 / 072 9297000

# අයදුම්පත් භාරගැනීමේ කාල සීමාව දීර්ඝ කිරීම

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ශත සංවත්සරයට සමගාමීව උත්සවාකාරයෙන් පැවැත්වීමට සංවිධානය කරන ලද ගෞරව ප්‍රණාම ප්‍රදානය කිරීමේ මහෝත්සවය පවතින කොරෝනා 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් මේ දක්වා පැවැත්වීමට නොහැකිවූ අතර තමන්ටද ඊට සහභාගිවීමට අවස්ථාවක් සඳහා දෙන ලෙස දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි කටයුතු කරනු ලබන බෞද්ධ ක්‍රියාකාරීන් විසින් කරන ලද ඉල්ලීම් පිළිබඳ අවධානය යොමුකර මෙම ප්‍රණාම උළෙල සඳහා අයදුම්පත් භාරගැනීමේ කාල සීමාව දීර්ඝ කිරීමට තීරණය කර ඇත.

ඒ අනුව සුදුසුකම් සපුරාලීම (කාල සීමාව) සඳහා විස්තර පත්‍රිකාවට අනුව අයදුම්පතේ තොරතුරු සම්පූර්ණ කළයුතු අවසාන දිනය 2021 මැයි මස 26 වන වෙසක් පොහෝ දිනය වශයෙන් සලකා කාණ්ඩ 05 යටතේ අයදුම්පත් භාරගැනීමේ කටයුතු සිදු කරන අතර බෞද්ධාලෝක සඟරාවේ පළවන දැන්වීමට අනුව වැඩිදුර විස්තර හා අයදුම්පත් ලබා ගැනීමට හැකියාව ඇත.

## ගෞරව ප්‍රණාම ප්‍රදානය කිරීමේ මහෝත්සවය

### සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
### ශත සංවත්සරය 1919 – 2019

අධිරාජ්‍යවාදීන්ගේ පාලනයෙන් හෙම්බත්වී සිටි අප දේශය ඉන් මුදවා ගැනීමේ නිදහස් අරගලයේ අරුණළු ලක්දිව දසත පැතිරෙමින් තිබූ සමයේ එයට පන්නරයක් දෙමින් 1919 වර්ෂයේ හෙළ බොදු නායකයන්ගේ මූලිකත්වයෙන් ස්ථාපිතවී දිවයිනේ ප්‍රමුඛතම බෞද්ධ සංවිධානය වශයෙන් සියවසක කාලයක් පුරාවට සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය පැමිණි ගමන් මග ආවර්ජනය කරමින් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා සමාජයේ යහ පැවැත්ම උදෙසා සේවයක් සිදුකළ පුද්ගලයන් සහ ආයතන අගැයීමට ලක්කරමින් දීප ව්‍යාප්තව පහත සඳහන් අංශයන් යටතේ සිදුකරන ගෞරව ප්‍රණාම පිරිනැමීම සඳහා නාම යෝජනා කැඳවීම.

1. **බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ශසනික සේවයේ නියැලෙන පුද්ගලයන් ඇගයීම.**
2. **ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් බෞද්ධ සංවිධාන ඇගයීම.**
3. **ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් ස්වේච්ඡා සංවිධාන ඇගයීම.**
4. **දිස්ත්‍රික් මට්ටමින් දීර්ඝ දහම් ගුරු සේවය ඇගයීම.**
5. **ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් බොදු පුවත් ප්‍රචාරණය සඳහා සිදුකරන ලද මාධ්‍යකරණය (මාධ්‍යවේදීන්) ඇගයීම.**

අයදුම්පත් සම්පූර්ණ කිරීමට අදාල සුදුසුකම් (කාල සීමාව) සපුරාලිය යුතු අවසාන දිනය 2021 මැයි මස 26 වන වෙසක් පොහෝ දින ලෙස සලකා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් නිකුත් කරනු ලබන අයදුම්පත්‍ර තමා / තම සංවිධානය හෝ බාහිර පාර්ශවයක් මගින් හෝ පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතුව ඇත.

සභාපති, බෞද්ධාලෝක ශත සංවත්සර ප්‍රණාම කමිටුව, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, අංක 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

අයදුම්පත්‍ර ලබාගත හැකි ආකාරය
මූලස්ථාන කාර්යාලයෙන්,
විද්‍යුත් තැපැල මගින් - samithiacbc@gmail.com
මුහුණු පොතට පිවිසීම මගින් - https://www.facebook.com/pg/ACBC-BIC
වැඩි විස්තර - 0112 691 695 / සිරිනි 076 561 1374
ක්‍රිෂාන්ති 071 864 5554

# පින සහ කුසලය එකක්ද? දෙකක්ද?

- පින යනු කය හා වචනින් කරන කියන යහපත් ක්‍රියා පින්
- පව් යනු කය හා වචනින් කරන නරක අයහපත් ක්‍රියා

01). කුසල් යනු සිතින් සිතන සිතේ ඇතිවන දයාව, මෛත්‍රිය, කරුණාව වැනි යහපත් සිතිවිලි

02). අකුසල් යනු සිතින් සිතන සිතේ ඇතිවන තණ්හා ඊර්ෂ්‍යා ක්‍රෝධ වෛර වැනි නරක සිතිවිලි, බුදුරජාණන් වහන්සේ පින් හතක් සහ පව් හතක් ගැන දේශනා කර ඇත.

03). එනම්, වචනින් පවසන සම්මා වාචා පින් හතර, බොරු නොකීම, කේළාම් නොකීම, පරුෂ වචන නොකීම, හිස් වචන නොකීමයි.

- කයෙන් කරන පින් තුන නම් සතුන් නොමැරීම, සොරකම් නොකිරීම, කාමයෙහි වරදවා නොහැසිරීමයි.
- ආර්ය අෂ්ටාංගික මාර්ගයේ තුන්වන ප්‍රතිපදාව සම්මා වාචා, පින් හතර සහ හතරවන ප්‍රතිපදාව සම්මා කම්මන්ත කයෙන් කරන පින් තුනක් සමඟ පින් හතකි.

04). වචනයෙන් පවසන පව් හතර එනම්, මිථ්‍යා වාචා බොරු කීම, කේළම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීමයි. කයෙන් කරන පව් තුන සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීමයි. වචනින් පව් හතරත්, කයෙන් පව් තුනත් සමඟ පව් හතකි.

- කයට හා වචනයට කරුණාව, මෛත්‍රිය, දයාව, පරාර්ථකාමී වැනි සිතිවිලි ඇතිකර ගැනීමට නොහැකි බැවින් කයට හා වචනයට කුසල් කිරීමට නොහැකිය.
- කයට හා වචනයට තණ්හා, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, වෛර, ආත්මාර්ථකාමී වැනි සිතිවිලි ඇතිකර ගැනීමට නොහැකි බැවින් කයට හා වචනයට අකුසල් කිරීමට නොහැකිය.
- සිතින් සතෙකුට කන්න දෙන්න හෝ කෙනෙකුට යහපත් වචනයකින් උපදෙසක් වැනි යහපත් දෙයක් කරන්න බැරි බැවින් සිතට පින් කිරීමට නොහැකිය.
- සිතින් කෙනෙකුට ගහන්න බැරි බැවින් සිතින් පව් කිරීමට නොහැකිය.
- සිතට තනියෙන් කුසල් අකුසල් කිරීමට හැකියාව ඇතත් කයට හා වචනයට සිතේ ආධාර නැතුව පින් පව් කිරීමට නොහැකිය.
- කෙනෙකුට යමක් දෙන්න හෝ බණින්න හෝ පළමුව සිතින් සිතිය යුතුය.
- සිතින් සිතන විට චේතනාවක් ඇති වේ.
- එම චේතනාව ක්‍රියාත්මක කළ යුත්තේ කය හෝ වචනයෙනි යමක් දීම, කයින් ක්‍රියාත්මක කරන විට පිනකුත්, බණින විට පවකුත් සිදුවේ.
- එසේම යමක් දීමට සිතින් සිතීම නිසා කුසලයකුත් ඇති වේ.
- බැණීමට සිතින් සිතීම නිසා අකුසලයකුත් ඇති වේ.

05). "එන්න බුදුරජාණන් වහන්සේ දේශනා කළ දහම පරීක්ෂාකර බලන්න. ඔබ යම් කෙනෙක් සමඟ බහින් බස් වන විට ඔබේ සිතේ ඇතිවන නරක සිතිවිලි නිසා ඔබගේ හද ගැස්ම වැඩි වේ. එවිට රුධිර සංසරණ වේගය වැඩිවීම හේතුකොට ගෙන පෙණහලු මඟින් රුධිරයට ලැබෙන ඔක්සිජන්, අවශ්‍ය ප්‍රමාණය උරා ගැනීමට ඉඩක් නොලැබෙන බැවින් රුධිරයේ ඔක්සිජන් ප්‍රමාණය අඩු වී කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය වැඩි වේ. වැඩි කාබන්ඩයොක්සයිඩ් රෝම කූප මඟින් පිට කිරීමේ දී කැසීම ඇති වේ. කැසීමේ දී ඇතිවන තුවාල මත කාබන්ඩයොක්සයිඩ් තැවරීමෙන් දද, කුෂ්ඨ මෙන්ම පිළිකා ඇති වීමට හේතු වේ. අධික වේගයකින්

රුධිරය ගලායාමේ දී රුධිර නාල පළල් වීමේ දී ඒ දෙපස ඇති සෙල තෙරපී හිස කැක්කුම, වෙව්ලීම, වේදනා ඇති වේ.

ආහාර දිරවීමට අවශ්‍ය යුෂ නිපදවීමට රුධිරය නොලැබීම හේතුකොට ආහාර අජීර්ණය, උදරාබාධ, මලබද්ධය වැනි රෝග ඇති වීමට ද හේතු වේ. තරහ යනු අකුසලයකි. එම අකුසලය එවලේම ඔබ අත් දකිනවා.

වෙනත් ආගම්වල අයත් මෙම විපාක අත් දැක්කත් ඔවුන්ගේ ආගම්වල විපාක අත් දකින්නේ මරණින් පසු දිව්‍ය ලෝකවලට, ස්වර්ගයට හෝ අපායට යාමෙන් පසුවයි. එය ලෝකවලට, ස්වර්ගයට හෝ අපායට යාමෙන් පසුවයි.

එයද විශ්වාසය හා භක්තිය නිසා වන අතර, කවදාවත් කිසිම කෙනෙක් එය අත් දැකපු බවක් දැනගන්නට නැත. බුදුරජාණන් වහන්සේ දෙසූ දහමේ කුසල් අකුසල්වල විපාක අත් දැකීමට, අත් විඳීමට මැරෙන තෙක් සිටිය යුතු නැත. තමුන් කළ කුසල් අකුසල්වල විපාක එකෙණෙහිම අත් දකිනු, අත් විඳිනු ඇත.

කරන කියන යහපත් ක්‍රියාවලින් ඇති වන පින්වලින් දිව්‍ය සැප සම්පත්, ස්වර්ග, සම්පත්, වාසනාව, සැප සතුට හා සසර දික්වීම ද වේ. පව්වලින් දුක, කනගාටුව, අවාසනාව, අපාගත වීම, දුක් ලැබීම.

සිතේ ඇතිවන කුසල්වලින් සිතේ සතුට, ලේ පිරිසිදු වීම, මුහුණ පැහැපත් වීම හා නිවන් මඟ පෑදීම ද අකුසල්වලින් සිතේ කනස්සල්ල දුක, කනගාටුව ඇතිවේ. නිවන් මඟ ආවරණය වේ. යහපත් දෙයක් කරන විට, උදව්වක් කරන විට, ගීතිකාවක් අහන විට - ගායනා කරන විට, ඔරුසන් කියන විට, යාඥා කරන විට, කන්නලව් කරන විට, බජන් ගී ගයන විට, පුද පූජා පවත්වන විට, තම ආගමේ හොඳ දේශනාවකට බණකට, පිරිතකට සවන් දෙන විට සිතේ ඇතිවන කුසල් සිත නිසා සතුට ඇති වෙනවා. සතුට ඇතිවීමෙන් ලේ පිරිසිදු වෙනවා. මුහුණ පැහැපත් වෙනවා. අතීතේ අයත් මෙවැනි යහපත් දේ කරන විට ඒවායින් සිතේ සතුට ඇති වන බව අත් දැක්ක, වර්තමානයේ අපිත් අත් දකිනවා - අත් විඳිනවා. අනාගතේ අයත් අත් දකිනවා. මේවා සිතේ ඇතිවන යහපත් සිතිවිලි වන කුසල් බව බොහෝ දෙනෙක් දන්නේ නැහැ.

06. ඔබ යම් කෙනෙකුට යහපතක්, උදව්වක් කළ විට ඔබගේ සිත සතුටු වෙනවා. එය වෛද්‍යවරුන් පවසන්නේ සිතේ සතුට ඇතිවීම නිසා ශරීරය තුළ එන්ඩොෆින් නමැති හෝමෝනය වැඩියෙන් ස්‍රාවය වන බවයි. එවිට එම හෝමෝනය මඟින් ශරීරයේ ප්‍රධාන අවයවවල සහ පද්ධතිවල නිසි ක්‍රියාකාරීත්වය ඇතිකර, මානසික ආතතිය සංසිඳුවන අතර, වේදනාව ද දුරු කර නීරෝගීභාවය ඇති කරනවා. සතුටක දී සිරුරට වන දේ වෛද්‍යවරු දැනගත්තත් සිතේ ඇති වූ කුසල් සිත් ඇති වීම නිසා එසේ ඇති වන බව බොහෝ වෛද්‍යවරු දන්නේ නැත.

**පින් පව් කුසල් අකුසල් ගැන දැන ගැනීමට පොත්**

- **පින් සහ පව් - කුසල් සහ අකුසල් රු. 120/-**
- **ලොව සැමට සිත නිවාගන්න දහම් දැනුම රු. 125/-**
- **හොඳ - නරක, පින් - පව්, කුසල් - අකුසල් රු. 100/-**
- **සිතුවිලි සහ සිතින් සිතීම රු. 150/-**
- **සිත සහ මනසින් කුසල් අකුසල් - කය හා මනසින් පින් පව් රු. 100/-**
- **සිතෙහි සතුට ඇති කර ගැනීමට කුසල් කරන්න. අකුසලෙන් මිදෙන්න රු. 125/-**
- **පින සහ කුසලය දෙකක්ද? එකක්ද? රු. 175/-**
- **චිත්ත නියාම ධර්මය රු. 125/-**
- **සිත මනස සහ ආගම් රු. 80/-**
- **සිත ගැන දැනගන්න රු. 125/-**
- **දූ දරුවන්ගේ සාරධර්ම අත්පොත රු. 100/-**

**සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම**
661, 665, 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.
දුරකථන: 011 2685369, 2686925 ෆැක්ස්: 2674187

# පූජාවලි 2021

## සමස්ත ලංකා බෞද්ධ චිත්‍ර හා ගීත රචනා තරඟාවලිය

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ, ජාතික අධ්‍යාපන මණ්ඩලය මගින්
සංවිධානය කරනු ලබන පහත සඳහන් චිත්‍ර සහ ගීත රචනා තරග සඳහා නිර්මාණ
**2021 ජුලි 20 සිට අගෝස්තු 31** වන දින දක්වා භාර ගැනේ.

### සමස්ත ලංකා බෞද්ධ චිත්‍ර තරගය

දිවයිනේ සියලුම පාසල් සහ විශ්වවිද්‍යාල සිසුන් ගේ බෞද්ධ චිත්‍ර නිර්මාණ මෙම අංශය යටතේ ඉදිරිපත් කළ හැකිවේ.

| | |
|---|---|
| පූර්ව ප්‍රාථමික අංශය | අවු. 05 - 08 |
| ප්‍රාථමික අංශය | අවු. 09 - අවු. 11 |
| කනිෂ්ඨ අංශය | අවු. 12 - අවු. 14 |
| ජ්‍යෙෂ්ඨ අංශය | අවු. 15 - අවු. 18 |

විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන අංශය අභ්‍යන්තර ශිෂ්‍ය ලියාපදිංචිය

### සමස්ත ලංකා පාරිවේණික හා විද්‍යායතන බෞද්ධ චිත්‍ර තරගය

දිවයිනේ සියලුම පාරිවේණික හා විද්‍යායතන සිසුන්ගේ චිත්‍ර නිර්මාණ මෙම අංශය යටතේ ඉදිරිපත් කළ හැකිවේ.

| | |
|---|---|
| පා/පූර්ව ප්‍රාථමික අංශය | - මූලික 1 විද්‍යායතන 6,7 |
| පා/ප්‍රාථමික අංශය | - 2, 3 ශ්‍රේණි. විද්‍යායතන 8,9 |
| පා/කනිෂ්ඨ අංශය | - 4, 5 ශ්‍රේණි. විද්‍යායතන 10,11 |
| පා/ජ්‍යෙෂ්ඨ අංශය | - ප්‍රාචීන/ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන 12, 13 ශ්‍රේණි |

### සමස්ත ලංකා ළමා සංවර්ධන බෞද්ධ චිත්‍ර තරගය

දිවයිනේ පවතින රජයේ සහ පෞද්ගලික ළමා සංවර්ධන මධ්‍යස්ථාන සහ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි සිසුන් සඳහා වෙන්වූ බෞද්ධ චිත්‍ර තරගයයි.

| | |
|---|---|
| (ළ/ස) පූර්ව ප්‍රාථමික අංශය | - අවු. 5, 8 |
| (ළ/ස) ප්‍රාථමික අංශය | - අවු. 9, 11 |
| (ළ/ස) කනිෂ්ඨ අංශය | - අවු. 12, 14 |
| (ළ/ස) ජ්‍යෙෂ්ඨ අංශය | - අවු. 15 සිට [illegible] |

### සමස්ත ලංකා පරිගණක බෞද්ධ චිත්‍ර තරගය විවෘත තරග අංශයකි

පරිගණක බෞද්ධ චිත්‍ර තරගය - වයස අවු. 18 අඩු සිසු දරු දැරියන්ගේ පරිගණක චිත්‍ර මේ සඳහා ඉදිරිපත් කළ හැකිවේ.

පරිගණක බෞද්ධ චිත්‍ර තරගය (විවෘත) - අවු. 19 ට වැඩි ඕනෑම පුරවැසියෙකුට මෙම තරග අංශයට නිර්මාණ ඉදිරිපත් කළ හැකිවේ

ඇදිරි නීතිය අවසන්ව මාසයක් දක්වා නිර්මාණ භාර ගනුලැබේ

### චිත්‍ර නිර්මාණය කළ යුතු තේමා

1. පූර්ව ප්‍රාථමික සහ ප්‍රාථමික [illegible] යටතේ සුදුසු මාතෘකාවක් [illegible]
2. කනිෂ්ඨ අංශය - [illegible]
3. ජ්‍යෙෂ්ඨ අංශය - [illegible]
4. විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන [illegible]

### චිත්‍ර ඇඳීමේ කඩදාසි ප්‍රමාණයන්

1. [illegible] සහ ජ්‍යෙෂ්ඨ තරග අංශ සඳහා - අඟල් 14 × 18 ප්‍රමාණය
2. විශ්වවිද්‍යාල සහ විවෘත අංශ - අඟල් 16 × 20 ප්‍රමාණය
3. පරිගණක චිත්‍ර අංශය - A3 ප්‍රමාණය

## සමස්ත ලංකා බෞද්ධ ගීත රචනා තරගාවලිය

### සමස්ත ලංකා බෞද්ධ ගීත රචනා තරගය

1. ශිෂ්‍ය අංශය - වයස අවු. 18 ට අඩු සියලුම දරු දැරියන්ට මෙම අංශය සඳහා බෞද්ධ ගීත රචනා ඉදිරිපත් කළ හැකිවේ.
2. විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන අංශය - විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විද්‍යාර්ථීන්ගේ ගීත රචනා මෙම අංශයට ඉදිරිපත් කළ හැකිවේ.
3. විවෘත අංශය - ඉහත අංශ 1,2 යටතේ ඇතුළත් නොවන ඕනෑම කෙනෙකුට පුද්ගලයෙකුට මෙම තරග අංශය සඳහා ගීත රචනා ඉදිරිපත් කළ හැකිවේ.

### සමස්ත ලංකා බෞද්ධ ළමා ගීත රචනා තරගය

1. ශිෂ්‍ය අංශය - වයස අවු. 18 ට අඩු සියලුම දරු දැරියන්ට මෙම අංශය සඳහා බෞද්ධ ගීත රචනා ඉදිරිපත් කළ හැකිවේ.
2. විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන අංශය - විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විද්‍යාර්ථීන්ගේ ගීත රචනා මෙම අංශය සඳහා ඉදිරිපත් කළ හැකිවේ.
3. විවෘත අංශය - ඉහත අංශ 1,2 යටතේ ඇතුළත් නොවන ඕනෑම පුද්ගලයෙකුට මෙම තරග අංශය සඳහා ගීත රචනා ඉදිරිපත් කළ හැකිවේ.

### බෞද්ධ ගීත සහ බෞද්ධ ළමා ගීත රචනා සඳහා තේමාවන් තෝරා ගැනීම

- තමන් කැමති බෞද්ධ තේමාවක් හෝ සංකල්පයක් යටතේ බෞද්ධ ගීත රචනාවක් නිර්මාණය කිරීම.

**සියලුම බෞද්ධ චිත්‍ර තරග සහ බෞද්ධ ගීත රචනා සඳහා අයදුම් පත්‍ර සහ විස්තර කොළඹ 07, අංක 380, බෞද්ධාලෝක මාවත, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ මූලස්ථාන කාර්යාලයෙන් හෝ අපගේ වෙබ් අඩවිය www.acbc.lk/docs වෙත යොමුවීමෙන් ලබා ගත හැක.**
**දුරකතනයෙන් විමසීම් - 0765 611 374 - 0772 342 577 - 0714 894 925**

* සියලුම තරග අංශයන්හි ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන සඳහා ත්‍යාග සහ සහතික පත්‍ර ද, විශිෂ්ඨ කුසලතා, කුසලතා සහිත නිර්මාණ වෙනුවෙන් සහතික පත්‍ර ද, සුදුසු කෘති සඳහා සහභාගිත්ව සහතික ද පිරිනමනු ලැබේ.

**ජාතික අධ්‍යාපන මණ්ඩලය, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
අංක. 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. - දු.ක. 0112 691 695/www.acbc.lk/docs